ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# 2024 වර්ෂයේ
# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්
# නිකුත් කරන ලද තෝරාගත් නිර්දේශ


කාර්යාලය /அலுவலகம்
අංක-14, ආර්.ඒ.ද මෙල් මාවත,
කොළඹ -04.
இல.14,ஆர்.ஏ.த மெல் மாவத்தை,
கொழும்பு - 04.
No - 14, R.A.De Mel Mawatha
Colombo – 04, Sri Lanka.

Tel : 011 2505580 / 81/ 82
Fax : 011 2505541
e-mail : sechrcsl@gmail.com
Web : www.hrcsl.lk

# 2024 වර්ෂයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තෝරාගත් නිර්දේශ

2024 දෙසැම්බර් 10

# හැඳින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ පිහිටුවා වසර 27ක් සම්පූර්ණ වේ. මේ කාලය තුළ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ නිර්දේශ විශාල ප්‍රමාණයක් ලබාදී ඇති අතර, එසේම ලබාදෙන ලද නිර්දේශ මේ වනවිට මානව හිමිකම් කොමිෂන් සභා වෙබ් අඩවිය මගින් ජනතාවට දැන ගැනීමට අවස්ථාව සලසා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබාදෙන නිර්දේශ ජනතාව තුළ සමාජ ගතවීම වීම තුලින් තමන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම හා ඒ පිළිබඳ ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ජනතාව දැනුම්වත් වනු ඇත. එමෙන්ම රාජ්‍ය නිලධාරීන් හා මානව හිමිකම් පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් මෙකී නිර්දේශ පරිශීලනය කිරීම තුලින් මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීමට රුකුලක් වනු ඇත.මානව හිමිකම් කොමිෂන් සභා විසින් ලබාදෙන නිර්දේශ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීමට කොමිෂන් සභාව අදහස් කර ඇති අතර එහි මුල් පියවරක් ලෙස මෙවර ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිති කොටගෙන මෙම නිර්දේශ එකතුව එළි දැක්වීමට පියවර ගන්නා ලදී.

1948 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එළි දක්වන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය වගන්ති 30කින් සමන්විත වන අතර, මානව හිමිකම් පිළිබඳ ප්‍රධානතම ලියවිල්ල වේ. මිනිසෙකු මෙලොව එළිය දැකීමත් සමග හිමිවන අයිතිවාසිකම් සම්භාරයක් එහි අඩංගු වේ. මානව හිමිකම් ගත්කල එක් අයිතිවාසිකමකට තවත් අයිතිවාසිකමක් දෙවැනි නොවන අතර සෑම අයිතිවාසිකමක්ම එක හා සමාන වැදගත්කමකින් යුක්ත වේ. එමෙන්ම එක් එක් අයිතිවාසිකම් අන්තර් සම්බන්ධතාවකින් යුතුවන අතර, මෙම අයිතිවාසිකම් විශ්වීය වේ.

ඒ අනුව සලකන කළ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් සිතිමේ හා හෘද සාක්ෂියේ අයිතිය, වදහිංසාව හෝ කෲර අමානුෂික අවමන් සහගත සැලකිල්ලට භාජනය නොවීමට ඇති අයිතිය, නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වය හා සමානාත්මතාවයේ අයිතිවාසිකම, අත්තනෝමතික ලෙස සිර භාරයට ගැනීමෙන් වැළකීමට ඇති අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය, තමා කැමති රැකියාවක් හෝ වෘත්තියක් කිරීමට ඇති අයිතීන් මානව අයිතිවාසිකම් අතරින් ඉතා අතලොස්සකි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව රජයේ විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශන සිදු කර 2024 වර්ෂයේ ලබාදෙනලද නිර්දේශ අතරින් තෝරාගත් නිර්දේශ පහක් මෙහි අන්තර්ගත වන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් එය මුද්‍රණය කර ඇත. මෙහි අන්තර්ගත නිර්දේශ කොමිෂන් සභාව විසින් මෙම වසරේ ලබාදෙන ලද නිර්දේශ අතරින් තෝරාගත් කිහිපයක් පමණක් වන අතර, නිර්දේශ ලබාදීමේදී පැමිණිලි පාර්ශවය හා වගඋත්තරකාර පාර්ශවයන් ලබාදෙන ලද සාක්ෂි හා අනෙකුත් සියලු ලේඛන හා දත්ත විශ්ලේශණය කිරීමෙන් අනතුරුව අදාළ නිර්දේශ නිකුත් කර ඇත.

HRC/HO/2865/21, HRC/HO/2706/21 අංකය යටතේ ලියාපදිංචි මෙම පැමිණිලි දෙක එකම කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ලැබී ඇති අතර, එම්.එල්.ලසන්ත නොහොත් ටින්කරින් ලසන්ත නැමති පුද්ගලයා කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය මගින් අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද වෙඩි තැබීමෙන් මරණයට පත්වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනයෙන් හෙළිවී ඇත. ආත්මාරක්ෂාවට ඇති අයිතිය භාවිතා කරමින් පොලිස් නිලධාරීන් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට කරුණු ඉදිරිපත් කර තිබුනද එය එසේ නොවන බවත් කොමිෂන් සභාවේ විමර්ශනය අනුව, එම කරුණු පිළිගත නොහැකි බවත් පෙනී

ගොස් ඇත. ඒ අනුව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය බරපතල ලෙස උල්ලංඝනවී ඇති බවත් ඒ තුලින් ආණ්ඩක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට කොමිෂන් සභාව නිගමනය කරමින් අදාළ වගඋත්තරකාර පාර්ශවය විසින් වන්දි ගෙවිය යුතු බවට හා අදාළ වගඋත්තරකරුවන්ට විරුද්ධව විනයානුකුල පියවර ගතයුතු බවටද නිර්දේශ නිකුත් කර ඇත.

HRC/2603/23, HRC/2153/23, HRC/2154/23 අංකය යටතේ ලියාපදිංචි මෙම පැමිණිලි තුනම නතාෂා එදිරිසූරිය නැමති අය නීති විරෝධීව අත්අඩංගුවට ගෙන ඇති බවට ලැබී ඇති පැමිණිලි වේ. මෙම වින්දිත කාන්තාව කලාකාරිනියක් වන අතර 2023 අප්‍රේල් 01 වන දින "මෝඩාභිමානි" නැමති ප්‍රාසංගික වැඩ සටහනක් පවත්වා ඇති අතර ඇය එම වැඩසටහන යූ ටියුබ් චැනලයේ ප්‍රචාරය කර ඇත. එම වැඩසටහනේදී ප්‍රකාශ කරන ලද ප්‍රකාශයක් මගින් බුදු දහමට අපහාසයක් සිදු කළ බවට සමාජ මාධ්‍ය මගින් විරෝධතාවන් මතුවී තිබූ බවත් ඒ අනුව ඇය එම වැඩසටහන යූ ටියුබ් චැනලයෙන් ඉවත් කර සමාව ගත් බවත් ප්‍රකාශ කර ඇත. මේ තුළ තමාට ඇතිවූ මානසික කම්පනය හේතුවෙන් තමා මානසික විවේකයක් සඳහා විදේශ ගතවීමට යාමේදි කටුනායක ගුවන් තොටුපලේදී අත්අඩංගුවට ගෙන අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදීමෙන් අනතුරුව 2007 අංක 56 දරන සිවිල් හා දේශපාන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනතේ වගන්ති උල්ලංඝනය කර ඇති බවට නඩු පවරා ඇත. එකී පනත යටතේ නඩු පැවරීම තුළින් ඇයට මහේස්ත්‍රාත් අධිකරණයේ ඇප ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී මහාධිකරණයෙන් ඇප අයැදීමට සිදුවී ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාව මගින් සිදු කරන ලද දීර්ඝ විමර්ශනයන් අනුව හෙලිවී ඇත්තේ මෙම තැනැත්තියට 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් කරුණු නොතිබියදී එසේ සිදු කර ඇති බවයි. එමෙන්ම නීතිපතිවරයා විසින්ද මෙම නඩුව පවත්වාගෙන යා නොහැකි බවට අධිකරණය වෙත දැනුම්දී ඇති බවද වාර්තා වේ. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිය තහවුරු කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව පැමිණිලිකාරිය සම්බන්ධව උල්ලංඝනය වී ඇති බවත් ඒ අනුව වගඋත්තරකාර පාර්ශවයට වන්දි ගෙවීම් හා විනය පියවර ගැනීමටද අදාළ නීතිමය තත්ත්වයන් පිළිබදව නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා සුදුසු පුහුණු වැඩසටහන් පැවැත්වීමටද කොමිෂන් සභාව නිර්දේශ නිකුත් කර ඇත.

HRC/904/20/I (vi) ; අංකය යටතේ ලියාපදිංචි මෙම පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාවේ හදිසි දුරකථන ඇමතුමට ලැබුණු නිර්නාමික පැමිණිල්ලක් මත සිදුකරන ලද විමර්ශනයක් වන අතර මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එලිමහන් වැඩ කඳවුර වෙත ගොස් විමර්ශන කටයුතු සිදු කර ඇත. එහිදී එහි රඳවා සිටින දරුවන් 06 දෙනෙකුට වදහිංසා පමුණුවා ඇති බවට ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කිරීමේදී හෙලිවී ඇති අතර ඔවුන් අධිකරණ වෛද්‍ය පරීක්ෂාවට යොමු කර ඇත. අධිකරණ වෛද්‍යවරුන් හා අනෙකුත් අදාළ සාක්ෂි විශ්ලේශණය කිරීමේදී බන්ධනාගාර නිලධාරීන් විසින් මෙම වින්දිත දරුවන්ට පහරදී වදහිංසා පමුණුවා ඇති බවට තහවුරු වී ඇත. ඒ තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය හා 12(1) වගන්තීන් උල්ලංඝනය කර ඇති බවටත් නිගමනය කර ඇත. ඒ පිළිබදව අදාළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීමත් වන්දි මුදල් ගෙවන ලෙසත් නිර්දේශ කර ඇත.

HRC/4835/23 ; මෙම පැමිණිල්ලට අනුව ඇබර්ඩීන් කුඩා ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනාගාරයක් අලුතින් ස්ථාපිත කිරීමට පැමිණිලිකරු විසින් අදාළ සියලුම ආයතන වල (ආයතන 13ක පමණ) අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍යාංශයේ එකගතාවය මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැසට් පත්‍රයේ පළ කර සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග ගිවිසුම් අත්සන් කර තිබියදී පළාත් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ විසින් අනීතික ලෙස එම ව්‍යාපෘතිය නතර කිරීම තුළින් පැමිණිලි පාර්ශවයේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත.මේ පිළිබදව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද දීර්ඝ විමර්ශනය අනුව රජය විසින් 2010

වසරේ අනුමැතිය ලබාදී වසර 10 කට ආසන්න කාලයක් පැමිණිලි පාර්ශවය මේ සඳහා මුදල් වැය කිරීමෙන් අනතුරුව වගඋත්තරකරුවන් විසින්ම ව්‍යාපෘතිය සඳහා යෝජනා කරන ලද සංශෝධිත ස්ථානය නුසුදුසු බවට තීරණය කිරීම හා බලපත්‍රය අවලංගු කිරීමෙන් පැමිණිලිකරුවන්ට අගතියක් සිදුවී අති බවට හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) හා 14 (1) (උ) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝන කර ඇති බවට තීරණය කර අදාල වගකිවයුතු පාර්ශවයට එරෙහිව විනය පියවර ගැනීමට හා පැමිණිලිකරුට සිදුවී ඇති අලාභය තක්සේරු කර ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට නිර්දේශ කර ඇත.

HRC/KI/15/21, මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු ඇතුලු තවත් මාධ්‍යවේදින් දෙදෙනෙකු ඉරනතිවු දූපත නැරඹීමට යාමේදි නාවික හමුදාව විසින් එය වැලැක්වීමට පියවර ගෙන ඇත. මේ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කිරිමෙන් අනතුරුව සිදුකරන ලද විමර්ශනයේදි එකී ඉරනතිවු දූපත වෙත ගමන් කිරීම තහනම් කරමින් නීතියක් පනවා නොමැති බව තහවුරු වි ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (h) ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාව තුළ යාම් ඊමේ නිදහස හා කැමති ස්ථානයක වාසය කිරීමේ නිදහස ඕනෑම පුද්ගලයෙකුට ඇත. නමුත් එම අයිතිවාසිකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(4) ව්‍යවස්ථාව මගින් සීමා කළ හැකිය. ඒ සඳහා රෙගුලාසි පැනවිය හැකි වුවත් එවැනි නෛතික පසුබිමක් නොමැතිව එහි යාමට අවස්ථාව නොදිම තුළින් පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබා දි ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය විම සම්බන්ධයෙන් පැමිණිලි විභාග කර මෙවැනි නිර්දේශ ලබාදීම තුළින් අපේක්ෂා කරනුයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී පීඩාවට පත්වී ඇති පැමිණිලිකරුවන් හා වින්දිතයන්ට යම් සාධාරණයක් හා යුක්ති ඉෂ්ඨ කිරිමේ අරමුනින් සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලබන වගඋත්තරකරුවන් තවදුරටත් එවැනි උල්ලංඝනය කිරීම් වලින් වලක්වා රට තුළ මානව හිමිකම් ගරු කරන සාමාජයක් හා සංස්කෘතියක් බිහි කිරිමේ අභිලාෂයෙනි. මේ සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් මණ්ඩලය විසින් එහි කාර්ය මණ්ඩලය නිවැරදි මාවතක් ඔස්සේ මෙහෙයවීම පිළිබඳව සියලු දෙනාගේම ප්‍රණාමය හිමිවිය යුතුය.

# <u>පටුන</u>

**පිටු අංක**


1. HRC/2865/21, HRC/2706/21…………………………………..06
2. HRC/2603/23, HRC/2153/23, HRC/2154/23…………………..17
3. HRC/904/20 (vi)………………………………………………. 33
4. HRC/4835/23 …………………………………………………. 53
5. HRC/KI/015/21 ……………………………………………….. 60

**<u>නිර්දේශ අංක 01</u>**

| | | |
|---|---|---|
| **පැමිණිලිකාර පාර්ශවය** | **:** | 01. එස්. ආරියදාස මයා,<br>නො 303/05, ශ්‍රී විජය මාවත, බොකුන්දර.<br><br>02. එම්.එල්.එස්.වී.චාමලී මිය<br>අංක - 442, බණ්ඩාරනායකපුර, කැකුණදුර |
| **වින්දිත පාර්ශවය** | **:** | එම්.එල්. ලසන්ත මයා |
| **වගඋත්තරකාර පාර්ශවය** | **:** | 01. ප්‍ර.පො.ප සනත් මයා,<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>02. උ.පො.ප සුජිත් සිල්වා මයා,<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>03. උ.පො.ප නුවන් මයා,<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>04. පො.සැ 37109 රත්නායක මයා<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>05. පො.කො 36218 කිත්සිරි මයා<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>06. පො.කො 79431 ප්‍රියන්ත මයා,<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>07. පො.සැ 60015 තඹවිටගේ දොන් දිමුත් ඉන්දික<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>08. පො.කො 91332 චතුර ප්‍රියසාද්<br>කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය - කළුතර.<br><br>09. ජේ.පො.අ කපිල ප්‍රේමදාස මයා,<br>ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය- කළුතර.<br><br>10. පොලිස්පති - ශ්‍රී ලංකා පොලිසිය. |

**පැමිණිලි අංකය :- HRC/HO/2865/21, HRC/HO/2706/21**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම**

හේවා ලුනුවිලගේ ලසන්ත නොහොත් ටින්කර් ලසන්ත යන අය කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය මගින් අත්අඩංගුවට ගෙන ඇති බවත් ඔහුව අවිආයුධ සොයා ගැනීමට ගෙන ගොස් මරා දැමීමට සූදානමක් ඇති බවත් 2021.11.25 වන දින විද්‍යුත් තැපෑල මගින් හා දුරකථනය මගින් නීතිඥ සංජය ආරියදාස මයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කරමින් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත් වීම**

උක්ත පැමිණිල්ලට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් ශ්‍රී ලංකා පොලිසිය මානව හිමිකම් කොට්ඨාසයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත 2021/11/25 වන දින ප.ව. 10.27 ට දුරකථන ඇමතුමක් මගින් මෙම පැමිණිල්ල පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කර ඇත.

තවද, 2021/11/25 වන දින ක්ෂණික ඇමතුම් කාර්යය භාර නිලධාරී විසින් ප.ව 11.07 ට කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය වෙතින් මෙම අත්අඩංගුවට ගැනීම පිළිබඳව විමසා ඇති අතර, එහිදී උ.පො.ප නිහාල් දක්වා ඇත්තේ එවැනි අත්අඩංගුවට ගැනීමක් සිදු වී නොමැති බවයි.

පසුව 2021/11/26 වන දින ලුනුවිලගේ ලසන්ත යන අය ආයුධ සොයා ගැනීම සඳහා වැඩිදුර විමර්ශනයට ගෙන යාමේදී නිලධාරීන්ට වෙඩි තැබීමට උත්සාහ කිරීමේදී එය වළක්වාලීමට තැත් කිරීමේදී වෙඩි වැදී මිය ගිය බවට මාධ්‍ය මගින් ප්‍රචාරය විනි. තවද, කොමිෂන් සභාවේ ක්ෂණික දුරකථන ඇමතුමට ලද පැමිණිල්ලේ වැඩිදුර කරුණු ලෙස එච්.ජී ලසන්ත යන අයගේ බිරිද සහ දියණිය ඒ දක්වා පොලිස් ස්ථානයේ නීතිවිරෝධීව රඳවා ගෙන ඇති බව සිදු කළ දැන්වීම අනුව කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය වෙත ගොස් පරීක්ෂා කරනු ලැබූ අතර එහිදී ඉදිරිපත් වූ කරුණු අනුව අදාල වින්දිතයාගේ බිරිද හා දියණිය 2021/11/26 දින උදෑසන පොලිස් ස්ථානයට පැමිණ පසුව පිටව ගිය බව දක්වා ඇත.

ඒ අනුව ඔවුන්ගේ නිවස වන කැකනදුර ප්‍රදේශයට මාතර ප්‍රාදේශීය කාර්යාලයේ විමර්ශන නිලධාරීන් යොමු කර අදාළ කරුණු පිළිබඳ සොයා බලන ලද බවත් වින්දිතගේ බිරිද හා දියණිය එහි නොපැමිණි බවට විමර්ශන කණ්ඩායමට ඥාතීන් කරුණු දක්වා ඇත. තවද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායම මෙම සැකකරු මියගිය ස්ථානය පිළිබඳවද ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලදි.

2021.11.26 දාතමින් වින්දිතගේ බිරිද හා දරුවා සම්බන්ධව කිසිදු ආරංචියක් නොමැතිවීම මත ඒ අයගේ ආරක්ෂාව තහවුරු කිරීමට කඩිනම් පියවර ගැනීමට පොලිස්පති වෙත කොමිෂන් සභාව විසින් ලිඛිතව දන්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම**

අමිල ප්‍රසංග යන අය වෙඩි තබා ඝාතනය කිරීමේ ප්‍රධාන සැකකරු වන ලුනුවිලගේ ලසන්ත නොහොත් ටින්කර් ලසන්ත යන අය කළුතර උතුර පොලිස් වසමේ පනාපිටිය ප්‍රදේශයේ සැඟව සිටින බවට 2021/11/25 වන දින කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකයට අනුයුක්තව රාජකාරී කරන පු.පො.ප සනත්

කුමාර නිලධාරියා වෙත ලැබුණු තොරතුරකට අනුව කළුතර කොට්ඨාශය භාර නිලධාරීන්ගේ උපදෙස් පරිදි ප්‍ර.පො.ප සනත් කුමාර, පො.ප සුජිත් සිල්වා, උ.පො.ප නුවන්, පො.සැ. 37109 රත්නායක, පො.සැ. 44817 ගුණවර්ධන, පො.සැ. 60015 ඉන්දික, පො.කො. 79431 ප්‍රියන්ත, පො.කො.91332 ප්‍රියසාද් යන නිලධාරී කණ්ඩායම පො.කො.රි 36218 කිත්සිරි පදවන ලද අංක WP NE 0826 දරන ජීප් රථයෙන් අදාළ තොරතුර පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා 2021/11/25 වන දින ප.ව. 1.00ට පිටව ගිය බව වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇත.

එම නිලධාරී කණ්ඩායම දෙල්දූව ලිපිනයේ නිවසට ලගාවනවාත් සමඟම එම නිවසේ මිදුලේ සිටි පුද්ගලයෙකු නිවස පිටුපස පාරෙන් දිවගිය බවත්, නිලධාරී කණ්ඩායම ද ඔහු පසුපස ලුහුබැඳ ගිය බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී පො.සැ 60015 ඉන්දික හා පො.කො 91332 ප්‍රියසාද් යන නිලධාරීන් විසින් ඔහුව අල්ලා ගැනීමට උත්සාහ දැරීමේදී එම පුද්ගලයා දැඩි ලෙස විරෝධය පෑම හේතුවෙන් එම නිලධාරීන්ට සුළු තුවාල සිදු වී ඇති බවත්, පැය 14.35ට ඔහුව අත්අඩංගුවට ගත් බවත්, පසුව එම සැකකරුගේ ප්‍රකාශ සටහන් කිරීමේදී මාතර කොට්ඨාශයේ අමිල ප්‍රසංග ගිනි අවියකින් වෙඩි තබා ඝාතනය කිරීමේ සැකකරු වූ ලුනුවිලගේ ලසන්ත යන අය බවට කරුණු තහවුරු වූ බවත්, අනතුරුව එම මනුෂ්‍ය ඝාතනය සිදුකිරීම සඳහා යොදා ගත් පිස්තොල අවිය සොයාගැනීම සඳහා දියගම ගල්පාත ලිපිනයට ගිය බවත්, එහිදී සැකකරු තාවකාලිකව පදිංචිව සිටින නිවසට යන කැලෑ සහිත මාර්ගය අසලදී 2021/11/26 වන දින පැය 04.20 පමණ සැකකරු විසින් මාර්ගය අයිනේ සඟවා තිබූ පිස්තොල අවියක් ක්ෂණිකව ගෙන පො.කො 79431 ප්‍රියන්ත නිලධාරියා දෙසට වෙඩි තැබීමට යාමේදී පුද්ගලික ආරක්ෂාවේ අයිතිය සඳහා එම නිලධාරියා විසින් T56 අවියේ එක් උණ්ඩයකින් සැකකරුට වෙඩි තැබූ බවත් දක්වා ඇත.

එම වෙඩි තැබීම හේතුවෙන් සැකකරු තුවාල ලබා නාගොඩ රෝහලට රැගෙන ගිය බවත් පැය 05.15ට ඔහු මිය ගිය බව වෛද්‍යවරයා සඳහන් කළ බවත් දක්වා ඇත.

<u>පැමිණිලිකාරියගේ ප්‍රකාශය - චම්පා චාමලී මිය</u>

මියගිය පුද්ගලයා තමාගේ ස්වාමිපුරුෂයා බවත්, පසුගිය කාලවකවානුව තුළ විවිධ ප්‍රදේශ වල සැඟවී ජීවත් වූ බවත්, රහසිගතව කළුතර නිවසක සිටින අතර ඊට පෙර මාතර පොලීසිය, කැකනදුර පොලීසිය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමාව පොලිස් ස්ථාන වලට රැගෙන ගොස් ස්වාමි පුරුෂයා පිළිබඳවත් සල්ලි පිළිබඳවත් විමසූ බව දක්වා ඇත. පසුව තමාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණීමට දැන්වූ බවත්, ඒ අතරේ තමාගේ ස්වාමිපුරුෂයා හා දරුවා සමඟ කළුතරට පැමිණ කුළී නිවාස තුනක සිටි බවත්, 2021/11/25 වන දින ලසන්තගේ මිතුරෙකු ඔහුට කතා කර ඔහු සිටින ස්ථානයට පොලීසියෙන් එන බවට පැවසූ බවත් දක්වා ඇත. ඒ අවස්ථාවේ ඇඳුම් හා සල්ලි ලක්ෂ 26ක් ගෙන එම නිවසින් මොරන්තුඩුව නිවසට පෙ.ව. 10ට පමණ ගිය බවත්, පසුව පොලිස් නිලධාරීන් 15දෙනෙකු මොරොන්තුඩුව නිවස වෙත පැමිණි බවත්, එම අවස්ථාවේදී ලසන්ත දිව ගිය බවත්, තමා හා දියණිය ඇඳ යට සැඟවුනු බවත් පෙ.ව. 11.00ට පමණ වෙඩි ශබ්ද හා පහරදීම් ඇසුනු බවත, පසුව පොලිස් නිලධාරීන් විසින් තමාව සොයා ගත් බවත් දක්වා ඇත.

පොලිස් නිලධාරීන් ලසන්තගේ දුරකථනය, හැඳුනුම්පත සියල්ල රැගෙන ගිය බවත්, එම පොලිස් නිලධාරීන් කළුතර කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකයට අයත් අය බව පසුව දැනගත් බවත්, තමා හා තම දියණිය නිවසින් පොලිස් ස්ථානයට ගෙන ගොස් රාත්‍රී 8.30 දක්වා රඳවාගෙන පසුව යාමට දැන්වූ බවත් වැඩිදුරටත් දක්වා ඇත. තමා ලසන්තව පෙන්වීමට කිවුවද ස්වල්ප වේලාවකින් ගෙන එන බව පැවසුවද නොගෙන ආ බවත්, පසුව නිවසට පැමිණ පසුදා උදේම පොලිස් ස්ථානයට ගියත් ලසන්තව නොපෙන්වූ බවත්, තමා අම්බලන්ගොඩ නිවසට ආපසු පැමිණි බවත්, තමාගේ ස්වාමියා මිය ගිය බව විද්‍යුත් මාධ්‍යයෙන් දැන ගත් බවත් වැඩිදුරටත් දක්වා ඇත.

ඒ අනුව කොමිෂන් සභාව විසින් විමර්ශන සිදුකර ඇති අතර, පහත නම් සඳහන් වගඋත්තරකරුවන් පහත දිනයන්හිදි කැඳවා ප්‍රකාශ සටහන් කර ඇත.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍ර.පො.ප සනත් මයා | - | 2021.12.02 |
| 02. | පො.ප සුජිත් සිල්වා මයා | - | 2021.12.07 |
| 03. | උ.පො.ප නුවන් මයා | - | 2021.12.02 |
| 04. | පො.සැ 37109 රත්නායක මයා | - | 2021.12.07 |
| 05. | පො.කො 36218 කිත්සිරි මයා | - | 2021.12.02 |
| 06. | පො.කො 79431 ප්‍රියන්ත මයා | - | 2021.12.02 |
| 07. | පො.සැ 60015 තඹවිටගේ දොන් දිමුත් ඉන්දික | - | 2021.12.29 |
| 08. | පො.සැ 44817 ගුණවර්ධන | - | 2021.12.21 |
| 09. | ජේ.පො.අ කපිල ජේමදාස මයා | - | 2021.12.23 |
| 10. | පොලිස්පති - ශ්‍රී ලංකා පොලිසිය | - | 2021.12.02 |
| 11. | උ.පො.ප ඉන්දික | - | 2021.12.21 |

**<u>නිරීක්ෂණ</u>**

මියගිය වින්දිත එම්.එල්.ලසන්ත අත්අඩංගුවට ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැමිණිලිකාරිය වන වින්දිතගේ බිරිඳ දක්වා සිටිනුයේ තම ස්වාමිපුරුෂයා සැගවී සිටීමට කළුතර ප්‍රදේශයට පැමිණි බවත්, 2021/11/25 වන දින උදෑසන තමාගේ ස්වාමිපුරුෂයා අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධාරීන් පැමිණෙන බව මිතුරෙකු ඔහුට කළ දැන්වීම මත වෙනත් නිවසකට ගිය බවත් ය. 01 සිට 07 දක්වා ඉහත දිනැතිව වගඋත්තරකරුවන් ලබාදුන් ප්‍රකාශ වල දක්වා ඇත්තේ පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් වන අමිල ප්‍රසංග යන අය වෙඩි තබා ඝාතනය කිරීමේ සැකකරු කළුතර උතුර පොලිස් වසමේ නිවසක සැඟව සිටින බවට ලද තොරතුරක් මත සිදුකළ පරීක්ෂා කිරීමේදී මියගිය වින්දිත එම්.එල්.ලසන්ත අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව දෙපාර්ශවයේ කරුණු දැක්වීම මත මෙම සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ හේතුවක් පැවති ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීමට අනුව උදෑසන 08.00ට පමණ පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරු මත ක්‍රියාත්මක වනුයේ දහවල් 1.00ට පමණ බව අවධානයට යොමු වේ. පොලිසියට ලද තොරතුරකට අනුව අත්අඩංගුවට ගැනීමට යාමට සූදානම් වීම පිළිබඳව සැකකරුට දැනගැනීමට ලැබුණු බව පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම අනුව පැහැදිලි වේ. ඒ අනුව පොලිස් ස්ථානයට ලද තොරතුරු වල රහස්‍ය භාවය රැක ගැනීම නිලධාරීන්ට හා ඉහළ නිලධාරීන්ට නොහැකි වීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව මෙහිදි අවධානය යොමු කරනු ලැබේ.

වින්දිත එම්.එල්.ලසන්ත අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ගෙනයාමක් සිදුනොකර ආරක්ෂිත හා නිදහස් ස්ථානයක් වූ එළිමහන් කලුතර මාර්ගයේ ඇති නාරා ආයතනය අසල ඇති බන්ට් එක පෙදෙසට වැඩිදුර විමර්ශනය සඳහා ගෙනගිය බව 01 සිට 08 දක්වා වූ වගඋත්තරකරුවන් ඉහත දැක්වූ දිනැතිව ලබාදුන් ප්‍රකාශ මගින් පිළිගෙන ඇත.

වගඋත්තරකාර පාර්ශවයට අනුව 2021.11.25 වන දින සවස 15.35 සිට පසු දින උදෑසන 2.10 පමණ වන තුරු වින්දිතගෙන් ප්‍රශ්න කිරීම ඉහත දැක්වූ ස්ථානයේදි සිදු කළ බවද ප්‍රකාශ මගින් පිළිගෙන ඇත. සිදුකළ ප්‍රශ්න කිරීමේදි සැකකරු මනුෂ්‍ය ඝාතන, කොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ ආදී වූ අපරාධ රැසක් සිදු කර ඇති බවට මෙන්ම වාද්දුව ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු ඝාතනයට කොන්ත්‍රාත් ලබාගත් බවට කරුණු අනාවරණය වූ බවද දක්වා ඇත. තවද එම ප්‍රශ්න කිරීම් අතරතුර වින්දිත ඇතුළු පොලිස් නිලධාරීන් දිවා ආහාරය ප.ව. 5.00ට හා රාත්‍රී ආහාරය පසු දින එනම්, 2021.11.26 වන දින පෙ.ව. 2.00ට ලබා ගත් බවට කරුණු ඉදිරිපත් කර ඇති බව 01 සිට 08 දක්වා වන සියලුම වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ හා සාක්ෂි ලෙස ප්‍රකාශ ලබාගත් උ.පො.ප ඉන්දික යන නිලධාරියාගේ ප්‍රකාශය අනුව නිරීක්ෂණය වේ.

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අවධානය යොමු කිරීමේදී වින්දිතයාගේ අමාශයේ කිසිදු ආහාරයක් නොමැති බවට සටහන් යොදා ඇත.

එහෙත් 01 සිට 08 දක්වා වූ වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම හා වින්දිතට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව වින්දිත රාත්‍රී ආහාරය ගෙන පැය 1 1/2ක කාලයක් තුළ මිය ගොස් ඇත. තවද එහිදී ආහාර ජීරණයට අවම වශයෙන් පැය 6ක කාලයක් ගත වන බැවින් ආමාශයේ කිසිදු ආහාරයක් නොතිබීම ප්‍රශ්න සහගත වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය තම අත්අඩංගුවේ සිටියදී වින්දිතට ආහාර ලබා දුන් බවට ප්‍රකාශ කරන කරුණු තහවුරු නොවන අතරම අත්අඩංගුවේ පසුවන අයවලුන්ගේ මූලික අවශ්‍යතා සපයා දීමට කටයුතු කර නොමැති බවද කරුණු නිරීක්ෂණය වේ.

එසේම, වගඋත්තරකරුවන් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට අදාළව දක්වන කරුණු වලදී විවිධ පරස්පරතාවයන් පවතින බවට ඔවුන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දී ඇති ප්‍රකාශ පිළිබඳව අවධානය යොමු කිරීමේදි නිරීක්ෂණය වේ.

එහිදී ප්‍රශ්න කිරිම් හා වැඩිදුර විමර්ශන සඳහා ගෙන යාමේදි 05 වන වගඋත්තරකරු දක්වා ඇත්තේ ආයුධ සොයා ගැනීමට නිවස අසලට යාමේදී පිටුපසට කර දැමූ මාංචු ගලවා දෑත් ඉදිරියට කර මාංචු දැමූ බව ය. නමුත්, 05 වන වගඋත්තරකරු හැර අංක 01 සිට 08 දක්වා වූ අනෙකුත් වගඋත්තරකරුවන් විසින් දක්වා ඇත්තේ මුලසිටම මෙම වින්දිතට අත් ඉදිරියට කර මාංචු දැමූ බව ය. ඒ අනුව මාංචු දැමීම පිළිබඳව පරස්පර ප්‍රකාශ වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකරුවන් කොමිෂන් සභාව හමුවේ ලබාදුන් ප්‍රකාශ හා තොරතුරු ලේඛනයේ පිටවීමේදී යෙදූ සටහන් වල පරස්පරතාවයක් හඳුනාගත හැකි ය. 02 වන වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ දක්වා සිටිනුයේ "මම දැක්කා එයාගේ වම් පැත්තට අයිනට එකපාරට ගිහින් පාත්වෙලා මොකක්ද ගන්නවා එයා ආපස්සට නැවි නැගිටනවාත් එක්කම වෙඩි ශබ්ද දෙකක් එකලග ඇහුනා. ඒ සමගම එයාගේ පිටුපස්සේ හිටියේ ප්‍රියන්ත ප්‍රියන්ත අතේ තිබුනු ගිනි අවියෙන් සැකකරුට වෙඩි තිබ්බා. ඒ සමගම සැකකරු බිමට උඩුබැලි අතට වැටුනා" යනුවෙනි. 2 වන වගඋත්තරකරු 2021.11.26 වන දින පැය 18.35ට GCIB 127/81හි යෙදූ පිටවිමේ සටහන අනුව සටහන යොදා ඇත්තේ "එකවරම සැකකරුගේ ඉරියවු වෙනස් වි මොහු ගමන් ගත් පාරේ වම්පසට වැටෙනවා දුටුවා. ඒත් සමගම පො.කො ප්‍රියන්ත නිලධාරි කලබල වි පියවරක් හෝ දෙකක් පසු පසට එනවාත් සමග ප්‍රියන්ත නිලධාරියා දෙසට පිස්තොල අවියකින් වෙඩි තබමින් නැගිට්ටා මා දුටුවා. ඒත් සමගම මාද බිමට පාත්වී කලබල වී පහත්වෙනවාත් සමගම ක්ෂණිකව ක්‍රියාත්මක වූ ප්‍රියන්ත නිලධාරියා ඔහු අත තිබූ අවියෙන් ප්‍රහාරයක් එල්ල කලා සැකකරු උඩබැලි අතට ස්ථානයේ වැටුණා" යනුවෙනි.

විමර්ශනයේදී අත්අඩංගුවට ගත් සැකකරු ප්‍රශ්න කිරීමේදි මනුෂ්‍ය ඝාතන, කොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ මෙන්ම වාද්දූව ප්‍රාදේශයේ ව්‍යාපාරිකයෙකු ඝාතනයට කොන්ත්‍රාත් ලබා ගත් බවට කරුණු අනාවරණය වූ බව 01-08 දක්වා වූ වගඋත්තරකරුවන් කොමිෂන් සභාවේදී ලබාදුන් ප්‍රකාශ වලදී දක්වයි. එසේම, සන්ෂයින් සුද්දා ඝාතනයට යොදා ගත් පිස්තෝල අවිය සඟවා තබා ඇති ස්ථානය පිළිබඳව එම ප්‍රශ්න කිරීමේදි සැකකරු පැවසූ බවට කරුණු දක්වා ඇත. ඒ අනුව විමර්ශණයේදී සියලු කරුණු අනාවරණය කිරීම, ආයුධ සඟවා ඇති ස්ථානය පිළිබඳව ඒ අවස්ථාවේදීම ප්‍රකාශ සිදුකිරීම යන කරුණු සලකා බැලීමේදී සත්‍ය වශයෙන්ම එවැනි ප්‍රකාශයක් වින්දිත ලබා දුන්නා ද යන ප්‍රශ්නය පැන නගී. මන්දයත්, සැකකරු පොලිස් නිලධාරීන්ගෙන් සැඟව සිටීමට උත්සහ කළ බව පැමිණිලිකරුවන් දක්වා ඇති බැවිනි. කෙසේ වුවද, 01 සිට 08 දක්වා වන වගඋත්තරකරුවන් ලබාදුන් ප්‍රකාශ අනුව වින්දිත විසින් තමා සිටි නිවසේ කුෂන් පුටුව යට ගිනි අවිය සඟවා තිබූ බව කියනු ලබන ස්ථානයට, එම සඟවා තිබූ ආයුධය පරීක්ෂා කිරීමට පෙ.ව 2.10 පිටත්ව ගිය බවට කණ්ඩායමේ සියලු දෙනාම කරුණු දක්වා ඇත.

මෙහිදී වගඋත්තරකාර පාර්ශවය දක්වනුයේ වින්දිත අවිආයුධ සඟවා ඇති ස්ථානයට යන කොන්ක්‍රීට් පාරේ වාහනයක් ගොස් හැරවීමට නොහැකි බව දැක්වීම මත වාහනය පසුපසට ධාවනය කළ බවයි. එසේම වින්දිත සිටි නිවසේ කුෂන් පුටුව යට පිස්තෝලයක් සඟවා ඇති බව දැන්වීම මතම කිසිදු සොයා බැලීමකින් තොරව වින්දිත සමඟ එම ස්ථානයට රාත්‍රියේ යාමට පිටත්ව ගිය බවට ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ.

මෙම වින්දිත සැකකරු අත්අඩංගුවට ගැනීමට ගිය අවස්ථාවේ සිට විමර්ශනය අවසන් වන තෙක් මෙම වගඋත්තරකාර පාර්ශවයන්ට අමතරව වෙනත් පොලිස් නිලධාරින් කණ්ඩායමක් ද විවිධ ප්‍රකාශ ගැනීමට, විමර්ශන අවස්ථාවේ කෑම බීම සැපයිමට හා විමර්ශන කටයුතු අතරතුර ආරක්ෂාවට විමර්ශන ස්ථානයට ඈතින් රඳවා තබා ගැනීම සිදුකර ඇති බව වගඋත්තරකාර පාර්ශවය දැක්වූ කරුණු අනුව නිරීක්ෂණය වේ.

එසේම වින්දිත තමා සිටි නිවසේ පුටුවේ කුෂන් යට අවිය සඟවා ඇති බවට විමර්ශනයේදි ලබාදුන් කරුණු පරීක්ෂා කිරීමට ඒ අවස්ථාවේදි වගඋත්තරකාර පාර්ශවය සඳහන් කළ අමතර කණ්ඩායම යවා එහි සත්‍යතාව පරීක්ෂා කිරීමේ හැකියාව තිබුණු බව කොමිෂන් සභාවට කරුණු අනුව පෙනී යයි.

තවද, එදින වැටලීම සඳහා නිලධාරීන් රැගෙන ගිය ජීප් රථය වන එන්.ඊ 0826හි ධාවන සටහන් පොත පරීක්ෂා කිරීමේදී 2021.11.23 ට පසු ඇතුලත් වී ඇත්තේ 2021.11.25 ධාවන සටහන් වන නමුත් ඊට මැද වූ ධාවන සටහන් කොළ ඉරා දමා ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

ඒ පිළිබඳව එකී රථයේ රියදුරු වන 05 වන වගඋත්තරකරු වෙතින් විමසීමේදී ධාවන සටහන් ලියාගෙන යාමේදී තමන් ගමන් කළ මාර්ගය මඟහැරුණු නිසා කොළ කඩා ඉවත් කළ බව 05 වන වගඋත්තරකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2021.12.02 වන දින ප්‍රකාශ කර ඇත.

ඉහත කරුණු සමස්ථයක් වශයෙන් ගෙන සලකා බැලීමේදී වින්දිත පාර්ශවය විසින් සඟවා තිබූ පිස්තෝල අවියක් ගෙන වෙඩි තැබූ බවට වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද ප්‍රකාශය අදාළ ස්ථානගත කරුණු අනුව තහවුරු නොවන බව පෙනී යන අතර එවැන්නක් සිදු කිරීමට වින්දිත පාර්ශවයට හැකියාවක් පැවති බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවේ.

එසේම, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පිළිබඳව අවධානය යොමු කිරීමේදී වෙඩි තැබීම නිසා ඇති වූ තුවාල පිළිබඳව වෛද්‍යවරයා දක්වා ඇත්තේ එහි පිලිස්සීම්, කලුවීම් හෝ ටැටුවීම් දක්නට නොලැබෙන බවයි. අදාළ අධිකරණ වෛද්‍යවරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ලබාදුන් 2022.02.02 දිනැති ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ මෙම වෙඩි තැබීම සෙන්ටිමීටර 30- 45 කට වඩා ඈත දුරක සිට කරන ලද වෙඩි තැබීමක් බවයි.

තවද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව උණ්ඩය ගමන් කළ මාර්ගය ලෙස දක්වා ඇත්තේ පිටුපස ඉහළට පාර්ශවික ලෙසය. නමුත් 2022.02.02 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ අධිකරණ වෛද්‍යවරයා විසින් ලබාදුන් ප්‍රකාශයේ උණ්ඩය ගමන් කළ මාර්ගය ලෙස දක්වා ඇත්තේ පිටුපසට පහලට පාර්ශවිකව ලෙස ය.

එසේම අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඉරීම් තුවාලයක් පිළිබඳව සඳහන් වන අතර එය ඇතුල්වීම සහ පිටවීම 3.5 × 1cm පපුවේ පිටුපස වම් පැත්තට වන්නට මධ්‍ය රේඛාවෙන් 3cmක් ඉවතට හා හිස මුදුනේ සිට 51.5cm පහලට වන්නට පිහිටා ඇති බවත්, එම තුවාලයේ පටක කෙලවරවල් පිටතට නෙරා ඇති බවත්, එය වෙඩි උණ්ඩය හේතුවෙන් ඇතිවූවක් බවත් දක්වා ඇත. තවද එකී වෙඩි උණ්ඩය උරෝස්ථිය සිදුරු කරමින් හයවන ඉල ඇටය මට්ටමේදී දකුණු පෙනහැල්ල මීඩියස්ටිනම් පරිතන්තුව, වම් කෝෂිකාව,වම් කර්ණිකාව, පරිතන්තුව, වම් පෙනහැල්ල මැදින් 5-6 ඉල ඇට අතරින් ගොස් පස්වන ඉල ඇටය බිඳී ඇති බවත්, අස්ථි බන්ධනයක් සිදුව ඇති බවත් අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කර ඇත.

තවද අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවේ වැලමිට ආසන්නයේ සීරීම් තුවාල 2 ක් ඇති බවට සඳහන් කර ඇති අතර එම තුවාල කුමක් හෝ කටුවක් වැනි දෙයක් වැදීම නිසා සිදු වූ සීරීම් ලෙස නිගමනය කළ හැකි

බවට අධිකරණ වෛද්‍යවරයා විසින් 2022.02.22 වන දින කොමිෂන් සභාව හමුවේ ලබා දී ඇති ප්‍රකාශ තුළ සඳහන්ව ඇත. එසේම අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවෙ දණහිස ඉදිරිපස සීරීමක්, පපුවේ දකුණු හා ඉදිරිපස 4 cm × 2 cm තැලීම් තුවාලයක්, පපුවේ දකුණු පස ඉදිරියෙන් 3 × 2 cm තැලීම් තුවාල, වම් වලලුකර හන්දියේ මාංශපේශි තැලීමක් ලෙස තුවාල දක්වා ඇත. නමුත්, වගඋත්තරකාර පාර්ශවය විසින් 2021.11.26 දිනැති GCIB 137/83 හි පැමිණිමේ සටහන් යෙදීමේදී සැකකරු දිවයාමේදී වැටුනු බවත්, එහිදී ඔහුගේ දෙපා, දණහිස්, වැලිමිට හා මුහුණ ප්‍රදේශයේ සීරීම් තුවාල ඇති වූ බවත් දක්වා ඇත. එසේම 2021.11.26 දිනැති GCIB 89/75 සටහනෙහි ද කකුල්, දණහිස් දෙක, වැලමිට් දෙක හා මුහුණ යන ස්ථානවල සීරීම් තුවාල තිබූ බව දක්වා ඇත.

එසේවුවද, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ එම මුහුණේ වූ සීරීම් තුවාල අධිකරණ වෛද්‍යවරයා විසින් සටහන් කර නැත. ඒ අනුව එම අධිකරණ වෛද්‍ය වාර්තාව කිහිප අවස්ථාවකම ප්‍රශ්න සහගත වන බව කොමිෂන් සභාවට නිරික්ෂණය වේ.

තවද අධිකරණ වෛද්‍යවරයාගේ වෛද්‍ය වාර්තාවේ මරණය සිදුවු වේලාව පෙ.ව. 3.00 ලෙස සටහන් කර ඇත. වගඋත්තරකරුවන්ට අනුව පෙ.ව. 4.20ට පමණ මිය ගිය බව දක්වා ඇත. පාර්ශවයන්ගේ කරුණු දැක්වීම මත මරණය සිදුවු වේලාව පිළිබඳව පරස්පර කරුණු පවතින බව නිරික්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය දක්වනුයේ සැකකරු අත්අඩංගුවට ගැනීමේදි පොරබැදීමක් සිදුවී කොන්ක්‍රීට් පාරේ සැකකරු වැටුනු බව ය. එසේම සැකකරුගේ තුවාල කෙරේ අවධානය යොමු කිරීමේදි එම තුවාල වැලිමිට, වලලුකර, දණහිසේ හා පපුවේ ඉදිරිපස තිබීම තුලින් එම කරුණු තහවුරු වේ.

වින්දිත අත්අඩංගුවේ සිටියදී එදිනට සැකකරුගේ ජීවිතයට තර්ජනයක් ඇති බව දක්වමින් පැමිණිලි පාර්ශවයන් පොලිස්පති වෙත දන්වමින් විද්‍යුත් තැපැලක් යොමු කර ඇති බව කරුණු නිරීක්ෂණය වේ. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට රාත්‍රී 10.00 අතර කාලයකදී පැමිණිල්ලේ නීතිඥ මගින් ක්ෂණික දුරකථන අංකයට, අධ්‍යක්ෂ පරීක්ෂණ හා විමර්ශන දුරකථනයට හා විද්‍යුත් තැපැලට වින්දිතගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති බවට ලද පැමිණිලි මත මානව හිමිකම් කොමිෂන් සභා නිලධාරීන් විසින් පොලිස් මානව හිමිකම් කොට්ඨාශය දැනුවත් කර ඇති අතර මානව හිමිකම් කොට්ඨාශ අධ්‍යක්ෂ විසින් කළුතර පොලිස් අධිකාරී වෙතද ඒ බව දන්වා ඇති බව එම පාර්ශවයන් මානව හිමිකම් කොමිෂන් සභාවේදි ලබාදී ඇති ප්‍රකාශ මත කරුණු නිරික්ෂණය වේ.

<u>නීතිමය විශ්ලේශණය</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව සියලුම තැනැත්තන් නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමට සුදුසුකම් ලබයි.

පොලීසියේ ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීතිරීති පොලිස් නියෝග ඒ 20 හි දක්වා ඇත.

එහි පැහැදිලිව දක්වා ඇත්තේ සිරභාරයේ සිටින තැනැත්තෙකු වරදකරු කරනු ලැබූ සිරකරුවෙකුගේ තත්ත්වයේ සිටින්නෙකු නොවන බවත්, ආරක්ෂා භාරය ගැන සලකා ඔහු ගැන සෑම අතින්ම සැලකිලිමත් විය යුතු බවත් සෑම පොලිස් නිලධාරියෙකු විසින්ම මතක තබා ගත යුතු බවත් ය.

මෙහිදී පොලිස් නියෝග ඒ 20 හි දක්වා ඇති පරිදි සිරභාරයට ගත් තැනැත්තාට අත්මාංචු දැමීම එහි සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියාගේ අභිමතය පරිදි කළ හැකි අතර අත්අඩංගුවට ගෙන ඇති තැනැත්තා අවමානයට භාජනය නොකොට ඔහු පැනයාම වැළැක්වීමට සෑම ආරක්ෂක විධිවිධානයක්ම සැලසිය යුතු ය.

එසේම, පොලිස් නියෝග ඒ 20 හි (7) (බී) අනුව පැන යන්නට හෝ සැහැසිවන්නට ඉඩ ඇති කෙනෙකු කැටුව යාමට සෑහෙන තරම් බලවත් ආරක්ෂණයක් යොදන්නට සැලකිලිමත් විය යුතුය.

තවද, පොලිස් නියෝග ඒ 20 හි (7) (අයි) අනුව බලවත්ම හේතුවක් ඇත්නම් මිස පොලිස් භාරයේ සිටි තැනැත්තෙකු වැඩිදුර පරීක්ෂණ සඳහා පොලිස් ස්ථානයෙන් පිටත නොයැවිය යුතුය. එසේ යවන විටද, ඔහුගේ භාරය සුරක්ෂිත වන පරිදි ප්‍රමාණවත් ආරක්ෂාවන් ඇතිවම යැවිය යුතු ය.

තවද, පොලිස්පති චක්‍රෙල්ඛ අංක 2328/2011 හි පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය දක්වා ඇත.

එකී චක්‍රලේඛයේ XI හි අත්අඩංගුවට ගනු ලබන සියලු පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික කරන අයුරින් කටයුතු කිරීමට සියලුම ස්ථාන භාර නිලධාරීන් වගකීමෙන් බැඳෙන බවත්, එවැනි අධීක්ෂණය කරන දිස්ත්‍රික් භාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව දැඩි ලෙස නිරීක්ෂණය කළ යුතුය යන්න සඳහන්ව ඇත.

ඒසේම, එකී චක්‍රලේඛයේ III හි සැකකරු වෙනත් කිසියම් ස්ථානයකට ගෙන යාමේදී සියලුම වාර්ථා, තොරතුරු පොතේ නිසි ලෙස සටහන් කළ යුතු බව සඳහන්ව ඇත.

තවද, පොලිස්පති චක්‍රලේඛ අංක 2747/2023 හි පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොලිස් නිලධාරීන් විසින් අවධානය යොමු කළ යුතු නෛතික ප්‍රතිපාදන පිළිබඳව දක්වා ඇත.

එකී චක්‍රලේඛයේ 4.3.i. අනුව වැඩිදුර විමර්ශන සඳහා අත්අඩංගුවේ සිටින සැකකරුවන් රැගෙන යන අවස්ථාවේදී එසේ රැගෙන යන නිලධාරීන් විසින් සැකකරුවන්ගේ ආරක්ෂාව සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු අතර, ස්ථානාධිපතිවරුන් හා අධීක්ෂණ නිලධාරීන් ඒවා අධීක්ෂණයට ලක් කළ යුතු බවට දක්වා ඇත.

එසේම, එකී චක්‍රලේඛයේ 5.5.4. අනුව සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන්, මත්ද්‍රව්‍ය, මිනීමැරීම්, කොල්ලකෑම් ආදී බරපතල අපරාධ වලට සම්බන්ධ සැකකරුවන්, අවිආයුධ පුහුණුවක් සහිත සැකකරුවන් හා ත්‍රස්තවාදී ක්‍රියාවලට සම්බන්ධ සැකකරුවන් පොලිස් අත්අඩංගුවේ සිටින අවස්ථාවලදී ඔවුන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම ස්ථානාධිපතිගේ වගකීම බව සඳහන් කර ඇත.

තවද, එකී චක්‍රලේඛයේ 5.5.10. අනුව සැකකරුවෙකු විමර්ශන සඳහා පිටතට රැගෙන යන ලද ඇතැම් අවස්ථාවලදී එම සැකකරු විසින් නිලධාරීන්ගේ ගිනි අවි උදුරා ගැනීමේ හා/හෝ නිලධාරීන්ට හා වෙනත් තැනැත්තන්ට අනතුරක් කිරීමේ අවධානමක් උද්ගත වී ඇති බව අතීත අත්දැකීම් වලින් පෙනී යන අතර, එම නිසා එවැනි අවධානමක් කිසිසේත්ම ඇති නොවන ලෙස කටයුතු කිරීම කණ්ඩායම් භාර නිලධාරියාගේ වගකීම වන බවට දක්වා ඇත.

ඉහත කරුණු ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් කොට්ඨාශ භාර නිලධාරීන් හා ප්‍රදේශ භාර පොලිස්පතිවරුන්ගේ යුතුකම වේ. ඉහත උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න සහ අත්අඩංගුවට ගත් සැකකරුවන්ගේ අයිතිවාසිකම් නිසි ලෙස සහතික කෙරේ ද යන්න පිළිබඳව නියෝග අධීක්ෂණ ක්‍රියාවලියක් පැවතිය යුතු බව දක්වා ඇත.

ඒ අනුව තමා භාරයේ සිටින සැකකරුවකු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන තිබුණ ද, එම ප්‍රතිපාදනයන්ට අනුව වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

මෙම සැකකරු අත්අඩංගුවට ගත් පසු පොලිස් ස්ථානයට ගෙන යාමකින් තොරව වෙනත් පාළු ප්‍රදේශයක පැය 12ක් ජීප් රථයක් තුළ රඳවාගෙන ප්‍රශ්න කිරීම තුළින් එම සැකකරුගේ ආරක්ෂාව පිළිබඳව සලකා බලා නොමැති බව නිරීක්ෂණය වේ. පොලිස් ස්ථානයකට ගෙන ගොස් විමර්ශන කටයුතු සිදු කරනවාට වඩා වෙනත් පාළු ප්‍රදේශයක ප්‍රශ්න කිරීම තුළ සැකකරුගේ ආරක්ෂාව සලකා බැලීමක් සිදු කළ බවට වගඋත්තරකරුවන් දක්වන ප්‍රකාශ තර්කානුකූලව පිළිගත නොහැකි ය. තවද වගඋත්තරකාර පාර්ශවයට අනුව අත්අඩංගුවට ගැනීමට පෙර හා විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අනුව සැකකරු බරපතල සාතන අපරාධකරුවෙකු වේ. එවැනි අපරාධ සම්බන්ධයෙන් සැකකරුවෙකු අවිආයුධ සඟවා ඇති තැන නිශ්චිතව දක්වා තිබියදී, ආරක්ෂාවට වෙනත් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ස්ථානගත කර තිබියදී, පෙ.ව 3.00 ට නිලධාරීන් යවා එම තොරතුරු පරීක්ෂා කිරීමට හැකියාව තිබියදී, එම ආයුධය ගැනීමට රැගෙන යාමත් එම රැගෙන යාමේදී මාංචු අත් ඉදිරියට දමා රැගෙන යාමත් තුළ වගඋත්තර පාර්ශවය තම වගකීම ඉෂ්ඨ කරාද යන පැනය මතුවේ.

එසේම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම සැකකරුගේ ජීවිතයට තර්ජනයක් ඇති බව ශ්‍රී ලංකා පොලිස් මානව හිමිකම් කොට්ඨාශයේ අධ්‍යක්ෂක වෙත පැමිණිල්ල ලද වහාම දන්වා ඇත. ඒ අනුව මානව හිමිකම් කොට්ඨාශයේ අධ්‍යක්ෂක විසින් ඒ පිළිබඳව පළාත භාර පොලිස් අධිකාරීව දැනුවත් කර තිබියදි එම තොරතුරු පහළ නිලධාරීන්ට පැහැදිලිව ගලායාමක් සිදු කර නොමැති බව හා නිසි අධීක්ෂණයක් සිදු කර නොමැති බව තහවුරු වේ. එසේම, මෙම වින්දිත අත්අඩංගුවට ගත් පසු පොලිස් භාරයේදි ඔහුව මරණයට පත් කිරීමට හැකියාවක් ඇති බව දක්වමින් පොලිස්පති වෙතද විද්‍යුත් තැපැල් මගින් දන්වා තිබියදි ඒ පිළිබද සැලකීමක් දක්වා නොමැති බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ඒ අනුව මෙම අවස්ථාව පිළිබඳව නිසි අධික්ෂණයක් හෝ නිරීක්ෂණයක් අදාළ ඉහල බලධාරීන් සිදුකර නොමැති බව ද කොමිෂන් සභාවට පෙනී යයි.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය මෙම සැකකරුට ප්‍රමාණවත් ආරක්ෂාව සැපයීමක් සිදු කර නොමැති අතරම පොලිස් නියෝග ඒ 20, පොලිස්පති චක්‍රලේඛ 2328/2011 සහ පොලිස්පති චක්‍රලේඛ අංක 2747/2023 හි සඳහන් නෛතික ප්‍රතිපාදන නිසි ආකාරව ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරන ලද සියලු කරුණු අනුව සලකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය කර ඇති බව නිගමනය කළ හැකි ය.

**<u>13 (4) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම.</u>**

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 3 වන වගන්තිය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 6 වන වගන්තිය, ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, සියලුම සංක්‍රමික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතියේ 11 වන වගන්තිය, අබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 10 වන වගන්තිය සමඟ කියවීම තුළ ජීවත්වීමේ අයිතිය තහවුරු කරයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජීවත්වීමේ අයිතිය පිළිබඳව 13(4) ව්‍යවස්ථාවේ සඳහන් කරුණු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු වලදී තවදුරටත් තහවුරු කර ඇත.

<u>ශ්‍රීයාණි සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ පොලිස් ස්ථානාධිපති පයාගල පොලිස් ස්ථානය සහ වෙනත් අය</u> (2003) 1 Sri LR 14 නඩු තීන්දුවේදි "ජීවත්වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පැහැදිලිව හඳුනාගෙන නොමැති වුවද III වන පරිච්ඡේදයේ සමහර විධිවිධාන වල එම අයිතිය ගම්‍ය වේ.

විශේෂයෙන් 13(4) වන ව්‍යවස්ථාවෙන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව **නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස කිසිම තැනැත්තෙකු මරණීය දණ්ඩනට යටත් කිරීම හෝ කිසිම තැනැත්තෙකු බන්ධනාගාර ගත කිරීම හෝ නොකළ යුතු බව අවධාරණය කරයි.** එනම්, පුද්ගලයෙකු වැරදිකරුවෙකු ලෙස සැලකුණ ද අධිකරණ නියෝගයකින් හැර එම පුද්ගලයාව මරණයට පත් කිරිමට කිසිදු ඉඩක් නැත. ආත්මාරක්ෂාව මෙහි ව්‍යතිරේඛකයකි. එම විධිවිධානයෙන් අදහස් කරන්නේ අධිකරණයකින් නියෝග කරන්නේ නම් හැර පුද්ගලයෙකුට ජීවත්විමට අයිතියක් ඇති බවයි. මේ අනුව 13(4) වන ව්‍යවස්ථාව පුද්ගලයෙකුට ජීවත්විමට අයිතියක් ඇති බව තහවුරු කරයි."

තවද, <u>**රාණි ප්‍රනාන්දු** එදිරිව. **ස්ථානාධිපති, සීදූව පොලිස් ස්ථානය**</u> (2005) 1 Sri L R 40-45 , <u>**රත්නායක තරංගා ලක්මාලි** එදිරිව. **පො.ප නිරෝෂන් අබේනායක ඇඹිලිපිටිය පොලිස් ස්ථානය හා තවත් අය**</u> (SC FR Application No. 577/2010) සහ **මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා එදිරිව. පොලිස් ස්ථානාධිපති, කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය සහ තවත් අය** (SC FR Application No. 398/2008) යන නඩුවලදී ද මේ පිලිබඳ තහවුරු කර ඇත.

13 (4) වගන්තියේ දක්වා ඇති ව්‍යතිරේඛය වන (ආත්මාරක්ෂාවේ අයිතිය) පොලිස් නිලධාරින් විසින් පසුගිය කාලවකවනුව තුල රටාවක් ලෙස භාවිතා කළ බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ආත්මාරක්ෂාව සම්බන්ධව කටයුතු කිරීමේදි හැකියාව තිබියදි ඒ පිළිබදව නොසලකා හරිමින් කටයුතු කිරිම තුළින් ආත්මාරක්ෂාවේ අයිතිය පාර්ශවයන් ඉල්ලුම් කරන බව මානව හිමිකම් කොමිෂන් සභාව තවදුරටත් අවධානයට ලක් කරයි.

ඒ අනුව උක්ත කරුණු සියල්ල සලකා බැලිමේදි වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම සිද්ධියට අදාළ වින්දිත තැනැත්තාගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හා 13(4) ව්‍යවස්ථාවන් මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව නිගමනය කරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

1. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය උල්ලංඝනය කිරීම පිළිබදව 01 සිට 09 දක්වා වන වගඋත්තරකාර පාර්ශවය සම්බන්ධව විනය පියවර ගැනීමට පොලිස්පති විසින් කටයුතු කළ යුතුය.

2. සැකකරු අත්අඩංගුවට ගෙන රදවා තබාගනු ලබන ක්‍රියාදාමයේදි නිතියේ අනුදක්නා ක්‍රියාපටිපාටිය තහවුරු කිරීම පිණිස අත්අඩංගුවට ගන්නා නිලධාරින්ගේ සිට ඉහළ නිලධාරින් දක්වා නිසි අධික්ෂණ ක්‍රමවේදයක් සකසා චක්‍රලේඛන ආකාරයෙන් සියලු පොලිස් ස්ථානාධිපතිවරුන් හා කොට්ඨාශ භාර නිලධාරින් දැනුවත්කිරීමට කටයුතු කරන ලෙස පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

3. 01, 02, 03, 04, 06, 07, 08 යන වගඋත්තරකරුවන් පෞද්ගලිකව ඉහත කී වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම් කඩ කිරිම සම්බන්ධව ස්වාධීනව වගකිමට යටත් වන අතර, මෙම මෙහෙයුම සඳහා නායකත්වය ලබා දුන් 01 වන වගඋත්තරකරු සහ අදාළ වෙඩි තැබීම සිදු කළ 06 වන වගඋත්තරකරු විසින් රු.25,000/-ක මුදලක් බැගින් ද, 02, 03, 04, 07 සහ 08 යන වගඋත්තරකරුවන් විසින් රු.10,000/- ක මුදලක් බැගින් ද, ශ්‍රී ලංකා පොලිසිය විසින් රු.500,000/-ක මුදලක් ද 2වන පැමිණිලිකාරිය වන වින්දිත තැනැත්තාගේ බිරිඳ සහ වින්දිත තැනැත්තාගේ දියණිය වෙත ලබාදිම කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2024.07.24 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත:-

අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

**<u>නිර්දේශ අංක 02</u>**

| | | | |
|---|---|---|---|
| පැමිණිලිකාරිය | - | 01. | ඊ.ඒ.එන්.එච්.එදිරිසූරිය,<br>අංක - 81, පහලගම,<br>වේවැල්දෙණිය. |
| වින්දිත පාර්ශවය | - | 02. | ඊ.ඒ.ජේ.නතාෂා එදිරිසූරිය,<br>අංක - 81, පහලගම,<br>වේවැල්දෙණිය. |
| වගඋත්තරකරුවන් | - | 01. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලකි රන්දෙණිය මයා,<br>හිටපු අධ්‍යක්ෂ,<br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,<br>කොළඹ 01. |
| | | 02. | චන්දිමා අරුමප්පෙරුම මිය,<br>සහකාර පොලිස් අධිකාරි,<br>අන්තර්ජාල ආවේක්ෂණ හා බුද්ධි ඒකකය,<br>පරිගණක අපරාධ කොට්ඨාශය,<br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,<br>කොළඹ 01. |
| | | 03. | උ.පො.ප එස්.එම්.යූ.සුහසිංහ මයා,<br>ස්ථානාධිපති,<br>අන්තර්ජාල අවේක්ෂණ හා බුද්ධි ඒකකය,<br>පරිගණක අපරාධ කොට්ඨාශය,<br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,<br>කොළඹ 01. |
| | | 04. | පාලක ජනරාල්,<br>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,<br>කොළඹ 01. |

**<u>පැමිණිලි අංක - එච්.ආර්.සි/2603/23, එච්.ආර්.සි/2153/23, එච්.ආර්.සි/2154/23</u>**

**<u>පැමිණිල්ලේ කරුනු දැක්වීම :-</u>**

පැමිණිලිකාරිය කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් කියා සිටිනුයේ, තම සහෝදරිය වන නතාෂා එදිරිසූරිය ප්‍රහාසන වැඩසටහන් ඉදිරිපත් කරන්නියක් බවත් 2023.04.01 දින මොඩාබිමානය 3 - ප්‍රහාසන වැඩසටහනේ එක් අංගයක් ඇය විසින් ඉදිරිපත් කළ බවත්, 2023.05.23 දින එම ඉදිරිපත් කිරීම Colombo Comedy Central යූ ටියුබ් නාලිකාවේ ප්‍රචාරනය කර ඇති බවත්, එම වීඩියෝව තම නැගණියගේ යූ ටියුබ් නාලිකාවේද ඉන් පසු පළ කළ බවත්, එය අන්තර්ජාලීය හා සමාජ මාධ්‍යවල පළ වීමෙන් පසු විවිධ පාර්ශවයන් ඇය පිළිබඳ විවිධ සටහන් තැබූ බවත්, තර්ජන කළ බවත් එමගින් තම

නැගණිය දැඩි මානසික පීඩනයට ලක්වූ බවත් ඉන් මිදීමට 2023.05.27 දින වින්දිත නැගණිය සිය සහකරු සමග සිංගප්පූරුවේ කෙටි නිවාඩුවට යෑමට සැළසුම් කළ බවත්ය.

ඇය 2023.05.27 දින රාත්‍රී 10.30 ට සිංගප්පූරුව බලා පිටත් වීමට කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට ගොස් සිටින විට ආගමන හා විගමන නිලධාරින් විසින් විගමන ස්ථානයේදී ඇයට විදේශගතවීමට ඉඩ නොදී රඳවා තබා අපරාධ පරික්ෂන දෙපාර්තමේන්තුවට භාර දුන් බවත් පසුව 2023.05.28 දින බී25774/2023 යටතේ අධිකරණයට කරුනු ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

<u>වින්දිතගේ කරුණු දැක්වීම : -</u>

තමා මොඩාභිමානය නැමැති ප්‍රහාසන වැඩසටහනක් 01 අප්‍රේල් 2023 පැවැත්වූ බවත් 2023.05.23 දින Clombo Comedy Center විසින්, ඔවුන්ගේ you Tube චැනලයේ එම වැඩසටහන ප්‍රචාරය කළ බවත් එසේම තමාගේ you Tube චැනලයේද එම වැඩසටහන විකාශය කළ බවත් 2023.05.24 දින තමා බුදුදහමට අපහාස කළ බවට දක්වමින් සමාජ මාධ්‍යවල තමාට විරුද්ධව මත පලවූ බවත්

2023.05.26 දින Colombo Comedy Center හා තමා විසින් පොදු සමාව ගැනීමක් සිදුකර එම විඩියෝව ඉවත් කළ බවත් තමාට සමාජ මාධ්‍යවල එල්ල වූ විරෝධතා හේතුවෙන් මානසික පිඩාවට පත්වූ බවත් එය මගහැරිමට ටික දිනක් විදේශගත වීමට තිරණය කර 2023.05.27 දින විදේශ ගතවීමට බණ්ඩාරනායක ගුවන් තොටුපලට පැමිණි බවත් 2023.05.27 වන දින බණ්ඩාරනායක ගුවන් තොටුපලේදි ආගමන හා විගමන දෙපාර්තමේන්තු නිලධාරි තමා රඳවා ගත් බවත් එහිදි තමාට ගමන් තහනමක් ඇති බව දැක්වූ නමුත් කිසිදු ලේඛනයක් ඉදිරිපත් නොකල බවත් වැඩිදුරටත් විමසා බැලිමේදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමා රඳවා ගැනීමට ඉල්ලිම් කළ බවත් එයට හේතුව කුමක්ද යන්න ඔවුන් නොදැන සිටි බව දැක්වූ බවත්

පසුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් පැමිණ 2023.05.27 දින ප.ව 11.10 ට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට ගෙන ගිය බවත් බන්ඩාරනායක ගුවන් තොටුපලේදි තමාගේ අත්අඩංගුවට ගැනීම ආවරණය කිරීම සඳහා මාධ්‍ය පැමිණ සිටි බව තමා දැනුවත් වූ බව දක්වා ඇත. 2023.05.28 දින නීතිඥවරයෙකු හෝ ඥාතින් හමුවීමට ප්‍රවේශයක් නොදුන් බවත් පසුව තමාගේ සහකරු හමුවීමට අවස්ථාව ලබාදුන් බවත් 2023.05.28 දින නැවත තමාගේ නිවස වෙත විමර්ශනය සඳහා ගෙන ගොස් තමා විසින් රචිත විහිලු පොත් කිහිපයක් අත්අඩංගුවට ගත් බවත් පසුව එහිදිද මාධ්‍ය පැමිණ සිටි බවත් 2023.05.28 වන දින තමා මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කර රිමාන්ඩ් භාරයට පත් කළ බවත් පසුව 2023.07.05 දින දක්වා රක්ෂිත බණ්ධනාගාර ගතව සිටි බවත් මෙම අනිතිකව අත්අඩංගුවට ගැනීම නිසා තමා අගතියට පත් වූ බවත් තමාගේ මූලික අයිතිවාසිකම් මේ හේතුවෙන් උල්ලංඝනය වූ බවත් වැඩිදුරටත් දක්වා සිටියි.

<u>01, 02, 03 වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-</u>

2023.04.01දින මොඩාබිමානය නමින් කොළඹ බිශොප් විද්‍යාලීය ශ්‍රවනාගාරය තුල පැවත්වූ වැඩසටහනේදී බෞද්ධ ආගමට විරුද්ධව ද්වේශ සහගතව සහ වෛරී ප්‍රකාශ සිදු කරමින් ආගම්, සහජීවනයට හා සංහිදියාවට බාධා කරමින් සිදුකල ප්‍රකාශයක් වීඩියෝ ගත කර නැවත 2023.05.24 වන දින හෝ ඊට ආසන්න වන දිනකදී අන්තර්ජාලය ඔස්සේ සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරණය කිරීම තුලින්, එම ආගමීක දර්ශනය අදහන හා පිළිගැනීමට ලක්කරගන්නන් අතර, අසන්තෝෂයක්, අපැහැදීමක්, අසංගතියක් ඇතිවන බව සඳහන් කරමින් සඳහම් සිසිල බෞද්ධ මධ්‍යස්ථානය, ලිපිනයේ පදිංචි පූජ්‍ය අත්තරගම පංඤ්ඤාලංකාර ස්වාමින් වහන්සේ විසින් 2023.05.27වන දින පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත සිදුකල ලිඛිත පැමිණිල්ලක් සහ බෞද්ධාගමික ස්වාමින් වහන්සේලා කිහිප

නමකගේ හා බෞද්ධ කටයුතු කොමසාරිස් මහින්ද ලැබී ඇති පැමිණිලි 07ක් සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයක් බවත්

පැමිණිලිකාර පූජ්‍ය අත්තරගම පංඥාලංකාර ස්වාමින් වහන්සේගේ ප්‍රකාශයක් 2023.05.27 දින සටහන් කරන ලද බවත් එම පැමිණිල්ල මඟින්, බුදුරජුන් වහන්සේට හා බෞද්ධාගමට නිගාවන පරිදි ආගමික සංහිඳියාවට බලපෑම් කරමින් අපහාසාත්මක, ද්වේශ සහගත සහ වෛරී සහගත ප්‍රකාශ ඇතුළත් වන ලෙසට වීඩියෝපටයක් COLOMBO COMEDY CENTRAL යන You tube නාලිකාවක් මඟින් අන්තර්ජාලය හරහා ප්‍රචාරය කර ඇති බවත්, එය නතාෂා එදිරිසූරිය නැමති කාන්තාවක් විසින් ඉදිරිපත් කර ඇති බවත් එහි ඇය මෝඩාභිමානය නමින් පසුබිම් දර්ශනයක් සහිතව මෙම වීඩියෝව ප්‍රචාරණය කර ඇති බව දක්වා ඇත.

තවද මෙම තැනැත්තිය විසින් බුදු දහමේ සම්ප්‍රදායන්ට නිග්‍රහ කරමින් බෞද්ධයන්ගේ සිත් රිදවන ආකාරයේ ඉදිරිපත් කිරීමක් සිදුකරන බවත් එලෙස බෞද්ධ, කතෝලික මුස්ලිම් ආගම් නායකතුමන්ලාට හා එම ආගම් භක්තිකයන්ට සිත් රිදවන ආකාරයේ ප්‍රකාශයක් කිරීමට කිසිවෙකුට අයිතියක් නොමැති බවටත් සියළු ආගම් සමඟ සංහින්දියාවෙන් කටයුතු කලයුතු බවටත් පවු හැඟීම් සහිත ප්‍රකාශ තුළින් රටේ ආගමික කොටස් අතර ක්‍රෝධය වෛරය ඇවිලි මහජන සාමයට බාධාවක් මතු වීමට හැකියාවක් පවතින බවටත් බෞද්ධ ආගමේ ශාස්තෘවරයා ඉතා අවඥා ලෙසට හැල්ලුවට ලක් කර ඇති බවත් බෞද්ධ ආගම හා සම්බන්ධ ආගම් ඉතා නින්දිත ලෙස හැල්ලුවට ලක් කර එත් බවත් බෞද්ධ ආගමේ සම්ප්‍රදායන්ද ඉතා පහත් ආකාරයෙන් හැල්ලුවට ලක් කළ බවටත් පැමිණිලි මගින් දක්වා ඇති බවත්

ඒ අනුව මෙම සිදුවීමට අදාල තොරතුරු සම්බන්ධයෙන් අන්තර්ජාල ආවේක්ෂණක් සිදු කරන ලද බවත් විමර්ශනයේදී,මෙම වීඩියෝපටය **<u>Colombo comedy central</u>**සහ**<u>Nathasha Edirisooriya</u>** යන **youtube** නාලිකා ඔස්සේ විවිධ සමාජ මාධ්‍ය වෙබ් අඩවි ඔස්සේ ප්‍රචාරය වන බවට කරුණු අනාවරණය කරගන්නා ලදී. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සිදුකරන ලද විමර්ශනයේදී මෙය මොඩාභිමානය නැමැති වැඩසටහනක් නතාෂා එදිරිසූරිය නැමැති අයෙකු විසින් ප්‍රේෂකාගාරයක් ඉදිරියේ සිදු කරන ලද වැඩසටහනක් බවට කරුණු අනාවරණය විය. තවද එමගින් **" අර සුද්ධොදනගේ ළමයා ඒ ළමයා ඉපදුනු දවසෙම ඇවිදලා........ ඒකට මේ ගොල්ලෝ තවම කෙළින් කරලා වඩාගත්තම බෙල්ල කඩන් වැටෙනවා........ අර සුද්ධෝදනගේ පොඩි එකා ඉපදුනු දවසේම කවියක් කියලා ඒකට මුන්...... සුද්ධෝදනගේ කොලුපැටියා ඉපදුනු දවසේ කියලා නෑ, දැම්මම තීරණය කරලා තියෙන්නේ එයා ලොකුවෙලා මොනවද කරන්නේ කියලා........** යනාදී වශයෙන් අදහස් ඉදිරිපත් කර ඇති බවත් ආන්දෝලාත්මක ප්‍රකාශය බුදුන්වහන්සේගේ ළමා කාලය හා බෞද්ධ ඉතිහාසයද ඒ හා සම්බන්ධිත බෞද්ධ දර්ශයේ ඉගැන්වෙන බෞද්ධයන් විසින් අදහනු ලබන පිළිගැනීමට ලක්කර ඇති තත්ත්වයන් සැහැල්ලුවට ලක්කරමින් එය නිගාවන ආකාරයෙක් හා එමගින් එම දර්ශනය හා පිළිගැනීමට ලක්කරන්නන් අසන්තෝෂයක්, අපැහැදීමක්, අසංගතියන්, නොසන්සුන්තාවයක්, එදිරිවාදීකමක් හෝ ඒ සඳහා වන පෙළඹවීමක් ඇති වන ආකාරයෙන් ක්‍රියාකර ඇති බවට කරුණු අනාවරණය වු බවත්,

ඒ අනුව මෙම ඉදිරිපත් කිරීම සිදුකරන ලද නතාෂා එදිරිසූරිය යන අය විසින් පවත්වාගෙන යනු ලබන, ඇයගේ යූටියුබ් චැනලය තුල මෙම ප්‍රශ්නගත ඉදිරිපත් කිරීමට අදාළ පටිගත කරන ලද විඩියෝව ප්‍රචාරය කර ඇති බවට අනාවරණය කරගත් බවත් අනතුරුව විවිධ සමාජ මාධ්‍ය හරහා එය ඉතා සීග්‍රයෙන් ප්‍රචාරය වී ඇති බවටද වැඩිදුරටත් කරුණු අනාවරණය කර ගන්නා ලද බවත් දක්වා ඇත.

මේ අතරතුර නතාෂා එදිරිසූරිය යන අයගේ ප්‍රකාශයට විරුද්ධත්වය දක්වමින් හා ඒ සම්බන්ධයෙන් විවිධ පාර්ශව විසින් පොලිස්පති තුමා වෙත හා පොලිස් මූලස්ථානය වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රවෘත්ති විද්‍යුත් හා සමාජ මාධ්‍ය තුල පලවීම හා මහජනතාවගේ විරෝධී දැක්වීම් සම්බන්ධ බවද වීඩියෝ දර්ශන ප්‍රවෘත්ති වැඩසටහනක් හරහා ප්‍රචාරය වීම සිදුවන ලදී. එම තත්ත්වය අනුව

මෙම ප්‍රශ්නගත ඉදිරිපත් කිරීම සිදුකල එදිරිසූරිය ආරච්චිගේ ජයනි නතාෂා එදිරිසූරිය යන තැනත්තිය විසින් තමා විසින් සිදුකරන ලද ප්‍රකාශය සඳහා සමාව ඉල්ලා කළ වීඩියෝ දර්ශණයක් මෙම නාලිකාව තුළින් උඩුගත කර ඇති අතර ඒ සම්බන්ධයෙන්ද සමාජ තුල විරෝධතා එල්ල වූ බව නිරීක්ෂණය වූ බවත්,

පවතින එම තත්ත්වය තුල සිදුකරන ලද විමර්ශන අතරතුරදී මෙම තැනත්තිය විදේශ ගතවීමට සූදානම් වන බවට තොරතුරු අනාවරණය වූ බවත් ඇය විදේශ ගත වුවහොත් විමර්ශනයට බාධාවක් සිදුවන බැවින්, ඒ පිළිබදව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ කටුනායක ගුවන්තොටුපල ඒකකය දැනුවත් කිරීම මත එදිනම එනම් 2023.05.27 ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නතාෂා එදිරිසූරිය සිංගප්පූරුව බලා පිටත්වීමට පැමිණි අවස්ථාවේදී නතර කර පසුව පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් විසින් කටුණායක බණ්ඩාරනායක ගුවන්තොටුපලේදී, ආගමික හැගීම් වලට රිදවීම් වාර්ගික හෝ ආගමික වෛරය ඇතිවන ආකරයට බෞද්ධ ආගමික ශාස්තෲවරුන්ට අපහාස සිදුවන ආකරයේ අදහස් දැක්වීම සිදුකිරීම සම්බන්ධ වරද කියාදී,අත්අඩංගුවට ගන්නා ලද බවත් පසුව මෙම සැකකාරිය කොටුව මහේස්ත්‍රාත් අධිකරනයට නඩු අංක බී 25774/23 යටතේ ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 120,291 (අ) 291(ආ), 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනතේ 6 වන වගන්තිය හා 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ජාත්‍යන්තර සම්මුති පනතේ 3 වන වගන්තියට අදාළව 2023.05.28 දින ඉදිරිපත් කරන ලද බවත් එහිදි මහේස්ත්‍රාත්වරයා විසින් ඉදිරිපත් කළ කරුණු සලකා සැකකාරිය 2023.06.07 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද බවත් වැඩිදුරටත් දක්වා ඇත.

එසේම තවදුරටත් දක්වා සිටිනුයේ මෙම මතබේදාත්මක, ප්‍රශ්න සහගත ආන්දෝලනාත්මක ස්වරූපයේ ඉදිරිපත් කිරීම මඟින් ආගමික වෛරය සඳහා පෙළඹවීම හා එමඟින් එදිරිවාදිකම් හෝ ප්‍රචන්ඩත්වය ඇතිකිරීම සම්බන්ධව වන තත්ත්වයක් නිර්මාණය වීම හේතුවෙන්, එය 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 03(01)වගන්තිය මඟින් සඳහන්කර ඇති ආකාරයේ වරදක් මෙම පළමු සැකකාරිය විසින් සිදුකරන ලද බව විමර්ශණයේදී අනාවරණය කරගන්නා ලද බවත් එහිදි විශේෂයෙන්ම ආගමකට නින්දා වන ආකරයේ ප්‍රකාශනයක් මඟින් ආගමික වෛරය සඳහා පෙළඹවීමක් ඇතිවී එමඟින් ආගමික කණ්ඩායම් අතර එදිරිවාදිකම් ඇතිවීමට හා ප්‍රචන්ඩකාරි ක්‍රියා ඇතිවීමට ඉඩප්‍රස්ථාව මනාව නිර්මාණය කර තිබූ බවද තවදුරටත් දක්වන බවත් එසේම තවදුරටත් ඉහත සඳහන් කරන ලද ආකාරයේ එදිරිවාදිකම් හෝ ප්‍රචන්ඩකාරි ක්‍රියා මෙම සිද්ධියට අදාලව ගත්කල, බෞද්ධ දර්ශනය සම්බන්ධව විවිධ මත දරණ කණ්ඩායම් අතරවූ ප්‍රචන්ඩත්වයක් ඇතිවීමේ ප්‍රවණතාවයක් මෙම
ප්‍රශ්න සහගත ඉදිරිපත් කිරීමෙන් උද්ගතවී තිබූ බවත් ඊට අමතරව, මෙම තත්ත්වය කිසිසෙත් පටු ලෙස සැලකිය නොහැකි බවත් මෙවැනි ආකාරයේ වූ ආන්දෝලාත්මක තත්ත්වයක් හේතුවෙන් අකුරණ ප්‍රදේශයේ ඇතිවූ නොසන්සුන් හා කැලඹිලි සහගත තත්ත්වයන් කෙරෙහි අවධානය යොමුකරමින් මෙම ප්‍රකාශය සමාජ මාධ්‍ය තුල දැක්වූ අදහස් මගින්ද එවැනි තත්ත්වයක් උද්ගත වීමට ඇති ඉඩකඩ හේතුවෙන් මේ සම්බන්ධව කඩිනමින් විමර්ශන පවත්වා සැකකකරුවෙන් අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කර අධිකරණ මය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල බවත් දක්වා ඇත.

<u>**04** වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-</u>

එදිරිසූරිය ආරච්චිගේ ජයනි නාතාෂා එදිරිසූරිය යන තැනැත්තියක් විදේශගතවීමට පැමිණියහොත් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2023.05.27 දින දහවල් 12.44 ට 04 වන වගඋත්තරකරු වෙත නියෝගයක් ලබාදුන් බවත්

ඒ අනුව ඉහත නම සඳහන් මගියා 2023.05.27 දින MHO 0178 දරණ ගුවන් යානයෙන් ගුවන් ගතවිම සඳහා විගමන පර්යන්තයට පැමිණ, විගමන පර්යන්තයේ රාජකාරියෙහි නියුතු බලයලත් නිලධාරි වෙත විගමන නිශ්කාශනය සඳහා ඇයගේ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ බවත් එම අවස්ථාවේ ඉහත

සඳහන් නිලධාරියාගේ පරිගණක තිරයේ ඇයගේ විදේශ ගමන් බලපත්‍රය සම්බන්ධයෙන් පණිවිඩයක් දර්ශනය වීම මත (Alert Messge) අදාළ මගියා එම අවස්ථාවේදී රාජකාරියෙහි නියුතු ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි වෙත

ඉදිරිපත් කර ඇත. නාතාෂා එදිරිසූරිය යන අය ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි වෙතින් අධිකරණ නියෝගයක් නොමැතිව තමන්ගේ විදේශගතවීම වැලැක්වීමට හැකියාවක් පවතින්නේද යන්න විමසූ බවත්,

ඒ අනුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇති ඉල්ලීම පිළිබඳව ඇයට දැනුම්දී ඇති අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීමට අනුව එම අවස්ථාවේ ඇයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් වෙත යොමු කිරීමක් පමණක් සිදුකල බවත් තවදුරටත් ඇයව දැනුවත් කරන ඇති බවත්ය.

විගමන කවුළුව වෙත ඇය වාර්තා කිරීමෙන් පසු ඉතා කෙටි කාලයක් තුළ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් එහි පැමිණ ඔවුන්ගේ විමර්ශන සඳහා ඇය ඔවුන්ගේ භාරයට රැගෙන ඇති බවත් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ උදය කුමාර නිලධාරියා විසින් නාතාෂා එදිරිසූරිය 2023.05.27 පැය 23.00 පැයට භාරගත් බවට බලයලත් නිලධාරි විසින් ලොග් සටහන් තබා ඇති බව වැඩිදුරටත් දක්වා ඇත.

**පරීක්ෂණ සඳහා කැඳවීම් කිරීම් :-**

2023.11.21, 2023.12.19, 2024.03.13, 2024.04.05, 2024.04.24, 2024.05.15, 2024.06.11 ඉහත දිනයන්හිදි පර්ශවයන් කැඳවා මානව හිමිකම් කොමිෂන් සභාව පරීක්ෂණ පවත්වා ඇත.

**විමර්ශන :-**

පැමිණිල්ල මගින් දක්වා සිටිනුයේ තමා නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවත් තමාට නීතියේ රැකවරණය සර්වසාධාරණත්වය නොලැබුනු බවත් හා තමාගේ ප්‍රකාශනයේ නිදහස අහිමි කිරිම පිළිබඳවත්ය. ඒ අනුව අත්අඩංගුවට ගැනීම නීතියේ දක්වා ඇති කාර්යය පටිපාටිය අනුව සිදුනොකළ බව දක්වන කරුනු පිළිබඳ අවධානය යොමු කිරීමේදි,

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව පුද්ගලික නිදහස හා අපරාධ කාර්යය පටිපාටිය සම්බන්ධව අයිතීන් ප්‍රකාශ කරයි. එහි දැක්වෙන පරිදි නීතියෙන් නියම කල කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගත නොහැකි අතර, සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැක්විය යුත්තේය යන්න දන්වා ඇත. ඒ තුලින් අත්තනෝමතිකව සිරභාරයට ගැනීම වලක්වා එම අයිතිය තහවුරු කරන අතර එය නියමිත ප්‍රතිපාදන මත සිදුවිය යුතු බවට විෂය පථය සකසයි. මේ සඳහා ආරක්ෂණ රාමුවක් පිහිටුවා ඇත්තේ හදිසි හා හිතුමනාප ලෙස නීති ක්‍රියාත්මක කිරීම වැලැක්වීමට සහ තනි වාසි සහ දේශපාලනික පරමාර්ථ සඳහා නෛතික කාර්යය පටිපාටිය අනිසි ලෙස භාවිතා කිරීම වැලැක්වීමට වේ.

මෙම සිදුවීමට අදාළව පැමිණිලිකාර පාර්ශවය හා වින්දිත දක්වා සිටිනුයේ 2023.05.27 දින තමා සිංගප්පූරුව බලා යැමට පැමිණි අවස්ථාවේ ආගමනය විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තමන් එහි රඳවා තබාගත් බවත් පසුව අපරාධ පරීක්ෂණ නිලධාරින් පැමිණ තමාව රැගෙන ගිය බවත් එහිදි අත්අඩංගුවට ගැනීමට හේතුව දැනුම් නොදුන් බවයි.

01, 02. 03 වගඋත්තරකරුවන් ප්‍රකාශ කරනුයේ, අන්තර්ජාලය හරහා බෞද්ධ ආගමට විරුද්ධව ද්වේශයක් හා වෛරී ප්‍රකාශන සිදුකරමින් ආගමික සහජීවනයට හා සංහිදියාවට බාධා කරමින් ප්‍රකාශ

නිකුත් කිරීම සම්බන්ධව වින්දිතට එරෙහිව පැමිණිලි ලැබුනු බවත් ඒ පිළිබඳව විමර්ශනය කරමින් සිටියදි වින්දිත පාර්ශවය විදේශ ගත වීමට සුදානම් වන බවට ලද තොරතුරු අනාවරණය වූ බවත්, ඇය විදේශ ගත වුවහොත් විමර්ශන වලට බාධාවක් සිදුවන බැවින් 2023.05.27 දින සිංගප්පූරුව බලා පිටත්වීමට පැමිණි අවස්ථාවේදිම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කටුනායක ගුවන් තොටුපල ඒකකයේ නිලධාරින් විසින් වින්දිතට
ආගමික ශාන්තුවරයන්ට අපහාස සිදුවන ආකාරයට කරුණු දැක්විම සිදුකිරීම සම්බන්ධ වරද කියා දි අත්අඩංගුවට ගත් බවයි.

ඒ අනුව මෙම වින්දිත පාර්ශවය බණ්ඩාරනායක ගුවන් තොටුපලේදී රඳවා තබා ගැනීම පිලිබඳ අවධානය යොමු කිරීමේදී, 1, 2, 3 වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ මේ පිළිබඳ විමර්ශනය කරමින් පවතින අතරතුර, මෙම තැනැත්තිය විදේශගතවීමට සුදානම් බවට තොරතුරු ලද බවත් ඇය විදේශගත වුවහොත් විමර්ශනයට බාධා වන බැවින් 01 හා 02 වගඋත්තරකරුවන් විසින් වින්දිත පාර්ශවය ගුවන් ගත වුවහොත් රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස 03 වන වගඋත්තරකරුට උපදෙස් ලබා දුන් බවත් ඒ අනුව එම අනුමැතිය මත ගමන වැලැක්වීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවට ලිඛිතව දැන්වූ බවත් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකාරියගේ ගමන වැලැක්වීම සඳහා 01 වන වගඋත්තරකරුගේ අත්සනින් යුක්තව 04 වන වගඋත්තරකාර පාර්ශවය වෙත යොමු කල ලේඛනය කෙරේ අවධානය යොමු කිරීමේදී
Restriction If Restriction /If Revocation further action to be taken. යන කරුණට අදාළව
"Until we get court order, if she try to go abroad, please arrest her and produced to computer crime Investigation unite" ලෙස දක්වා ඇත.

ඒ අනුව එම ලේඛනය 01 වන වගඋත්තරකරු විසින් අත්සන් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙලෙස ගමන් වැලැක්වීම පිළිබඳ කටයුතු කිරීම කුමන නීති පටිපාටිය ඔස්සේ සිදුවන්නේ දැයි සිදුකළ විමසීමට අනුව 01 වන වගඋත්තරකාර පාර්ශවය මානව හිමිකම් කොමිෂන් සභාවට දක්වා සිටියේ ගමන් වැලැක්වීම් සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් කිසිඳු ලිඛිත මාර්ගෝපදේශන ලබා දී නොමැති නමුත් සාමාන්‍යයෙන් පොලිස් සැකකරුවෙකු
ගුවන් ගතවීමේදී එය වැලැක්වීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගන්නා බවත්, අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව, වගකිව යුතු අපරාධමය වරදක් සඳහා අවශ්‍ය කරන සැකකරුවෙකු ගුවන් ගතවීමේදී එය වැලැක්වීම සඳහා ගනු ලබන මෙම ක්‍රියාව සාමාන්‍ය ක්‍රමවේදය බවයි.

ඒ අනුව කිසිඳු විනිවිදභාවයකින් හා මාර්ගෝපදේශයක් නොමැති ක්‍රමවේදයක් තුලින් පැමිණිලිකාරියගේ ගමන නතර කර අත්අඩංගුවට ගැනීම කරන ලෙස 04 වන වගඋත්තරකාර පාර්ශවයට 01 වගඋත්තරකාර පාර්ශවය සන්නිවේදනය කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

මෙහිදි 01 වන වගඋත්තරකාර පාර්ශවයට අනුව, එවැනි නවතා ලීමක් සිදුකරනුයේ වගකිව යුතුමය අපරාධමය වරදක් සඳහාය. මෙහිදි පැමිණිලිකාරිය නවතා ලීම කලේ ඇය විදේශගත වුවහොත් මහජන කැලඹීමක් ඇතිවිය හැකි බව හා විමර්ශනයට බාධා ඇතිවන නිසා බව වගඋත්තරකාර පාර්ශවය මානව හිමිකම් කොමිෂන් සභාවේදි දක්වා ඇත. ඒ අනුව එවැනි සාධාරණ නොවන පූර්ව උපකල්පනයක් මත යමෙකුගේ ගමන බිමන සිමා කිරිමට හැකියාවක් නීතිය මගින් ඉඩසලසා නොමැති බව කොමිෂන් සභාවට පෙනී යයි.

<u>නවසිවායම් එ ගුණවර්ධන</u> නඩුවේදී ශර්වානන්ද විනිසුරුතුමා හා අතුකෝරාල විනිසුරුතුමා හා H.A.G. ඩි සිල්වා විනිසුරුතුමා එකඟ වී දක්වා ඇත්තේ පොලිස් නිලධාරියා පැමිණිලිකරුට සොරකමක් පිලිබඳ ප්‍රශ්න කිරීම සඳහා පොලිස් ස්ථානයට යාමට දන්වා පොලිස් ස්ථානයේදී ප්‍රකාශ සටහන් කර නිදහස් කිරීම කර

තිබුනද එහිදී ඔහුගේ රථයේ සහ ගමන නවතා පැමිණිලිකරු පොලිස් නිලධාරි සමඟ පොලිස් ස්ථානයට ගෙන යාම තුලින්ම ඔහු යාමට අදහස් කල ස්ථානයට යාමට නොදී ඔහුගේ නිදහස අහිමි කර ඇති බවත් එය නීතිවිරෝධි අත්අඩංගුවට ගැනීමක් බව තීරණය කර ඇත.

මෙම නීතිමය තත්ත්වය හා සිද්ධිමය කරුණු අනුව 01, 02, 03 වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත පාර්ශවය සම්බන්ධව නීතියේ දක්වා ඇති කාර්යය පටිපාටියට පරිබාහිරින් ක්‍රියාකර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

තවද 13(1) ව්‍යවස්ථාව අනුව කිසිම තැනැත්තකු නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව හැර අත්අඩංගුවට නොගතයුතු බව දක්වා ඇත. <u>කපුගි කියනගේ එදිරිව හෙට්ටිආරච්චි හා තවත් දෙදෙනෙකු (1984) 2 SLR 153</u> තීරණයේදී නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය යනු 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය මගින් නියම කෙරෙන කාර්යය පටිපාටිය හැර අන් කිසිවක් නොවේ යන්න තීරණය විය. ඒ අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ 32(1) වගන්තිය තුල යම් පුද්ගලයෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් සාධාරණ සැකයක් මත යමෙකු අත්අඩංගුවට ගත හැකි නමුත් ඒ සඳහා පදනම් වූ කරුණු තිබිය යුතුය.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීමේදී, ලද පැමිණිලිවලට අනුව විමර්ශනය කල බවත් අපරාධමය වරදක් කර ඇති බවට ප්‍රමාණවත් තොරතුරු ඇති බවට දැනුවත් වීම මත සැකකාරිය අත්අඩංගුවට ගෙන විමර්ශන කිරීම කල බව 01 වන වගඋත්තර පාර්ශවය හා 02, 03 වගඋත්තර පාර්ශවය පිළිගෙන ඇත.

එසේම වගඋත්තර පාර්ශවය වෙත ලද පැමිණිලි වන අන්තර්ජාලය හරහා බෞද්ධ ආගමට විරුද්ධව ද්වේශ සහගතවූ සහ වෛරී ප්‍රකාශ සිදු කරමින් ආගමික සහජීවනයට හා සංහිඳියාවට බාධා කරමින් ප්‍රකාශ නිකුත් කිරීම පිළිබඳ ලද පැමිණිලිවලට අදාළව යටතේ විමර්ශනය කල බව 1,2,3 වගඋත්තර පාර්ශවය පිළිගෙන ඇත.

වගඋත්තරකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ වින්දිත තැනැත්තියගේ එම ආන්දෝලාත්මක ප්‍රකාශය බුදුන්වහන්සේගේ ළමා කාලය හා බෞද්ධ ඉතිහාසයද ඒ හා සම්බන්ධිත බෞද්ධ දර්ශනයේ ඉගැන්වෙන බෞද්ධයන් විසින් අදහනු ලබන පිළිගැනීමට ලක්කර ඇති තත්ත්වයන් සැහැල්ලුවට ලක්කරමින් එය නිගාවන ආකාරයෙක් හා එමගින් එම දර්ශනය හා පිළිගැනීමට ලක්කරන්නන් අසන්තෝෂයක්, අපැහැදීමක්, අසංතතියක්, නොසන්සුන්තාවයක්, එදිරිවාදීකමක් හෝ ඒ සඳහා වන පෙළඹවීමක් ඇති වන ආකාරයෙන් ක්‍රියාකර ඇති බවට කරුණු අනාවරණය වූ බවත්, ඒ අනුව අත්අඩංගුවට ගැනීම සිදුකළ බවත්ය.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවයට අදාළව 2023.05.27 දින ලද ලිඛිත පැමිණිලි කෙරේ අවධානය යොමු කිරීමේදි එම පැමිණිල්ල 2023.05.27 දින 9.30 ට සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවයේ විමර්ශන උධෘත කෙරේ අවධානය යොමු කිරීමේදි 2023.05.27 පෙ.ව 10.30 ට ඒ සඳහා අන්තර්ජාල ආවේක්ෂණය ආරම්භ කළ බවත් පෙ.ව 10.40 ට තවදුරටත් සාක්ෂි එක් රැස් කිරීමට උපදෙස් ලබාදී ප්‍රකාශය කළ තැනැත්තිය, පිළිබඳ ආවේක්ෂණ කටයුතු කළ බවට 03 වන වගඋත්තරකරු සටහන් යොදා ඇත.

තවද 2023.05.27 පැය 14.00, 2024.05.27 දින මෙම තැනැත්තියගේ වෙනත් වැඩසටහන් පැවැත්වෙන බවට ලද තොරතුර මත ඒ පිළිබඳ පරීක්ෂා කිරීමට නිලධාරින් යොමුකළ බවට සටහන් යොදා ඇත.

2023.05.27 පැය 16.00 ට යෙදූ සටහන අනුව “ඉහත සඳහන් කළ වැඩසටහන නොපැවැත්වෙන බව පුද්ගලික ඔත්තුකරු සිදුකළ දැනුම්දීම හේතුවෙන් අධ්‍යක්ෂ දැනුවත් කර ඔහුගේ උපදෙස් මත මෙම

තැනැත්තිය රටින් පලායාමට පෙර ඇය රඳවා ගන්නා ලෙස බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පරිශ්‍රයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ඒකකය වෙත දුරකථන පණිවිඩයක් යොමුකරන ලදි" ලෙස දක්වා ඇත.

04 වන වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ 2023.05.27 දින පෙ.ව 12.44 ට වින්දිත තැනැත්තිය රඳවා ගන්නා ලෙස දැන්වූ ලේඛනය ලැබුනු බවයි. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවයේ විමර්ශන සටහන් අනුව විමර්ශනය කිරීමට ප්‍රථම පැමිණිල්ල ලද වාහාම ආගමන විගමන දෙපාර්තමේන්තුවට එම රඳවා ගැනීම සිදුකරන ලෙස දැක්වෙන ලේඛන යොමුකර ඇති බව වේලාවන් කෙරෙහි අවධානය යොමු කිරීමේදි නිරීක්ෂණය වේ.

ඒ අනුව නිසි විමර්ශනයකින් තොරව පැමිණිල්ල ලද වහාම රඳවා තබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බව අවධානයට ලක්වේ.

වින්දිත අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව නිකුත් කල අත්අඩංගුවට ගත් පුද්ගලයින් සම්බන්ධ ලදුපත A 979117 පිලිබඳ අවධානය යොමු කිරීමේදී අත්අඩංගුවට ගැනීමට හේතුව ලෙස දක්වා ඇත්තේ, ජාතික වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පුරවැසියන් පොලඹවන පරිදි ප්‍රකාශ සිදු කිරීම බව නිරීක්ෂණය වේ.

තවද වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීම 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතේ 3 වගන්තිය යටතේ හා ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 120, 291 (අ) 291(ආ) හා 2007 අංක දරණ පරිගණක අපරාධ පනතේ 06 වගන්තිය ප්‍රකාරව වරදවල් සඳහා අත්අඩංගුවට ගත් බවට අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව B වාර්තාව අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව වින්දිත ICCPR පනතේ 3(1) වගන්තියට යටතේ වරදක් කර ඇති බව සඳහන් වන අතර, 2007 අංක 56 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳව ජාත්‍යන්තර සම්මුති පනතේ 3(1) වගන්තියෙහි මෙසේ දැක්වේ.

"කිසිම තැනැත්තේකු විසින් යුද්ධය පැතිරවීම හෝ වෙනස් එදිරිවාදිකම් වලට හෝ ලෙස සැලකීමට ප්‍රචන්ඩත්වය ක්‍රියාවලට පෙලඹවීම සඳහා ජාතික වාර්ගික හෝ ආගමික වෛරය " සිදු නොකල යුතුය. මෙම පනතේ 03 වන වගන්තිය අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ සම්මුතියේ 20 වන වගන්තියේ දෙවන උප වගන්තියට සමාන වන අතර එය අර්ථ දැක්විය යුත්තේ අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ 19 වන වගන්තිය හා සමඟ බව පිලිගත් කරුණකි. එනම් භාෂනයේ හා ප්‍රකාශනයේ නිදහස තුල මෙය අර්ථ දැක්විය යුතු බවට නීතිය පිළිගෙන ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මීට පෙර අවස්ථාවක 2007අංක 56 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනතේ 3 වැනි වගන්තියේ විෂය පථය පිළිබඳ නෛතික විශ්ලේෂණයක් ප්‍රකාශයට පත් කරමින් වෙනස් කොට සැලකිම සතුරුකම් හෝ චේතනාන්විත ප්‍රචන්ඩත්වය සඳහා උසිගැන්විම නොවන්නේ නම් වෛරය සඳහා උපදේශනය 3 වන වගන්තිය තුළට නොගත යුතු බව දක්වා ඇත.

අ) ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටිම සහ

ආ) වෙනස් කොට සැලකීම, සතුරුකම් හෝ ප්‍රචන්ඩත්වය උසිගැන්වීම යන මූලික අංග දෙක ICCPR පනතේ 3(1) වගන්තිය යටතේ වරදක් බවට පත් කිරිම සඳහා අනිවාර්යයෙන් තිබිය යුතු බව දක්වා ඇත.

එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කරන ලද රබාත් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර ඇති පරිදි, කොටස් හයක එළිපත්ත පරීක්ෂණය මෙහිදී සලකා බැලිය යුතුය. අදාළ සම්මුතියේ 20 වැනි වගන්තිය අනුව කරන ලද ප්‍රකාශයන් ද්වේශ සහගත ප්‍රකාශයක් වේ දැයි සොයා බැලීමේදී අවධානය යොමුකළ යුත්තේ අ) සන්දර්භය (Context), ආ) කථිකයා (Speaker), ඇ) චේතනාව Intention of Speaker), ඈ) ප්‍රකාශනයේ අන්තර්ගතය හා ස්වාභාවය (Content) , ඉ) උපදේශනයේ ප්‍රමාණය (Extent and Magnitude of the expression ඊ) ආසන්න හානිය (Imminent harm)

මෙහිදී එම අංග 06 පහත පරිදි සලකා බැලිය යුතුය.

I. සන්දර්භය - පැතිරවීම සිදුවන අවස්ථාවේ පැවැති දේශපාලන සහ සමාජ සන්දර්භය (උදාහරණයක් ලෙස ගැටුම්කාරී වාතාවරණයක් පවතීද යන්න, ගැටුම්කාරී ඉතිහාසයක් තිබේද එසේත් නැතිනම් වෙනස් ලෙස සැලකීමේ දිර්ඝ කාලීන ප්‍රවනතාවයක් තිබේද යන්නයි)

II කථිකයා - වෛරය පතුරවන පුද්ගලයාට තම අසන්නන් කෙරේ බලපෑමක් ඇති කිරීමට බලයක් තිබේද යන්න (උදාහරණයක් ලෙස ප්‍රමුඛ මහජන චරිතයක්, රාජ්‍ය නිලධාරියෙකු හෝ සමාන තත්ත්වයක් තිබිම, ආගමික නායකයෙකු හෝ ප්‍රේක්ෂකයින් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි තැනැත්තකු වීම)

බලපෑමක් කිරීමට බලයක් තිබේද යන්න තමන් හොබවන යම් තනතුරක් ප්‍රකාරව ලැබෙන බලයක් හෝ යම්කිසි සමාජ තත්ත්වයක් එම පුද්ගලයාට තිබිය යුතුමය. යන්න මෙයින් අදහස් නොවේ. යම් පුද්ගලයකුට තම අසන්නන් තමා වෙත නතු කර ගැනීමට ඇති හැකියාව, යම් පුද්ගලයකුට තම ආකල්ප එත්තු ගැන්වීමට ඇති හැකියාව සහ අසන්නන්ගේ මතය වෙනස් කිරීමට ඇති හැකියාව තම අසන්නන් වෙනස්කමකට වෛරයට හෝ සාහසික ක්‍රියාවකට පෙලඹවීමට තරම් යම් පුද්ගලයකුට ඇති හැකියාව මෙයින් අදහස් වේ. එවන් පුද්ගලයකුගේ සමාජ භාවය ඔහුගේ හෝ ඇයගේ බලපෑම තහවුරු කර ගැනීම සඳහා උපකාරී විය හැකි වුවද ප්‍රබල සමාජ තත්ත්වයක් තිබිම පමණක් ඒ සඳහා ප්‍රමාණවත් නොවේ.

III. චේතනාව - කිසියම් පුද්ගලයකු තම ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාකයන් දැනදැනම ස්වේච්ඡාවෙන් වෛරී අදහස් පතුරුවන්නේ නම් සහ එවන් ප්‍රතිවිපාකයන් වාහාම සිදු වේ යැයි දැනුම ඇත්තේ නම් එවන් පුද්ගලයකුට මෙම වරදට අවශ්‍ය චේතනාව තිබේ.

IV ප්‍රකාශයේ අන්තර්ගතය හා ස්වභාවය - අන්තර්ගතයේ ප්‍රකෝපකාරී ස්වභාවය, එහි ඉදිරිපත් කර ඇති තර්කයන්, තර්කවල ස්වභාවය හා තර්කයන් භාවිතා කරන ප්‍රකාශන ක්‍රමය, ප්‍රකාශනයේදී භාවිතා කරන ස්වරය ආදිය.

V උපදේශනයයේ පරිමානය - ප්‍රකාශනය පොදු ස්ථානයක සිදුවේද සහ ප්‍රේක්ෂකයන්ගේ ප්‍රමාණය

VI ආසන්න ලෙස සිදුවිය හැකි හානිය - පෙලඹවීමක් හේතුවෙන් ආසන්නනයේම හානියක් සිදුවේ යැයි සාධාරණ ලෙස අනුගමනය කළ විය හැකි විය යුතුය.

ඒ අනුව වගඋත්තර පාර්ශවය විමර්ශනයේදි ඉහත කරුණු පිළිබඳ අවධානයට ලක්කරාද යන්න සලකා බැලීමේදි, වගඋත්තර පාර්ශවයේ විමර්ශන සටහන් හා ලබා දී ඇති ප්‍රකාශ වලට අනුව වින්දිතගේ ප්‍රකාශය සිදු කරනු ලැබූ කාල සීමාව තුලදී ආගමික ගැටුම්කාරී හෝ වර්ගවාදි ගැටුම්කාරී තත්ත්වයක් තිබූ බවට කිසිදු සඳහනක් දක්නට නොලැබෙනවා මෙන්ම කථිකයා පිළිබඳව සලකා බැලීමේදී කථිකයා පිළිබඳව ජනතාව දැනුවත්වී ඇත්තේ මෙම කරුණ පිළිබඳ YouTube නාලිකාවේ ප්‍රචාරණය වීමෙන් පසුව බව කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ. එහිදි මෙම තැනැත්තිය 2023.04.01 දින සිදුකළ

මොඩාභිමානි වැඩසටහනේදි ප්‍රේක්ෂකයින් කිසිදු ප්‍රශ්නගත කිරීමක් කර නැත. නමුත් මේ පිළිබඳව ප්‍රශ්න සහගත වී ඇත්තේ 2023.05.23 යු ටියුබ් නාලිකාවේ පලවීමෙන් පසුව බව අවධානයට ලක්වේ.

එසේම කථානායකවරිය Standup comedian (ප්‍රහසන වැඩසටහන් ඉදිරිපත් කරන්නියක්) බව ඇය විසින් මීට පෙරද ඉදිරිපත් කළ ප්‍රහසන වැඩසටහන් පිලිබඳ සැලකීමේදීද නිරීක්ෂණය වන කරුණක් වන අතර මෝඩාභිමානය නැමැති වැඩසටහන් තුලින් ඇය කටයුතු කර ඇත්තේ හුදෙක් විනෝදාස්වාදය ලබා දීමට බවද කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ. එහෙත් පොලිස් විමර්ශනයේදී මෙම කරුණ කෙරේ අවධානය ලබා දී නොමැති බවද නිරීක්ෂණය වේ.

එසේම මෙම වින්දිතගේ මොඩාභිමානි ප්‍රකාශය වැඩසටහන ඉලක්ක කල කණ්ඩායමට එම වැඩසටහනේ දී බෞද්ධයන්ට එරෙහිව හෝ කිසියම් පෙලඹවීමක්, ප්‍රචණ්ඩත්වය වැපිරීමක් කල බවට කරුණු අනාවරණය කර ගැනීමට 01, 02, 03 වගඋත්තර පාර්ශව සමත්ව නැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන අතර, ඉලක්ක කණ්ඩායම වනුයේ හුදෙක් විනෝදාස්වාදය ලබා ගැනීමට පැමිණි පිරිස බව අදාළ විඩියෝපටය නැරඹීමේදි නිරීක්ෂණය වේ.

එසේම කථිකයාගේ චේතනාව පිලිබඳව ද සලකා බැලීමේදී හා එම මුළු වැඩසටහනම කෙරේ අවදානය යොමු කලේ නම් එහි වූයේ හුදෙක් විනෝදාස්වාදය ලබා දීම පමණක් බවද පැහැදිලි වේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලද පැමිණිලි පිළිබඳ නිරීක්ෂණයේදී "අර සුද්ධෝදනගේ ළමයා ඒ ළමයා ඉපදුනු දවසේම ඇවිදලා... ඒකට මේ ගොල්ලෝ, තවම කෙලින් කරලා වඩාගත්තට බෙල්ල කඩන් වැටෙනවා.... අර සුද්ධෝදනගේ පොඩි එකා ඉපදුනු දවසෙම කවියක් කියලා. ඒකට මුන් .... සුද්ධෝදනගේ කොලු පැටියා ඉපදුනු දවසේ කියලා නෑ දැම්ම තීරණය කරලා තියෙන්නේ එයා ලොකු වෙලා මොනවාද කරන්නේ කියලා " යන ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කිරීමේදී එම ප්‍රකාශය පමණක් තනිව නොගත යුතු අතර එහි සමස්ථ ප්‍රකාශය පිලිබඳවද විමර්ශනයේදී අවධානය යොමු කල යුතුව තිබුණු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පෙනීයයි.

තවද එම ප්‍රකාශයක් තුලින් සමාජ කොටස් හා ආගමික භක්තිකයන්ට එම ප්‍රකාශය නුරුස්සීම නිසා හා ඔවුන්ගේ හිත රිදීම මත හෝ අපහාසාත්මක කරුණු හෝ වගකීමකින් විරහිතව සිදුකරන ප්‍රකාශ කල පමණකින්ම එය අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ සම්මුති පනතේ 3(1) වගන්තියට අදාල නොවන බවට අන්තර් ජාතික නීතිය පිලිගෙන ඇති තත්ත්වයකි.

ඒ අනුව උක්ත කරුණු සියල්ලම පිළිබඳ අවධානයට ලක් කිරීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් මුලිකවම මෙම වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීමට හේතු වූ කරුනු සාධාරණ ලෙස විමර්ශනයකට භාජනය නොකොට සැකකාරිය අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම කළ බවට කරුණු නිරීක්ෂණය වේ.

<u>**ගනේෂන් සැම්සන් රෝයි ඒ.එම්.එම්.ජානක මාරසිංහ ස්ථානාධිපති, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව SCFR 405/2018 නඩුවේදී දක්වනා ඇත්තේ**</u> වගඋත්තර පාර්ශවය නිසි පරීක්ෂණයක් සිදු නොකර හුදු පැමිණිල්ලක් හේතුවෙන් නීතිවිරෝධි පියවර ගැනීම පුදුමයට කරුණක් බවත්, චෝදනාව විශ්වාස කල හැකි බවට මතයක් ගොඩ නගා ගෙන ලැබුනු පැමිණිල්ලක් මත යාන්ත්‍රිකව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරීන්ට කල නොහැකි බවත් ලද පැමිණිල්ල විශ්වාස කල හැකිද නැතහොත් ලබා දී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට, කරුණු පැහැදිලි නම්, අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පොලිස් නිලධාරියෙකු ක්‍රියාත්මක විය යුතු බවට දක්වා ඇත.

එසේම නොපැහැදිලි සැකයක් මත අත්අඩංගුවට ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පුද්ගලයෙකුට සහතික කර ඇති පුද්ගලික නිදහස සැලකිය යුතු ලෙස සීමා කිරීමට තුඩු දෙන කාරණයක් බවද සඳහන් වේ.

**<u>මොහොමඩ් රාසික් මේසි ඒ.බී.එම්.එස්.කේ.සේනාරත්න, ප්‍ර.පො.ප අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ තවත් අය නඩුවේදී</u>** සිවිල් හා දේශපාලන සම්මුති පනත යටතේ අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාදාමය පිළිබඳ දක්වා ඇත. එහිදි පෙන්වා දී ඇත්තේ අත්අඩංගුවට ගැනීමට ප්‍රථම ඊට හේතුවූ කරුණු පිළිබඳ සෑහීමට පත්වී තිබිය යුතු බවයි.

වින්දිත අධිකරණයට ඉදිරිපත් කිරීමේදි 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යටතේ වරදක් සිදුකර ඇති ලෙසටද ඉදිරිපත් කර ඇත.

2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනතේ 6(1) යටතේ වරද පිළිබඳ අවධානය යොමු කිරීමේදී වගඋත්තර පාර්ශවය වින්දිත කෙරේ පරිගණක අපරාධ පනතේ වරදවල් කෙසේ අදාල කරගන්නේද යන කාරනය ප්‍රශ්න ගත වේ. වින්දිත විසින් ඇයගේ ප්‍රහසන වැඩසටහනකදි ඉදිරිපත් කළ වැඩසටහනක් Youtube නාලිකාව උඩු ගත කිරීම තුළ එය උක්ත පනතේ 6(1) යටතට ගැනීම කෙතරම් සාධාරණද යන්න ගැටලුවකි.

අත්අඩංගුවට ගැනීම සාධාරණ හේතුවකට තොරතුරකට, පැමිණිල්ලකට විය යුතු බව විවිධ නඩු තීන්දුවලදි නිශ්චිත කර ඇති තත්ත්වයකි.

<u>ධර්මසේන ස්වාමින්වහන්ගේ තවත් අය එසංජීව මනානාම හා තවත්</u> අය 1 Sri LR 81 ඩෙප් විනිසුරුවා දක්වා සිටියේ අත්අඩංගුවට ගැනීමට නියෝග කිරීම සඳහා සාධාරණ පැමිණිල්ලක්, විශ්වාසනීය තොරතුරක් හෝ සාධාරණ සැකයක් තිබිය යුතුය. පැමිණිල්ලක් ලැබීම මත සෑම නිලධාරියෙකුටම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට අවසර නොලැබේ තොරතුරක් හෝ පැමිණිල්ලක් ලද පසු එම පැමිණිල්ල හා තොරතුර සාධාරණ පැමිණිල්ලක්ද විශ්වාසනීය තොරතුරක්ද යන්න අත්අඩංගුවට ගැනීමට පෙර තහවුරු කර ගත යුතු බවයි.

එසේම හුදු පැමිණිල්ලක් මතම නිසි විමර්ශනයක් හා කරුණු සොයා බැලීමකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතු බවද ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින් පැහැදිලි කර ඇති කරුණකි.

<u>එමිල් රන්ජන් එදිරිව නිතිපති</u> නඩුවේදි දක්වා ඇත්තේ, මහජන කැලබීමක් ඇති විය හැකි බවට විමර්ශනයක් විසින් සිදුකරන හුදු ප්‍රකාශයක් මගින් පුද්ගලයෙකු රක්ෂිත බණ්ධනාගාර ගත කළ නොහැකි බවත්, විමර්ශනය සඳහා සහාය දැක්වීම වශයෙන් පෙත්සම්කරු රක්ෂිත භාරයට පත්කරන ලෙස ඉදිරිපත් වි ඇති කරුණු සැලකිල්ලට ගත යුතු බවයි.

එසේම මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය විසින් සිවිල් හා දේශපාලන සම්මුති පනතට අදාළව මහාධිකරණය වෙත සිදුකළ ඇප ඉල්ලීමට අනුව 2023.07.25 දිනැතිව ඇප ලබාදීම සිදුකර ඇත. එහිදි මහාධිකරණ විනිසුරු එම්.පටබැදිගේ විනිසුරුතුමා දක්වා ඇත්තේ මෙම නඩුවේ කරුණු අනුව කාර්යයභාරය වන්නේ, අප රටේ අන්තර් ජාතික වගවීම හා බැදියාවන් අනුව සත්‍ය වශයෙන්ම අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතේ 03 වන වගන්තිය යටතේ වෛරි ප්‍රකාශයක් සිදුවි තිබේද නැද්ද යන්න සම්බන්ධයෙන් අන්තර්ජාතික අර්ථ නිරූපනයක්ද සලකා බලා කටයුතු කිරීම විනා, පුද්ගලයෙකුගේ පැමිණිල්ලක් ලද පමණනින් අත්අඩංගුවට ගැනීම සිදුකිරිම නොවන බවයි.

ඒ අනුව වින්දිත පිළිබඳව සැලකිමේදි මහජන කැලඹිමක් ඇති විය හැකි යයි සිතමින් ICCR පනත යටතේ නිසි විමර්ශනයකින් තොරව ඇයගේ (වින්දිතගේ) විදේශිය ගමන වලකා අත්අඩංගුවට ගැනීම මගින් වින්දිත තැනැත්තිය අගතියට පත් කර ඇත.

ඒ අනුව වින්දිත අත්අඩංගුවට ගැනීම නීතියේ නියම කර ඇති කාර්ය පටිපාටියට අනුව සිදුකර නොමැති බව අනාවරණයවීම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වගන්තිය උල්ලංඝනය වූ බව නිගමනය කරමු.

**<u>12(1) වගන්තිය උල්ලංඝනය වීම</u>**

වින්දිත පාර්ශවය සිදුකල ප්‍රකාශය 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත යටතේ අත්අඩංගුවට ගත් බව වගඋත්තර පාර්ශවය දක්වා ඇත. 2022.05.23 දාතමින් RTM 541 යටතේ පොලිස්පති විසින් 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත යටතේ විමර්ශන ආරම්භ කිරීම කල යුතු ආකාරය දක්වා ඇත.

එහිදි 02 වන කරුණු ලෙස දක්වා ඇත්තේ උක්ත පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් කරුණු තිබෙන විට එම කරුණුවලට අදාල සියලුම උධෘත සමඟ ගොනුවක් සකස් කර නොපමාව අධ්‍යක්ෂක නීති කොට්ඨාශය වෙත යොමු කිරීමට පියවර ගත යුතු බවත් එම පනත යටතේ යම්කිසි තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීමට පෙරාතුව ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක/නීති කොට්ඨාශය දැනුවත් කර එම උපදෙස් මත මිස එවැනි තැනැත්තෙකු 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත යටතේ අත්අඩංගුවට ගැනීම නොකල යුතුය ලෙසය.

තවද මෙලෙස ක්‍රියාකිරීමේදී හදිසි හා අත්‍යාවශ්‍ය අවස්ථාවලදී වාචික හෝ අධ්‍යක්ෂක /නීති කොට්ඨාශය උපදෙස් ලබා ගැනීමට පියවර ගතයුතු අතර, අනතුරුව නීති කොට්ඨාශය වෙත උධෘත ගොනුවක් යොමු කල යුතුය ලෙස දක්වා ඇත.

ගොනුව පරිශීලනය කර අධ්‍යක්ෂක/නීති කොට්ඨාශය විසින් ලබා දෙන උපදෙස් අනුව මෙම විමර්ශන සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කල යුතු බව දක්වා ඇත. වාචික උපදෙස් ලබා ගත් බවට අදාල පොලිස් ස්ථානයේ පවත්වාගනු ලබන තොරතුරු සටහන් පොත්වල සටහන් ඇතුලත් කල යුතු බවද එම උපදෙස් මාලාවේ දක්වා ඇත.

එසේම මෙහි යම් ආකාරයකින් පැන නැගුනු යම් සුවිශේෂී තත්ත්වයක් හේතු කොටගෙන අධ්‍යක්ෂක/නීති කොට්ඨාශ මගින් ලිඛිත හෝ වාචික නියෝග ලබා ගැනීමකින් තොරව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට සිදු වන අවස්ථාවක, එසේ ඇති වන සුවිශේෂිතාවය කුමක්ද යන්න එම අවස්ථාවේදීම ඉහත සඳහන් පිරිදි අවස්ථානුකූලව අදාල සටහන් පොත්වල සටහන් කල යුතු බව දක්වා ඇත.

මෙම වින්දිත තැනැත්තිය සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී ඉහත පොලිස්පති ලබා දුන් උපදෙස් මත පිහිටා කටයුතු කර නොමැති බවට කරුණු නිරීක්ෂණය වන අතර මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණ වලදීද වගඋත්තර පාර්ශවය ඒ බව පිලිගෙන ඇත.මේ සඳහා අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගත් බව 1, 2, 3 වගඋත්තර පාර්ශවය කරුණු දක්වා ඇත.

පොලිස්පතිවරයා විසින් මෙවැනි උපදෙසක් නිකුත් කිරීමේ අරමුණ වනුයේ, නිවැරදි නොවන අත්අඩංගුවට ගැනීම් හා නිති විරෝධි අත්අඩංගුවට ගැනීම් වලකාලීම බව පැහැදිලිය.

එසේම අත්අඩංගුවට ගැනීමකට පෙර උපදෙස් ලබා ගැනීම තුළින් යමෙකු සාධාරණ නොවන කරුණකට අත්අඩංගුවට ගැනීම වැලකි ඔහු/ඇය තවදුරටත් අගතියට පත් විම වැලැක්වීම වේ.

මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුවද 2024.06.06 දිනැතිව අධ්‍යක්ෂ පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත දන්වා ඇත්තේ චූදිතයන්ට විරුද්ධව තවදුරටත් නීති මගින් කටයුතු කිරීමට අදහස් නොකරන බවත් ඔවුන්ට නිදහස් කළ හැකි බවත් ඒ පිළිබඳ මහේස්ත්‍රාත් වෙත දන්වා යැවිය යුතු බවයි. ඒ

අනුව 2024.06.19 වන දින මහේස්ත්‍රාත් අධිකරණයේදි වින්දිත අදාළ නඩුවෙන් නිදහස් කර ඇති බව නිරීක්ෂණය වේ.

01, 02, 03 වගඋත්තරකාර පාර්ශවය පොලිස්පති විසින් නිකුත් කළ උපදෙස් අනුව මුලින්ම කටයුතු සිදුකලේ නම් වින්දිත පාර්ශවයට මේ දක්වා සිදුවූ අගතියන්ට මුහුණ පෑමට සිදුනොවුනු ඇත. එසේම එම සිදුවූ අගතියන් නැවත ප්‍රතිපූර්ණයක් කළ නොහැකි අගතියන් විම මෙහිදි මානව හිමිකම් කොමිෂන් සභාව අවධානයට ගනී.

ඒ අනුව 1. 2, 3 මෙම වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම උපදෙස් මත පිහිටා කටයුතු නොකිරීම තුළ වින්දිත පාර්ශවයට නිතියේ රැකවරණය නොලැබි ඇති බවත් ඒ තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවය දක්වන ආකාරයට ඇයගේ භාෂනයේ හා ප්‍රකාශනයේ අයිතිවාසිකම අහිමිකිරීම පිළිබඳ අවධානය යොමු කිරීමේදි ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තිය ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ප්‍රකාශනය ඇතුලුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සහතික කරයි. එසේම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 19 වන වගන්තිය අනුව,

19 (1) බාධාවකින් තොරව ස්වකිය මතය දැක්විමට සෑම කෙනෙකුටම අයිතිවාසිකම් ඇත්තේය

- සෑම කෙනෙකුටම අදහස් ප්‍රකාශ කිරිමේ නිදහස ඇත්තේය, දේශසිමාවන්ගෙන් තොරව තොරතුරු සෑම අන්දමකට අදහස් වාචිකව, ලිඛිතව හෝ මුද්‍රිතවද, චිත්‍රවල ආකාරයෙන් ද එසේ නැතහොත් තමාට කැමැති වෙනත් ඕනෑම මාධ්‍යයකින්ද සොයා ගැනීමට ලැබිමට සහ දැන්විමට තිබෙන නිදහස මෙම අයිතිවාසිකමට ඇතුලත් විය යුතුය යන්න දක්වා ඇත.

මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇති භාෂනයේ හා ප්‍රකාශනයේ නිදහස නිරපේක්ෂ අයිතියක් නොවන අතර, එය සිමාකිරිම් වලට ලක් කර ඇත. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) 15(7) එම සීමා කිරිම් දක්වා ඇත.

15(2) වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරිම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද අධිකරණයට අපහාස කිරිම, අපහාස හෝ වරදකට පෙළඹිම හා සම්බන්ධව නිතියෙන් නියම කරනු ලැබිය හැකි සිමාකිරිම් වලට යටත්වන බවත්ය.

15(7) (අ) ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය හෝ මහජන සෞඛ්‍ය හා සදාචාරය හෝ රැකිම සඳහා නිතියෙහිලා විධිවිධාන සලකා ඇත්තාවුද අවශ්‍ය වන්නාවුද ඒවා විය යුතුය ලෙස දක්වා ඇත.

එසේම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ වූ සම්මුතියේ,

20 (1) යුද්ධය සඳහා කෙරෙන සෑම ප්‍රචාරණයක්ම නීතියෙන් තහනම් කළ
(2) වෙනස්කමකට වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙලඹවීමක් සිදුවන ජාතික, වාර්ගික, ආගමික ද්වේශය පැතිරවිම නීතියෙන් තහනම් කළ යුතුය ලෙස දක්වා ඇත.

එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කමිටුව එනම් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය ක්‍රියාවට නැංවිම පිළිබඳ සොයා බලන ස්වාධින විශේෂඥ කමිටුව දක්වා ඇත්තේ ICCPR සම්මුතියේ 20 වන වගන්තිය සහ අදහස් ප්‍රකාශ කිරිමේ නිදහස පිළිගෙන ඇති, එහි 19 වන වගන්තිය සමඟ එකට කිවයුතු බවයි. උදාහරණ ලෙස එම කමිටුවේ අංක 11 දරණ පොදු විවරණය අනුව 20 වන වගන්තිය යටතේ

අවශ්‍ය වන තහනම් කිරීමක් 19 වන වගන්තිය මගින් සහතික කරනු ලබන නිදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා අනුකූල විය යුතු බව දක්වයි.

ඒ අනුව වින්දිත විසින් සිදුකරනු ලැබූ අදහස් ප්‍රකාශනය තුළ මෙම දක්වන තහනම් කිරීම සීමා කිරීමට අදාළ වේදැයි සලකා බැලීමේදී එම සීමා කිරීම් සඳහා දක්වන කාණ්ඩය සඳහා ඇතුලත් වන්නේ දැයි සලකා බැලීමේදී සිවිල් හා දේශපාලන සම්මුති පනතේ 20 වැනි වගන්තියේ දැක්වෙන ආකාරයේ වෛරය පැතිරීම හඳුනා ගැනීම සඳහා වූ රබාත් ක්‍රියාකාරී සැලැස්මේ අංක 06 කින් ස්වාධීන පරීක්ෂණය ( Threshold test) අ) සන්දර්භය (Context), ආ) කථිකයා (Speaker), ඇ) චේතනාව Intention of Speaker), ඈ) ප්‍රකාශනයේ අන්තර්ගතය හා ස්වාභාවය (Content) , ඉ) උපදේශනයේ ප්‍රමාණය (Extent and Magnitude of the expression ඊ) ආසන්න හානිය (Imminent harm) කෙරෙහි මෙහිදී අවධානය යොමු කළ යුතුය.

ඒ අනුව වින්දිත ICCPR පනතේ 3(1) වගන්තිය උල්ලංඝණය කිරීමක් බවට චෝදනා කරන ලද ප්‍රකාශයන්, ප්‍රහසන සංදර්ශනයකදී, හිතාමතාම හාස්‍යජනක වූ කලාත්මක ප්‍රකාශන ආකාරයකි. දේශපාලනික, ආගමික හෝ අධ්‍යාපනිත වේදිකාවක් නොව උපහාසාත්මක අදහස් ඇතුලත් ප්‍රකාශනයක් සමගින් තැනැත්තන් සතුටු කරන ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ.

බුදු රජාණන් වහන්සේගේ ළමා කාලය ගැන සඳහන් කිරීම හරහා, පෙත්සම්කරු බෞද්ධ ඉගැන්වීම්වල විශ්වාසය අපකීර්තියට පත් නොකරන අතර, ඒ වෙනුවට එය සිදුවෙමින් පවතින බව පිළිගෙන අනෙක් දරුවන්ට සමාන නිපුණතා මට්ටම් සහ කුසලතා තම දරුවන්ටද දෙමාපියන් අපේක්ෂා නොකළ යුතු ආකාරය ගැන ප්‍රේක්ෂකයන්ට සිතිමට අවස්ථාවක් ලබා දෙයි. සම වයසේ දරුවන් පිළිබඳව එසේ ප්‍රකාශ කරන අතර, තම දරුවන් කවුරුන්ද යන්න තේරුම් ගැනීමට දෙමාපියන්ට සහතික වන ප්‍රකාශනයක් මිස ආගමික විශ්වාසන්ට අපහාස කිරීම හෝ අපකීර්තියට පත් කිරීම අරමුණු කරගත් ප්‍රකාශනයක් නොවන බව නිරීක්ෂණය වේ.

තවද අදහස් දැක්වීමේදී වින්දිත විසින් භාවිතා කරන ලද ප්‍රකාශනවල ස්ථාවරය සහ ස්වභාවය ද කිසිදු බලධාරී ස්වරයක් පිළිබිඹු නොකරන අතර එය විසින් කරන ලද ප්‍රකාශය සමග එකගවීමට ප්‍රේක්ෂකයන්ට අනුගමනය කළ යුතු කිසිදු ක්‍රියාමාර්ගයක්ද නියම නොකරයි. මේ අනුව වින්දිත විකට නිලියක ලෙස, සෘජුව හෝ වක්‍රව හෝ ආගමික විශ්වාසයන් ප්‍රශ්න කිරීමට හෝ කිසියම් පුද්ගලයෙකු කෙරෙහි ආගමික වෛරයක් ඇති කිරීමට කිසිදු පුද්ගලයෙකු යොමු කිරීමට අදහස් නොකරන බව තවදුරටත් නිරීක්ෂණය වේ.

වින්දිතගේ ප්‍රකාශ මත පදනම්ව කිසියම් පුද්ගලයකු වෙනත් ආගමකට වෙනස් කොට සලකන, සතුරු හෝ ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කළ බවට වාර්තා වූ සිද්ධීන් ඇති බවට කොමිසම හමුවේ සාක්ෂි නොමැත. ආගමික අසමගිය ඇති කරමින් වෙනස් කොට සැලකීමේ, සතුරු හෝ ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කිරීමට කිසියම් පුද්ගලයකු අදහස් කළ බවට සාධාරණ ලෙස උපකල්පනය කිරීමට විශ්වාස කළ හැකි සාක්ෂි ද නොමැත.

එබැවින් කොටස් හයේ එළිපත්ත පරීක්ෂණයේ (Threshold ) ලැයිස්තුගත කර ඇති පරිදි වෛරී ප්‍රකාශයේ අවශ්‍ය අංග තුළට අදහස් නොවැටෙන බැවින්, පෙත්සම්කරු විසින් කරන ලද අදහස්, ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටින අතර, එය වෙනස් කොට සැලකීම, සතුරු කම හෝ ප්‍රචන්ඩත්වය ඇවිස්සීමක් නොකරයි. මේ අනුව එය ICCPR පනතේ 3(1) වගන්තිය උල්ලංඝනය කිරීමක් නොවේ.

වින්දිත විසින් වෙනස් කොට සැලකිමට, සතුරුකම් කිරීමට හෝ ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීම් සඳහා කිසිදු උපදේශනයක් නොමැති විට, වින්දිත විසින් කරන ලද අදහස් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වී ඇති බව හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව නීත්‍යානුකූලව තහවුරු කළ නොහැක. මේ අනුව

ප්‍රකාශනයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) වගන්තියේ දක්වා ඇති සීමාවන් තුළට ඇතුලත් වන බවට වගඋත්තරකරුවන් කරුණු දක්වා නොමැති අතර, වින්දිතගේ එම ප්‍රකාශය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) සීමාව තුළට නොවැටෙන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

වින්දිත විසින් කරන ලද ප්‍රකාශය පිළිබඳ වැරදි අවබෝධයක් මත ආගමික ප්‍රජාවකට අයත් ඇතැම් පුද්ගලයන් අගතියකට පත්වූ බව ප්‍රකාශ කළද වරදවා වටහා ගැනීම මත යම් ප්‍රකාශයකින් තමාවම රිදවා ගන්නා තැනැත්තෙකුට ඒ මතය ප්‍රකාශ කළ තැනැත්තා වගකිව යුතු බවට පත් කිරීම දැඩි අසාධාරණයකි. එබැවින් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමේදී කිසියම් ප්‍රකාශනයක් කරන පුද්ගලයාගේ "චේතනාව" කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම නැවත අවධාරණය කරමින්, වින්දිතගේ අදහස් නීතියෙන් නියම කර ඇති කිසිදු සීමාවකට නොවැටෙන බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ ඒ අනුව මෙම තත්ත්වය තුළ වින්දිතයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

විවිධ නඩු තීන්දු හරහා මෙම අයිතියේ විෂය පථය නිර්වචනය කර ඇත. ජෝසප් පෙරේරා හෙවත් බෲටන් පෙරේරා එදිරිව නිතිපති සහ අනෙකුත් අය නඩුවේදි ශර්වානන්ද විනිසුරුතුමා දක්වා සිටියේ "අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අප ප්‍රතිඥා දී ඇති නිදහස් සමාජයක මුලික වටිනාකම්වලින් එකක් වන්නේ අගය කරන චින්තනයට පමණක් නොව අප පිළිකුල් කරන සිතුවිල්ලටද නිදහස තිබිය යුතු බවට වූ විශ්වාසය මතය අවම සමාජ වැදගත්කමක් ඇති සම්ප්‍රදායික නොවන අදහස් පවතින මතයේ වාතාවරණයට වෛර කරන අදහස් පවා ඇති, සියලුම අදහස්වලට නිදහසේ භාෂනයේ සහ ප්‍රකාශනයේ ව්‍යවස්ථාමය සහතිකයේ ආරක්ෂාව ඇත." යනුවෙනි. ඒ අනුව වින්දිත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) අ ව්‍යවස්ථාව උල්ලංඝනය වි ඇති බව නිගමනය කරමු.

ඉහත සමස්ත කරුණු සියල්ල පිළිබදව අවධානය යොමු කිරීමේදි වින්දිත පාර්ශවය සම්බන්ධව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) 12 හා 14(1) අ ව්‍යවස්ථා මගින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් 1, 2, 3 වගඋත්තරකාර පාර්ශවය උල්ලංඝනය කර ඇති අතර, 4 වන පාර්ශවය විසින් 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

ඒ අනුව පහත නිර්දේශයන් කර සිටි.

01. ඉහත 1, 2, 3 වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගැනීමට පොලිස්පති වරයා පියවර ගත යුතුය.

02. 4 වන වගඋත්තරකාර පාර්ශවය විසින් පොලිස්පතිවරයා සමඟ ද සාකච්ඡා කර ආගමන විගමන දෙපාර්තමේන්තුවට ගමන් වලක්වා රඳවා තබා ගැනිම පිළිබඳව මාර්ගෝපදේශන මාලාවක් සකස් කර සියලුම බලයලත් නිලධාරින් දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතුය.

03. අපරාධකරුවන් රටින් පිටවීමට තැත් කිරීමේදි ආගමන විගමන දෙපාර්තමේන්තුව තුළ රඳවා ගැනීමට අදාළව පොලිස්පති විසින් යාවත් කාලීන කළ විධිමත් මාර්ගෝපදේශන පද්ධතියක් සකස් කිරිමත් ඒ සම්බන්ධයෙන් අදාළ සියලුම පොලිස් නිලධාරින් දැනුවත් කිරිමේ වැඩ පිළිවෙලක් සකස් කර එහි ප්‍රගතිය මානව හිමිකම් කොමිෂන් සභාවවට දැනුම් දිමට කටයුතු කළ යුතුය.

04. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත 03 වගන්තිය පිළිබඳවත්, පොලිස්පතිවරයා නිකුත් කළ RTM 541 ප්‍රකාරව හා පනත යටතේ අත්අඩංගුවට ගැනීම පිළිබඳ නීතිය හා පරිපාටිය පිළිබඳව සියලුම ස්ථානාධිපතිවරු, සහකාර පොලිස් අධිකාරිවරු දැනුම්වත් කිරීමේ වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකා පොලිසිය විසින් සකස් කිරීම කඩිනම් කළ යුතුය.

05. වින්දිත පාර්ශවයට සිදුවූ අගතිය සම්බන්ධව රු.50000/- ක මුදලක් 1, 2, 3 වගඋත්තරකරුවන් විසින් එකතුව වින්දිත පාර්ශවයට ගෙවීමට නිර්දේශ කරනු ලැබේ.

2024.11.14 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත - 01. අමාත්‍යතුමා - මහජන ආරක්ෂක අමාත්‍යාංශය.

02. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01.

03. සභාපති, පොලිස් කොමිෂන් සභාව, බන්ඩාරනායක සම්මන්ත්‍රන ශාලාව.

<u>**නිර්දේශ අංක 03**</u>

**වින්දිත පාර්ශවය:**

01. එම්. එච්. රශ්මි කාංචන
    බී35/2. නැදිගම්විල
    ගෝනගමුව
    තිස්සමහාරාමය

02. අන්තෝනි. සුරේෂ්
    12/6. මීතොටමුල්ල පාර
    වැල්ලම්පිටිය.

03. ඩබ්. එම්. චමින්ද සමන් කුමාර.
    පල්ලෙවත්ත
    දොරවදෙණිය
    නාවලපිටිය

04. බී.ජී.චාමර ලක්ෂාන් සෙනෙවිරත්න
    ආනමඩුව (ලිපිනය ලබා දී නොමැත)

05. එම්. එෆ්. එන්. ෆස්ලාන්
    අංක : 132/369
    ද මෙල් මාවත
    ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14

06. ඉෂාරගේ සංජු ප්‍රදීප්
    අංක : 77/29
    වැබඩමුල්ල

**වගඋත්තර පාර්ශවය :**

01. එම්. එල් .එල්. උදාර සුමනපාල ( දෙවන පෙළ ජේලර්)
    තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර
    ශ්‍රී ලංකා බන්ධනාගාරය
    වටරැක, පාදුක්ක

02. එම්. ඩී. පෙරේරා (කාර්ය භාර නිලධාරී)
    තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර
    ශ්‍රී ලංකා බන්ධනාගාරය
    වටරැක, පාදුක්ක

03. කේ. අයි.ඩී. පෙරේරා (බී වාට්ටුව භාර නිලධාරී)
    තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර
    ශ්‍රී ලංකා බන්ධනාගාරය
    වටරැක, පාදුක්ක

04. ඩී. එම්. නිමල් ශාන්ත (සහකාර බන්ධනාගාර අධිකාරී)
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර
ශ්‍රී ලංකා බන්ධනාගාරය
වටරැක, පාදුක්ක

05. අජිත පල්ලියගේ (ප්‍රධාන ජේලර්)
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර
ශ්‍රී ලංකා බන්ධනාගාරය
වටරැක, පාදුක්ක (වර්තමාන රාජකාරී ස්ථානය වැලිකඩ)

**පැමිණිලි අංකය : HRC/904/20/I(Vi)**

2020 මැයි 23 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හදිසි ඇමතුම් අංකය වෙත නිර්ණාමික දුරකථන ඇමතුමක් මගින් වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර තුළ තරුණයන් හය දෙනකු වෙත අමානුෂික අන්දමින් ජේලර්වරයකු කටයුතු කර ඇති බව දැනුම් දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඩී.එම්. නිමල් ශාන්ත (සහකාර බන්ධනාගාර අධිකාරී) වෙතින් දුරකථනය මාර්ගයෙන් කරුණු විමසීමේ දී මෙම සිදුවීමට අදාළව අභ්‍යන්තර විමර්ශනයක් සිදුවෙමින් පවතින බව දැනුම් දී ඇත. එම අවස්ථාවේදීම අභ්‍යන්තරික විමර්ශනය සිදුකරන නිලධාරියා වන අජිත් පල්ලියගේ (ප්‍රධාන ජේලර්) සම්බන්ධ කරගනිමින් කරුණු විමසා ඇත.

ඒ අනුව 2020 මැයි 26 වන දින වටරැක බන්ධනාගාර අධිකාරී වෙත සිද්ධියට භාජනය වූ රැඳවියන් 06දෙනා අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත පැය 48ක් තුළ කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්, එකී තොරතුරු මානව හිමිකම් කොමිෂන් සභාවට ෆැක්ස් මගින් ලබා දෙන ලෙසත්, බන්ධනාගාරය විසින් සිදුකරන ලද මූලික පරීක්ෂණයේ පරීක්ෂණ වාර්තා සහ බන්ධනාගාර රෝහලෙන් රැඳවියන් වෙත ලබාදුන් වෛද්‍ය ප්‍රතිකාර වලට අදාල ලේඛන පිටපත් යොමුකරන ලෙසත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව දැනුම් දී ඇත.

බන්ධනාගාර අධිකාරි (තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර) විසින් 2020.06.15 දින වන තෙක්ම මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මේ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත්ව ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායමක් විසින් 2020.06.15 වන දින වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර වෙත ගොස් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේ දී මෙම තරුණ රැඳවියන් අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කර නොමැති බව අනාවරණය වී ඇත. එසේහෙයින් නැවතත් 2020.06.16 වන දින බන්ධනාගාර අධිකාරී වෙත අදාළ රැඳවියන් අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇත.

2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායම විසින් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී එම වින්දිත දරුවන් සය දෙනාගෙන් ප්‍රකාශ වෙන් වෙන් වශයෙන් සටහන් කරගෙන ඇත.

**වින්දිත තැනැත්තන්ගේ කරුණු දැක්වීම**

**පළමුවන වින්දිතයාගේ ප්‍රකාශය :**

බී35/2, නැදිගම්විල, ගෝනගමුව, තිස්සමහාරාමය ලිපිනයේ පදිංචි වයස අවුරුදු 18ක් වූ මිටිතොට හේවගේ රශ්මි කාංචන යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. දානේ ගෙදරක දී දෙපිරිසක් අතර ඇති වූ කෝලහලයක් හේතුවෙන් වීරවිල පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිස්සමහාරාම අධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, මින් පෙර ගහගැනීමක් සම්බන්ධයෙන් නඩුවක් පවතින බවත්, එය සමථ

මණ්ඩලය වෙත යොමු කර ඇති බවත්, වටරැක බන්ධනාගාරය වෙත 2019.10.04 වන දින හෝ ආසන්න දිනක යොමු කළ බවත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත. මෙම සිද්ධියට අදාළ දිනය නිශ්චිතව මතක නොමැති බවත්, සවස 3.00ට 3.30ට පමණ ස්නානය කිරීමෙන් පසු වාට්ටුවට පැමිණි බවත්, වාට්ටුවේ ඝෝෂාවක් තිබූ බවත් ඔහු විසින් සඳහන් කර ඇත. පහළ හිටිය ජේලර් උදාර මහතා, ඉන්චාර්ජ් දයාපාල මහතා, නියාමක පෙරේරා මහතා සද්දෙ වැඩියි කියලා උඩට පැමිණි බවත්, "ඒ වෙලාවේ බාත්රූම් එකේ ඉඳලා දෙන්නෙක් ඇඳුම් නැතිව (හෙළුවෙන්) ආවා.." ලෙසත් ප්‍රකාශ කර ඇත. ඒ වන විට මොවුන් පැමිණ විනාඩි 15 ක් පමණ ගතව තිබූ බවත්, ඔහු තුවායක් ඇඳ සිටි බවත් සඳහන් කර ඇත. එතන තවත් තිදෙනෙකු පමණ ඇඳුම් නැතිව (නිරුවතින්) සිටි බවත්, උදාර මහතා විසින් ටවල් ඇඳන් ඉන්න අයයි ඇඳුම් නැතිව ඉන්න අයයි (ටවල් එකක් දාගෙන) පැමිණෙන ලෙස දැනුම් දුන් බවත් සඳහන් කර ඇත. ඒ අනුව මොහු සමඟ 05 දෙනෙක් හෝ 06 දෙනෙක් එම ස්ථානයට පැමිණි බවත්, එහි දී "හෙළුවෙන් හිටපු එකට දණගස්වලා ඇවිද්දෙව්වා. විනාඩි 10ක් 15ක් පමණ කළා. පහර දීමක් කළේ නැහැ" ලෙස සඳහන් කර ඇත. ඇඳුම් නැති ද යන්න උදාර මහතා විමසීමේ දී සමහර රැඳවියන් ඇඳුම් නැති බව කියා සිටි බවත්, අඩුපාඩු ගැන බලන්නම් කියා උදාර මහතා පිටව ගිය බවත් ප්‍රකාශ කර ඇත. දණගස්සවා ඇවිද්දවීමෙන් දණහිස් තුවාල වූ බවත්, ඇඳුම් නොමැති අයවලුන් හට නම් ලියා දෙන ලෙස දැනුම් දුන් පසු කිහිප දෙනෙකු නම් ලියා දුන් බවත් සඳහන් කර ඇත. සිංහල සාහිත්‍ය සමිතිය ගැන කතා කළ පසු ඔවුනට සිය වැඩ කරන ලෙසත්, අඩුපාඩු පිළිබඳව ඔහු බලන බවත් සඳහන් කර උදාර මහතා පිටව ගිය බව ප්‍රකාශ කර ඇත. "පහරදීමක් වුණේ නැහැ දණහිස් තුවාල වුණේ ඇවිද්දපු නිසා" බව සඳහන් කර ඇත. පසුදින උදේ ප්‍රධාන ජේලර්තුමා පැමිණ පහරදීමක් වාර්තා වෙනවා ඒ කට්ටිය එන්න කියලා දැනුම් දුන් බවත්, එවිට ඔවුන් සියළු දෙනාම ඉස්සරහට පැමිණ, කට උත්තර/ප්‍රකාශ ලබාගැනීමෙන් පසු බන්ධනාගාර රෝහල වෙත යොමු කර ප්‍රතිකාර ලබා දුන් බවත් සඳහන් කර ඇත. මේ වන විට ගැටළුවක් නොමැති බවත් ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත.

**දෙවන වින්දිතයාගේ ප්‍රකාශය :**

අංක 12/6, මීතොටමුල්ල පාර, වැල්ලම්පිටිය ලිපිනයේ පදිංචි වයස අවුරුදු 19 වූ අන්තෝනී සුරේෂ් යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. 10 වන ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලද අතර පාසල් යන අවධියේ දී මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී ඇත. අයිස් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හේතුවෙන් නිවසින් වැල්ලම්පිටිය පොලිසිය වෙත භාර දී ඇත. පුනරුත්ථාපනය කිරීම සඳහා අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණ අංක 02 විසින් 2019 අගෝස්තු 16 දින වටරැක බන්ධනාගාරය වෙත යොමු කර ඇත. පැමිණි පසු විශේෂ ගැටලු නොමැති බවත්, සිදුවීමට අදාළ දිනය මතක නැති බවත්, ඔහු සිය මිතුරන් පස් දෙනකු සමඟ තුනට පමණ නාන කාමරයේ සිට තුවා ඇඳගෙන පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. වාට්ටුවට පැමිණි පසු උදාර මහතා වාට්ටුවට පැමිණ ඇත. එහි දී "අර අනික් ළමයි 05 දෙනාට වාට්ටුවේ දණගාන්න කීවා. අනෙක් ළමයි බලාගෙන හිටියා. ඒ කට්ටියට විකට් කූරකින් උදාර මහත්තයා ගැහුවා. අත් වලටයි කකුල් වලටයි ගැහුවා. ගහනකොට විකට් කූර වැලේ වැදුනා මගේ යට කලිසම වැලේ තිබුනේ ඒක බිමට වැටුනා. උදාර මහත්තයා ඇහුවා ජොකා කාගෙද කියලා. මම කිව්වා මගේ කියලා ඊට පස්සේ ඒක අහුලගෙන ඔළුවේ දාගෙන දණ ගාන්න කීවා. දණගාන අතර තුර දී පයින් පිටට ගැහැව්වා පිටට ගහපු එකට තුවාල උනේ නැහැ. එත් රිදුණා. දණ ගහපු නිසා කකුල් වල දණහිස් තුවාල වෙලා තිබ්බා. විනාඩි 10ක් පමණ දණ ගෑවා. ඊට පස්සේ ඩිප් 50ක් ගහන්න කීවා. මම ඉස්සර ආමි එකේ හිටියේ. ආමි ට්‍රේනින් තමයි උඹලට දෙන්නේ. කව්ද එන්නේ ගහ ගන්න. උඹලා වණ්ඩිද කියලා ඇහුවා. චීෆ් ජේලර් මහත්තයට ඇත්ත කිව්වොත් බොරු නඩු දාලා පල්ලංසේන යවනවා කියලා කිව්වා" යැයි ප්‍රකාශ කර ඇත. ඔවුන්ට පහරදුන් දින ප්‍රධාන ජේලර් මහතාට සිදුවීම ආරංචි වීමෙන් පසු ගුටි කාපු 06 දෙනා ඒ මහතාගේ කාමරයට රැගෙන විත් ප්‍රකාශ සටහන් කර, ඇති වූ තුවාල වල පින්තූර ලබාගැනීමෙන් පසුව බන්ධනාගාර රෝහලට රැගෙන ගොස් ප්‍රතිකාර ලබා දුන් බව පවසා ඇත. බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරයාට උදාර මහතා විසින් ඔවුන් හට පහර දුන් බව ඔවුන් ප්‍රකාශ කර ඇත. තවද, චමින්ද යන ළමයා හට අදාළ පහරදීම සිදු වූ දිනයේදී නැගීසිටීමටවත් නොහැකිව සිටි බව සඳහන් කර ඇත. ප්‍රධාන ජේලර් මහතා ඔවුන්ගෙන් ප්‍රකාශ රැගෙන පරීක්ෂණයක් සිදුකරන බවත්, බය නැතිව සිටින ලෙසත් ඔහු ඕනෑම දෙයකට සිටින බවත් දැනුම් දී ඇත. එසේම, දැනට කිසිදු ගැටලුවක් නොමැති බවත්, උදාර මහතා විසින් නැවතත් පහර දෙනු ඇතැයි

බියක් පවතින බවත්, තවත් වසර 2 ½ක කාලයක් එහි රැඳී සිටීමට නියමිතව ඇති බැවින් උදාර මහතාගෙන් සිදුවන අසාධාරණ හිරිහැර නතර කර දෙන ලෙස ඉල්ලමින් ඔහු සිය ප්‍රකාශය ලබා දී ඇත.

**තෙවන වින්දිතයාගේ ප්‍රකාශය:**

පල්ලෙවත්ත, දොරවදෙණිය, නාවලපිටිය ලිපිනයේ පදිංචි වයස අවුරුදු 18 වූ වික්‍රමසිංහ මුදියන්සේලාගේ චමින්ද සමන් කුමාර යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. දූරකථන සොරකමකට අදාළව 2020.04.02 වන දින නාවලපිටිය පොලිස් ස්ථානය මඟින් නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. 2020 අප්‍රේල් 06 වන දින ලබාදෙන ලද තීරණයකට අනුව වසර 03 කට වටරැක බන්ධනාගාර ගත කර ඇත. කථා කිරීමට අපහසු බවත්, එය කුඩා කල සිටම පවතින්නක් බවත් සඳහන් කර ඇත. මොහු වටරැක බන්ධනාගාරයේ බී වාට්ටුවේ රඳවා සිටින අතර එහි 32 දෙදෙනකු සිටින බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීම සිදු වූ දිනය නිශ්චිතව මතක නැති බවත්, ඔවුන් 06 දෙනෙකු හවස තුන හතර අතර ටැංකියෙන් නා තුවාය ඇද වාට්ටුවට පැමිණි බවත් පවසා ඇත. පැයකට පමණ පසු උදාර මහතා පැමිණ ඔවුන් හට පෝලිම් වන ලෙස දැනුම් දී ඇත. ටවල් ඇඳපු කට්ටිය ඉස්සරහට එන ලෙස දැනුම් දී කලිසම් නොමැති ද යන්න විමසා ඇත. එවිට කලිසම සහ ෂර්ට් එක සෝදා තිබූ බවත්, ඒවා පෙන්නන ලෙස දැනුම් දීමෙන් ඔහුට පෙන්නූ බවත් ප්‍රකාශ කර ඇත. එවිට ඔහු විසින් තෙත කලිසම ඇඳගන්නා ලෙස දැනුම් දී ඇත. තවද, " දණගහන්න කිව්වා. දණගහගෙන සිමෙන්ති කාමරයේ ඇවිදින්න කිව්වා 06 දෙනාටම. අනිත් අය පොලිමේ ඉන්නවා. විකට් පොල්ලක් අතේ තිබුණා. පිටට එකක් ගැහැව්වා. අනිත් අයටත් ගැහැව්වා. වට 20 විතර ඇවිද්දා. පස්සේ නැගිටින්න කිව්වා. එතකොට දණිස් තුවාල වෙලා ලේ එනවා .." ලෙස සඳහන් කර ඇත. පසු දින ජේලර්වරුන් පැමිණ බන්ධනාගාර රෝහල වෙතින් ප්‍රතිකාර ලබා දී ඇත. නිවෙස් වලින් බැලීමට එන බවත්, කොරෝනා හේතුවෙන් නිවසින් පැමිණ නැති බවත් සඳහන් කර ඇත. ප්‍රධාන ජේලර් මහතා විසින් පරීක්ෂණය කර ඇති අතර ඔවුන් සත්‍ය ප්‍රකාශ කර ඇත. තව ද "උදාර මහත්තයා එහෙම කරනකොට කවුරුත් කථා කලේ නැහැ. එයා වැඩිමල් කෙනෙක්නේ.." ලෙස ද ප්‍රකාශ කර ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් දණහිස් පරීක්ෂා කළ බවත්, මැකීගිය ලප කැලල් ඇති බවත් සටහන් කර ඇත.

**සිව්වන වින්දිතයාගේ ප්‍රකාශය:**

ආණමඩුව (ලිපිනය මතක නැති බව සඳහන් කර ඇත) පදිංචි වයස අවුරුදු 17 ක් වූ බෙන්දලුවා ගම්ලත්ගේ චාමර ලක්ෂාන් සෙනෙවිරත්න යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. යතුරු පැදි සොරකමක් සම්බන්ධයෙන් ආණමඩුව පොලීසිය විසින් කුරුණෑගල උසාවිය වෙත ඉදිරිපත් කර ඇත. මීගමුව සහ වැලිකඩ රඳවා සිට ඇප ලබාදීමට කිසිවකු ඉදිරිපත් නොවීම හේතුවෙන් 2019.12.16 දින වසර 03ක් සඳහා වටරැක වෙත යොමු කර ඇත. අදාළ සිදුවීම වූ දින අමතක බවත් සඳහන් කර ඇත. මොවුන් මීට පෙර උඩු මහලේ සිට ඇති අතර දැනට බී වාට්ටුවෙහි සිටින බවත්, දිනපතා සවස ස්නානය කරන බවත්, මෙම සිදුවීම සිදුවූ දින පස්වරු. 3.00 ට 3.30 ට පමණ නාන කාමරයට රැඳවියන් 12 ක් ගොස් ඇති බවත්, ස්නානය කිරීමෙන් පසුව ටවල් ඇඳගෙන පැමිණ ඇති බවත්, එක් කලිසමක් පමණක් ඇති බැවින් එය සෝදා තිබූ නිසා ටවල් ඇඳගෙන සිටි බවත් සඳහන් කර ඇත. සවස 4.00 ට පමණ උදාර මහතා පැමිණ පෝලිම් වන ලෙස දැනුම් දී ඇත. කලිසම් ඇඳගෙන පොලිම් විය යුතු නමුත්, ඒ අවස්ථාවේදී කලිසම් වේලී නොතිබූ හෙයින් ටවල් ඇඳගෙන 05 දෙනෙකු සිටි බවත්, ටවල් ඇඳන් සිටි අය වෙනම පෝලිම් කළ බවත් ප්‍රකාශ කර ඇත. තවද, "අපිට දණගහන්න කිව්වා. දණගහලා එහාට මෙහාට ඇවිදින්න කිව්වා. පොල්ලක් (ක්‍රිකට් පොල්ලක්) අරගෙන ආවේ. එහෙට මෙහෙට දණගානවා. අනිත් අය හිටගෙන ඉන්නවා. මට එකක් ගහන්න පොල්ල උස්සන කොට එතන රෙදි වැලක වැදුනා. වැදිලා එහි තිබ්බ යට කලිසමක් බිමට වැටුණා. එය අන්තෝනි සුරේෂ්ගේ. රෙදිවැල තිබුනේ වාට්ටුව ඇතුලේ. යට කලිසම් අයිතිකාරයාට එන්න කියලා එය එයාගෙ ඔළුවට දාගන්න කිව්වා. එහෙට මෙහෙට එයාවත් දණගැව්වා.." යැයි ප්‍රකාශ කර ඇත. පසුව සිව් දෙනකු නැගිට්ටවා අන්තෝනි සුරේෂ් සහ තමාට එලෙසම සිටින ලෙස දැන්වූ බවත්, දණහිස් තුවාල වූ අය පමණක් නැගිට්ටවූ බවත්, පසුව ඉඳගෙන සිටගෙන සිටින ක්‍රියාකාරකමක නිරතකර අන් අය යැවූ බවත් පවසා ඇත. තවද, "මම විතරක් ඉතිරි වුණා. උදාර මහතා පොල්ලෙන් කකුලට ගැහැව්වා දෙකක් ඇවිදින්න කියලා. කම්මුලට ගහනකොට අරක්කු ගඳක් ආවා. මාව නැගිට්ටවලා කැම පෝලීමට

ගෙනියන්න හදලා තුවාය ගලවා දැම්මා. දැං නිර්වස්ත්‍රයෙන් ආමි ට්‍රේනින් කියලා ලෙෆ්ට් රයිට් කිය කියා ඇවිදින්න කිව්වා. වාට්ටුව තුළ ටොයිලට් එක ළඟට සහ දොර ළඟට. සේරම 36 දෙනෙක් බලාගෙන කවුරුත් කතා කරේ නෑ.. නිලධාරීන් දෙදෙනෙකු වාට්ටුවේ සිටියා එයාලට බැනලා එලියට යැව්වා.." යනුවෙන් ප්‍රකාශ කර ඇත. පසු දින ප්‍රධාන ජේලර් මහතා පැමිණ ඇත්ත කියන්න යැයි සඳහන් කර කාර්යාලයට රැගෙන ගොස් තුවාල ජායාරූප ගෙන, අනතුරුව බන්ධනාගාර රෝහලට ඉදිරිපත් කර ඇත. බන්ධනාගාර රෝහලේ සිට එන විට උදාර ජේලර්ගේ මිතුරකු වන ජේලර් එරංග මහතා " සිද්ධියට අදාලව මොනවද කිව්වේ" අසා ඇත. ඇත්ත කිවූ බව එරංග මහතාට ප්‍රකාශ කර ඇත. එවිට ඔහු "තව කොච්චර කල් අච්චු තියෙනවාද" යනුවෙන් විමසා ඇත. අවුරුදු 02 ක් තිබෙන බව සඳහන් කළ පසු "එහෙනම් ඉදලා බලපං අමාරු වෙයි" යනුවෙන් පවසා ඇත. ප්‍රධාන ජේලර් මහතා විසින් උදාර මහතා නැවත වාට්ටුවට එවීම එක නතර කර ඇති බවත්, ප්‍රධාන ජේලර් විසින් අදාළ සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකරන බවත් සඳහන් කර ඇත.

**පස්වන වින්දිතයාගේ ප්‍රකාශය:**

අංක : 132/369, ද මෙල් මාවත, ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14 ලිපිනයේ පදිංචි වයස අවුරුදු 17ක් වූ මුහම්මදු ෆාරිස් මුහම්මද් ෆස්ලාන් යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. පාසල් අධ්‍යාපනය අතර මඟ නවතා පිටකොටුව නාට්ටාමි වැඩ වල නිරතව පසුව වෙළෙඳ සැලක රැකියාවක නිරතව ඇත. 2019 වර්ෂයේ අගෝස්තු මස සිට අයිස් මත්ද්‍රව්‍ය භාවිතයට මිතුරන් සමඟ හුරු වී ඇත. මිතුරන් සමඟ එම කාලය තුළ කොළඹ අවට ප්‍රදේශයේ සොරකම් කිරීම ආරම්භ කර ඇත. 2019.10.20 හෝ 21 ආසන්න දිනකදී සොරකමක් සම්බන්ධයෙන් කොටහේන පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය වෙත යොමු කර අනතුරුව වටරැක බන්ධනාගාරය වෙත යොමු කර ඇත. 2020 වර්ෂයේ මැයි මස දිනක දී ඔවුන් ස්නානය කරමින් සිට ඇත. උදාර මහතා ඇතුලට පැමිණ පෝලිම් වෙන ලෙසත්, ටවල් ඇඳගෙන සිටින අයට ඉදිරියට එන ලෙසත් දන්වා ඇත. මොහු ද ඉදිරියට ගොස් ඇත. තවද, පහරදීම සම්බන්ධව "ඔහු මට අතින් පයින් ගැහුවා. දණ ගහන්න නියෝග කරා. එලෙස දණගහගෙන ඇවිදින්න කිව්වා. පසුව දුවන්න කිව්වා මගේ කකුල් රිදෙනකොට නවතින්න මම හෙමීට ගියා. මගේ පිටුපසට ගහ ගහ ආවා. පසුව මාව නැගිට්ටුවා. කකුල්වල තුවාල පේන්න තිබුනේ නෑ. නැවත මට දණගහගෙන ඇවිදින්න කිව්වා.. මම වට 05ක් ගියා. මාගේ කකුලට ගහලා ගහලා නැගිටින්න කිව්වා" ලෙස සඳහන් කර ඇත. උදාර මහතා එපමණක් සිදුකර ඇති බවත්, බන්ධනාගාර රෝහල වෙතින් තුවාල සඳහා බෙහෙත් ලබාදුන් බවත් සඳහන් කර ඇත.

**සයවන වින්දිතයාගේ ප්‍රකාශය:**

අංක: 77/29, වැබඩමුල්ල ලිපිනයේ පදිංචි වයස අවුරුදු 18 ක් වූ ඉෂාරගේ සංජු ප්‍රදීප් යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. 2019.03.22 වන දින අත්තනගල්ල අධිකරණ නියෝගය අනුව සොරකම් කිරීමේ වරදකට වටරැක රැඳවුම් මධ්‍යස්ථානය වෙත යොමු කර ඇත. 2020 මැයි මස දිනක සවස් වෙලාවේ දී ස්නානය සඳහා ගොස් නැවත පැමිණ ඇත. එම අවස්ථාවේ දී උදාර මහතා පෝලිමට එන ලෙස දැනුම් දී ඇත. ටවල් ඇඳගෙන හිටපු පිරිසට එන ලෙස දැනුම් දී ඇත. ඔවුන් ඉදිරියට ගොස් ඇත. පසුව ඔහුට බැන කලිසමක් ඇඳගෙන එන ලෙස දැනුම් දී ඇත. පසුව "දණගහන්න කිව්වා. දණ ගහගෙන එහාට මෙහාට ඇතිවෙනකම් ඇවිදින්න කිව්වා. පසුව කකුල දණහිස් දෙකම තුවාල සිදුවුණා. පසුව ඔහුගේ බූට්ස් වලින් මාගේ පස්ස පැත්තට ගැහුවා" ලෙස ද සඳහන් කර ඇත. පසුව පෝලිම ඉදිරියට නැගිටලා එන ලෙසට බැනවැදී ඔවුන් පොලීමට දමා උදාර මහතා වාඩිවී සිට ඇත. උදාර මහතා විසින් "ඔහු සමඟ ගහගන්න කැමති, පුළුවන් කට්ටියට ඉස්සර එන ලෙස" දැනුම් දී ඇත. ඔවුන් කිසිවකුත් ඉදිරිපත් නොවූ බැවින් නැවත බැණ වැදී ඇත. පසුව ප්‍රධාන ජේලර් මහතා පැමිණ ඒ පිළිබඳව විමසීම් කර ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර අනතුරුව බන්ධනාගාර රෝහලට ඉදිරිපත් කර තුවාල වලට බෙහෙත් ලබා දී ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

2020 සැප්තැම්බර් මස 29 වන දින 1 සිට 4 දක්වා වන වගඋත්තරකරුවන් සහ 2024 ජූලි මස 10 වන දින 5 වන වගඋත්තරකරු කොමිෂන් සභාව වෙත කැඳවා ප්‍රකාශ සටහන් කර ඇත.

**1වන වගඋත්තරකරු වන එම්. එල් උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්)**

මීගහවලලේකම්ලාගේ ලක්ෂිත උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට අනුව, 2020.05.17 වන දින පෙ.ව.8.00 ට වටරැක බන්ධනාගාරයට සේවයට වාර්තා කර ඇත. එදින බී2 වාට්ටුව භාර ජේලර් ලෙස කටයුතු කිරීමට රාජකාරී පැවරී ඇත. එහි ළමයින් 36 දෙනෙකු රඳවා ඇති අතර ඔවුන්ගේ දෛනික රාජකාරි අධීක්ෂණය ඔහු යටතේ සිදුවන බවත්, තරුණ වරදකරුවන්ගේ මානසික සංවර්ධන කටයුතු භාර නිලධාරී ලෙස ද ඔහු පත්කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. සිදුවීමට අදාළ ළමුන් මූලිකව බී1 වාට්ටුවේ සිර මැදිරි වල රඳවා තිබුණු බවත්, පසුව බී2 වාට්ටුවට ඇතුළත් කළ බවත්, එලෙස ඇතුළත් කොට දින දෙකකට පසු මෙම ප්‍රශ්නය ඇති වූ බවත් ප්‍රකාශ කර ඇත.

දිනපතා ළමුන් සමඟ උදේ 9.00 සිට දහවල් 12.00 වන තෙක් ක්‍රීඩා කටයුතු වල නිරත වන අතර දවල් 12.30 වන විට ආහාර ලබාදීමත්, අනතුරුව රූපවාහිනී බැලීමට අවස්ථාව ලබාදී ඇති අතර පව.2.00 - 2.30 අතර කාලයේ දී ස්නානය සඳහා යොමු කර පව.4.30 පමණ වන විට රාත්‍රී කෑම ලබාදීම සිදු කරන බව සඳහන් කර ඇත. පසුව ප.ව. 5.00 ට භාර ගැනීමේ ජේලර්වරයා සවස ගණන් ගැනීම සිදු කරන බවත්, සවස 5.30 වන විට ඔහුගේ රාජකාරි අවසන් කරන බවත්, සිදුවීමට අදාළ දිනයේ දෛනික රාජකාරී ඒ ආකාරයෙන් සිදු වූ බවත්, එදින දහවල් රාජකාරි සඳහා නිලධාරීන් දෙදෙනෙක් තමාට දී තිබූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව බී2 වාට්ටු භාර නියාමක ලෙස කේ.අයි.ඩී පෙරේරා , කාර්ය භාර නිලධාරි ලෙස සැරයන් එම්.ඩී.පෙරේරා රාජකාරි සඳහා යොදවා තිබූ බවත් දක්වා ඇත. තමා සහ සැරයන් පෙරේරා පහත මාලයේ බී1 අංශයේ දොරටුව අසල මේසයේ ද, බී2 වාට්ටුව භාර නිලධාරී ඉහළ මාලයේ බී2 අංශයේ දොරටුව අසල මේසයේ රැඳී සිටි බවත් සඳහන් කර ඇත. බී2 අංශයේ අධික මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ කිහිප දෙනෙකු සිටින බවත්, බන්ධ විනිශ්චය මගින් දඬුවම් ලද එක ළමයෙකුට විකෘති ලිංගික හැසිරීම් තිබෙන බවත් 1 වන වගඋත්තරකරු විසින් පරීක්ෂණ අවස්ථාවේදී ප්‍රකාශ කර ඇත.

මෙම තරුණ රැඳවියන් ස්නානය කරන අවස්ථාවේ දී විශාල සෝෂාවක් ඇසුණු බවත්, ඒ අවස්ථාව වන විට පහළ මහලේ සාමාන්‍ය සිරකරුවන් 50 කට ආසන්න සංඛ්‍යාවක් සිට ඇති බවත්, වාට්ටු භාර නියාමක කේ.අයි.ඩී. පෙරේරා විසින් නිතරම නිශ්ශබ්ද වෙන ලෙස නියෝග දී ඇති බව තමාට ඇසී ඇති බවත් ප්‍රකාශ කර ඇත. පසුගිය කාල වකවානුව තුළ ස්නානය කිරීමට ගිය අවස්ථාවේදී ඔළු පලාගෙන තුවාල කරගත් අවස්ථා ද දකින්නට ලැබුණු බවත්, මෙම තත්ත්වය හේතුවෙන් කලබලකාරී තත්වයක් හඳුනා ගැනීමට මුළු අංශයම වැසෙන සේ දොරක් ඇති අතර එම දොර කාර්ය භාර නිලධාරි මගින් වසා ඉහළ මහලයට ගිය බවත්, එම අවස්ථාවේදී වාට්ටු භාර නිලධාරි දොර ළඟ සිට නිශ්ශබ්ද කිරීමට උත්සාහ ගත් අතර අනතුරුව තමා විසින් වාට්ටු භාර නිලධාරි හට කියා දොර විවෘත කරගෙන තමා සහ කාර්ය භාර නිලධාරී ඇතුලට ගිය පසු වාට්ටු භාර නිලධාරී හට දොර ලොක් කරගෙන එළියෙන් සිටින ලෙස දැන්වූ බවත් සඳහන් කර ඇත.

තමා ඇතුළට යන අවස්ථාවේදී ඇතුලේ වාඩි වී සිටි ළමයි අඩු බව දැනුණු අතර සොයා බලන අවස්ථාවේ දී නාන කාමරයේ කළහකාරි ලෙස නිරුවතින් අසභ්‍ය වචන කියමින් කළහ කර ගනිමින් සිටි බවත්, ඔවුන් හට වාට්ටුවට යන ලෙසත් ඇඳුම් ඇඳ ගන්නා ලෙසත් දන්වා වාඩි කරවූ බවත්, සම්පූර්ණ විනාඩි 45 ක් පමණ කාලයක් අවවාද කිරීම් සහ උපදෙස් මාලා පවත්වා අනතුරුව පහළට පැමිණි බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. රාත්‍රී ආහාරයට නියමිත වේලාව ප.ව. 4.30 වන බැවින් ළමුන් පහළට ගෙන්වා රාත්‍රි ආහාරය ලබා දුන් බවත්, ප්‍රධාන ජේලර්වරයා එම ස්ථානයට පැමිණි බවත්, සුපුරුදු පරිදි රාත්‍රී වැසීමේ ජේලර් රාත්‍රී සේවා නිලධාරී සමඟ වාට්ටු සංකීර්ණය වසා දැමූ බවත්, අනතුරුව දිවා සේවා නිලධාරී සමග තමා රාජකාරි අවසන් කර කඳවුර භූමියේම තිබෙන තනිකඩ නිල නිවසට ගිය බවත් ප්‍රකාශ කර ඇත.

පසු දින දහවල් රාජකාරි නියමිත වූ හෙයින් පෙ.ව. 11.30 පමණ වනතෙක් බැරැක්කයේ රැඳී සිට ඇති අතර එම අවස්ථාවේදී කාර්යාලයේ සිරකරුවෙක් මගින් ප්‍රධාන ජේලර් මහතා තමා කැඳවා, පරීක්ෂණයක් සිදුකළ යුතු බව දැනුම් දුන් බව 1 වන වගඋත්තරතරු විසින් ප්‍රකාශ කර ඇත. එදින සවස අදාළ සිද්ධිය

සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශ සිදුකළ ළමයි දෙදෙනෙකුට වාට්ටුවේ සිටි අනික් ළමයි පහරදී තිබෙන බවත්, ප්‍රධාන ජේලර් මහතාට ඒ බව දැන් වූ නමුත්, කිසිදු පියවරක් ගෙන නැති බවත් සඳහන් කර ඇත. 2020.05.19 වන දින මූලික පරීක්ෂණය සඳහා තමාගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත්, එහිදී පදනම් විරහිත චෝදනා තමාට ඉදිරිපත් කර ඇති බවත්, පසුව අනාවරණය වූ පරිදි ළමයින් කාර්යාලයට ගෙන ගොස් කාර්යාලයේ සේවයේ යුතු නිලධාරීන් එළියට දමා ළමයින්ගෙන් තනි තනිවම ප්‍රකාශ ලබාගෙන ඇති බවත් සඳහන් කර ඇත.

තවද, බී1 වාට්ටුවේ තරුණ රැඳවියන් සිරගත විම වැළැක්වීම සඳහා බී2 වාට්ටුවට ඇතුළත් කළ දින වකවානු ඔහුට හරිහැටි අමතක බව සඳහන් කර ඇත. ළමයින්ව ස්නානය සඳහා යොමු කිරීමේදී යම් අධීක්ෂණයක් යටතේ සිදු වන නමුත්, නිලධාරියා වාට්ටුව ඇතුළට නොයන බවත්, රැඳවියන් අතරින් වැඩි කාලයක් රැඳී සිටින රැඳවියෙක් අධීක්ෂණය සඳහා යොමු කර වාට්ටු භාර නිලධාරී එළියේ සිටින බවත් සඳහන් කර ඇත. ඔහු විසින්ම බී වාට්ටුවට ඇතුලු වූ බවත්, එළියේ සිට අවවාද කර ඝෝෂාව වැඩි නිසා ඇතුලට ගිය බවත්, වාට්ටු භාර නිලධාරි හට රැඳවියන් නිශ්ශබ්ද කර ගැනීමට නොහැකි බවට කියා සිටි බැවින් එසේ ඇතුලු වීමට සිදුවූ බවත් සඳහන් කර ඇත. මෙම කාලය තුළ ළමයින් පාලනය කර ගැනීම සඳහා කලහ කරගත් තැනට ගොස් පසුව ළමයි නාන තැනින් වාට්ටුව ඇතුළට ගෙනවිත් වාඩි වීමට අණ කළ බවත්, ළමයින් කොට කලිසම් සහ ටවල් (තුවා) ඇඳන් සිටි බවත් සඳහන් කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තවදුරටත් කරුණු විමසීමේදී අවවාද කිරීමක් පමණක් සිදු කළ බවත්, බී 2 වාට්ටුවේ ළමයි 06 දෙනෙකුගේ පමණක් එකම ආකාරයෙන් දණහිස් තුවාල වූයේ කෙසේද යන්න නොදන්නා බවත්, දණහිස් තුවාල වී තිබීම තමා නොදුටු බවත් 1වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. 2020.05.18 වන දින මෙම ළමයි සම්බන්ධයෙන් යම් සිදුවීමක් වී ඇති බැවින් මූලික පරීක්ෂණයක් කිරීමට ප්‍රධාන ජේලර් මහතාට නියෝග ලැබී තිබෙන බව සඳහන් කිරීමේ දී මේ පිළිබඳව කරුණු දැනගත් බවත් සඳහන් කර ඇත. එම ළමුන් වටරැක බන්ධනාගාර රෝහලට ඇතුළත්ව නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති බව නොදන්නා බවත් සඳහන් කර ඇත.

### 2 වන වගඋත්තරකරු වන එම්.ඩී. පෙරේරා (කාර්ය භාර නිලධාරි)

මීමනගේ දයාපාල පෙරේරා (කාර්ය භාර නිලධාරි) නිලධාරියා විසින් 2020.09.29 වන දින කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට අනුව, 2020.05.17 දින පෙ.ව. 08.00ට ප්‍රධාන ජේලර් විසින් බී1 සහ බී2 වාට්ටු වල කාර්ය භාර නිලධාරි ලෙස ඔහු හට රාජකාරී පවරා ඇත. එකී රාජකාරියේ නිරතව සිටිය දී ප.ව. 2.30 - 3.00ට පමණ බී වාට්ටුවේ ඝෝෂාවක් ඇසී උදාර මහතාට ඒ පිළිබඳව දැනුම් දී ඔහු සමඟ වාට්ටුවට ගොස් ඇත. එම අවස්ථාවේ නාන තැන කට්ටිය සිටි බවත්, වාට්ටුව භාර මහතා පෝලිම් කර බලමු ද ලෙස ඇසූ බවත්, ඒ අනුව පෝලිම් කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. එම පැත්තට බන්ධනාගාර අධිකාරිතුමාගේ නියෝගය පරිදි ජේලර් උදාර පත්කර ඇති බැවින් උදාර මහතා වාට්ටුවේ සිටිය දී තමා පහළට පැමිණි බවත් සඳහන් කර ඇත. නාන ටැංකිය අසල ළමුන් 10ක් 15ක් සිටි බවත්, අනෙක් අය ඇතුලේ සිටි බවත්, පෝලිම් වන ලෙස උදාර මහතා කියූ පසු 20ක් පමණ පෝලිම් වූ බවත්, ස්නානය කර අවසන්ව සිටි අය ඇඳුම් ඇද සිටි බවත්, පෝලිම් කළ පසු කුමක් වූවාද යන්න තමා නොදන්නා බවත්, විනාඩි 10කින් පසු තමා පහළට පැමිණි බවත් සඳහන් කර ඇත. ඇතුලේ සිදුවීම් එළියට නොපෙනෙන බවත්, ඔහු අතැතිව යතුර ඇති බවත්, උදාර මහතා එනතුරු තමා පහල සිටි බවත්, උදාර මහතා විනාඩි 15 - 20කට පසු පැමිණි බවත්, ළමුන්ගේ තුවාල පිළිබඳව කිසිවකු දැනුම් නොදුන් බවත්, රාත්‍රී සේවයෙන් පසුව තමා සිදුවීම දැනගත් බවත් ප්‍රකාශ කර ඇත. ළමුන් රළු පොළවක ඇවිද්දවීමක් සබැඳිව තමුන් කිසිවක් නොදන්නා බව ද සඳහන් කර ඇත.

### 3 වන වගඋත්තරකරු වන කේ. අයි. ඩී. පෙරේරා (වාට්ටු භාර නියාමක)

කළුබෝවිලගේ ඉරංග දිල්ශාන් පෙරේරා (වාට්ටු භාර නියාමක) නිලධාරියා විසින් 2020.09.29 වන දින කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට අනුව, 2020.05.17 වන දින වටරැක බන්ධනාගාරයේ බී2 වාට්ටුව භාර නිලධාරී ලෙස පෙ.ව. 8.00 ට රාජකාරියට වාර්තා කර ඇත. එදින සවස 2.30ත් 3.00ත් අතර

කාලයේදී රැඳවියන් ස්නානය සඳහා ගොස් තිබූ බවත්, එම අවස්ථාවේ දී විශාල ඝෝෂාවක් ඇති වූ බවත්, ඒ අනුව නිශ්ශබ්ද වන ලෙසට රැඳවියන්හට තමා දැන් වූ නමුත්, ඔවුන්ගේ ඝෝෂාව නතර නොවූ බවත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත. එදින බී වාට්ටුව භාර ජේලර් උදාර මහතා වන අතර ඔහු පහත මාලයේ සිට ඇති බවත්, ළමයින්ගේ ඝෝෂාව වැඩි නිසා උදාර මහතාට තමා කතා කළ බවත්, ඒ අනුව උදාර මහතා සමග වාට්ටු කාර්යභාර නිලධාරී දයාපාල මහතාත් පැමිණ දොර ළඟ සිට ශබ්දය අඩු කරන ලෙස අණ කළ බවත්, අනතුරුව තමාට දොර අරින ලෙස යතුර භාර දුන් හෙයින් තමා විසින් දොර විවෘත කිරීමෙන් පසු ඔවුන් දෙදෙනා වාට්ටුව ඇතුළට ගිය පසු තමා දොර වසා අගුළු දැමූ බවත් සඳහන් කර ඇත.

ඇතුලේ සිටි සියළුම දෙනා පෝලිම් කළ බවත්, දයාපාල මහතා විසින් ළමුන් ගණන් කර එහි ළමයින් අඩු වූ බවත්, ඔවුන් නාන තැන කෑගසමින් ස්නානය කරමින් සිටි බවත් පවසා ඇත. පෝලිම් වූ කට්ටියට ඉන්න තැන වාඩි වෙන ලෙසත්, ස්නානය කරමින් සිටි අයට එළියට එන ලෙස දැන්වූ නමුත් සියළු දෙනා එකවර එළියට නොපැමිණි බවත්, ස්නානය කරන ස්ථානයට යන තැන ඔවුන් එන එන අය වාඩි කරවූ බවත්, කෑ ගසන්නේ ඇයිද යන්න විමසා අවවාද කොට ඉදිරි සමිති වාර ගැන විස්තර විමසීම් කළ බවත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත. ළමයින්ගේ අංශ භාර වැඩ කටයුතු උදාර මහතා සිදුකරන බැවින් තමා එළියේ පුටුවෙන් වාඩි වී දොරටු පොත්වල වැඩ කටයුතු කරමින් සිටි බව සඳහන් කර ඇත. අනතුරුව දයාපාල මහතා එළියට පැමිණි බවත්, උදාර මහතා ඇතුලේ සිට ළමයින්ට අවවාද කරමින් සිට ඇති බවත්, ප.ව. 3.45ට පමණ පැමිණි උදාර මහතාට පිටවීමට දොරටුව විවෘත කර ඇත. අනතුරුව කෑම ලබාදීම සඳහා ළමයින් එළියට ගත් බවත්, ඒ අවස්ථාවේදී උදාර මහතා පහළට ගිය බවත්, දයාපාල මහතා එම ස්ථානයේ රැඳී සිටි බවත් සඳහන් කර ඇත. ඔහු විසින් ළමුන්ගෙන් උදාර මහතා කිව්වේ මොකද්ද කියා විමසා ඇත. වැසිකිළි අසල සිට උදාර මහතා පැවසූ කරුණු තමාට නොඇසුණු බැවින් එසේ විමසූ බව ද සඳහන් කර ඇත. වාට්ටුවේ පිරිසිදුකම සහ හැසිරිය යුතු ආකාරය ගැන උපදෙස්, කෑගහන්න රණ්ඩු වෙන්න එපා සහ ඉදිරි සමිති වාර සඳහා අවශ්‍ය දේවල් ළමුන් සමඟ කතා කර ඇති බව ළමුන් සඳහන් කළ බවත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත. සියලුම ළමයින් කෑම රැගෙන නැවත ඇතුලට ගිය බවත්, මෙම සිදුවීම සම්බන්ධයෙන් ඊට පසු දින තමා දැනගත් බවත්, ළමුන් කිසිවක් සඳහන් කර නොමැති බවත්, එදින රාත්‍රී සේවා මුර නිලධාරී ප.ව. 5.00 ට පැමිණ වාට්ටු පරීක්ෂා කර ළමුන් ගණන් කර රාජකාරී භාර ගෙන ඇති බවත් සඳහන් කර ඇත. එදින පස්වරුවේ රාජකාරී භාරදුන් නිලධාරියා අමතක බවත්, එදින බී2 වාට්ටුවේ යතුර භාරව සිටියේ සැරයන් දයාපාල මහතා බවත්, වාට්ටුවේ දොර වසා බී වාට්ටුවේ කොරිඩෝවේ සිටි බවත්, ඔහු සිටි ස්ථානයට වාට්ටුව ඇතුලේ සිදුවන කිසිවක් නොපෙනෙන බවත් සඳහන් කර ඇත. බී2 වාට්ටුව භාර නිලධාරියා ලෙසට එදින රාජකාරී පැවරී තිබූ අවස්ථාවක වෙනත් නිලධාරීන් වාට්ටුවට ඇතුල්වීමේදී ඔහු සුපරික්ෂාකාරී විය යුතු බවත්, බී2 වාට්ටුව රාජකාරි සඳහා දයාපාල මහතා සහ ජේලර් උදාර සිටි බවත් සඳහන් කර ඇත.

2020.05.18 සහ 2020.05.19 දිනයන් නිවාඩු දිනයන් බැවින් 2020.05.20 වන දින රාජකාරියට පැමිණීමෙන් අනතුරුව ළමයින්ට සිදු වූ සිද්ධිය පිළිබඳව තමා දැනගත් බවත්, ළමයින්ගේ දණහිස්වල තුවාල සම්බන්ධයෙන් කිසිත් නොදන්නා බවත්, සිද්ධිය වූ දින කිසිවක් නොදුටු බවත් සඳහන් කර ඇත. සැරයන් දයාපාල සහ ජේලර් උදාර සුමනපාල බී2 වාට්ටුවේ විනාඩි 20ක් පමණ රැඳී සිටි බවත්, එම වාට්ටුවෙහි පොළව සහ පිටත සුදු සිමෙන්තියෙන් මැද ඇති බවත්, සිමෙන්ති දමා කාලයක් ගතව ඇති බැවින් යම් තරමක කඩතොළු ගතියක් පවතින බවත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත.

**4 වන වගඋත්තරකරු වන ඩී.එම්. නිමල් ශාන්ත (සහකාර බන්ධනාගාර අධිකාරී)**

දෙව්පුරආරච්චිගේ මොහාන්දාස් නිමල් ශාන්ත (සහකාර බන්ධනාගාර අධිකාරී) නිලධාරියා විසින් 2020.09.29 වන දින කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට අනුව, 2019.10.03 වන දින සිට මේ දක්වා වටරැක බන්ධනාගාරයට අනුයුක්තව රාජකාරී කරනු ලබයි. වටරැක බන්ධනාගාරයට අනුයුක්ත සුනීත පාසලට අයත් ළමා රැඳවියන් 30කට ආසන්න ප්‍රමාණයක් බී2 වාට්ටුවේ රඳවා ඇති බවත්, 2020.05.18 දින රාජකාරී කටයුත්තක් සඳහා බන්ධනාගාර මූලස්ථානයට යන අතරතුර දී එවකට බන්ධනාගාර කොමසාරිස් (පාලන) බන්දුල ජයසූරිය මහතා විසින දෙන ලද දැනුම් දීමක් මත අදාළ කාරණය අනාවරණය වූ බවත් සඳහන් කර ඇත.

2020.05.17 දිනට ආසන්න දිනක දී රැඳීසිටි සිසු රැඳවියන් කිහිප දෙනෙකුට සිදුවූවා යැයි කියන විනය විරෝධි ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහු විසින් ආයතනයේ ප්‍රධාන ජේලර් යොදවා මූලික විමර්ශනයක් සිදුකළ බව ප්‍රකාශ කර ඇත. මෙම සිසු දරුවන්ගේ අවශ්‍යා කටයුතු සොයා බැලීම සඳහා යොදවා තිබූ දෙවන පෙළ ජේලර්. එම්. එල්.එස්.උදාර සුමනපාල විසින් රැඳවියන් කිහිප දෙනෙකු දණ ගැස්වීම මත ක්‍රියාවක් සිදුව ඇති බවත්, එම දණගැස්වීම මත එම රැඳවියන්ගේ දණහිස් වල සිරීම් තුවාල කැළැල් කිහිපයක් තිබූ බව නිරීක්ෂණය වූ බවත් දක්වා ඇත. මෙම සිදුවීමට අදාළව සිදු කරන ලද විමර්ශනයේ දී මෙම සිසු දරුවන් විනය විරෝධී හැසිරීම් රටාවක් අනුගමනය කරමින් සිටිය දී අදාළ ජේලර්වරයා විසින් එම තත්ත්වය පාලනය කිරීම සඳහා අවම බලය පාවිච්චි කර පාලනය කිරීමට යාමේ දී මෙය සිදුව ඇති බව අනාවරණය වී ඇති බව සඳහන් කර ඇත. කෙසේ නමුත්, අගතියට පත්වූ තරුණ රැඳවියන්ගේ දණහිස්වල සීරීම් තුවාල කැළැල් තිබූ බැවින් අදාළ ජේලර්වරයාට විරුද්ධව ආයතන සංග්‍රහයේ II වන උපලේඛනය යටතේ විනය පියවර ගැනීමට නිර්දේශ කරමින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත විනය පියවර සඳහා වාර්තා කළ බවත් සඳහන් කර ඇත.

ළමා රැඳවියන් සිදු කරනු ලැබූ විනය විරෝධී ක්‍රියාව ලෙස ප.ව. 5.00ට පමණ රැඳවියන් ජලය ස්නානය කිරීමේ කටයුතු ජේලර් උදාර සුමනපාල ඉදිරියේ සිදු වූ අවස්ථාවේදී තරුණ වරදකරුවන් කිහිප දෙනෙකු ඉතා සෝෂාකාරි ලෙස හා කළහකාරි ලෙස හැසිරෙමින් දබර කර ගැනීමක් මෙම සිද්ධියට පාදක වී ඇති බවත්, ඒ අවස්ථාවේදී ජේලර්වරයාගේ අණට අකීකරුව මොවුන් හැසිරී ඇති බවත් සඳහන් කර ඇත. අදාළ තරුණ රැඳවියන්ගේ හැසිරීම් රටාව සාමාන්‍ය තත්ත්වයෙන් ඔබ්බට ගොස් තිබූ බැවින් එම තත්ත්වය පාලනය කිරීමේ දී ජේලර්වරයා විසින් අවම බලය ක්‍රියාත්මක කිරීම සිදු කර ඇති බවත්, ඕනෑම රැඳවියෙක් සාමාන්‍ය හැසිරීම් රටාවෙන් වෙනස්ව හැසිරෙනවා නම් ඔහුව මර්ධනය කිරීමට ගන්නා ක්‍රියාමාර්ග අවම බලය ලෙස සඳහන් කළ හැකි බවත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත.මෙම සිදුවීම වාට්ටුව තුළම සිදුවූවක් බවත්, වාට්ටුවෙන් බැහැරව රළු පොළොවක් තිබෙන බවත්, මෙම සිදුවීමට මුහුණ දුන් රැඳවියන් හෝමාගම රජයේ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

**5 වන වගඋත්තරකරු වන අජිත් පල්ලියගේ ( එවකට ප්‍රධාන ජේලර්)**

මෙම ප්‍රශ්නගත සිදුවීමට අදාළව එවකට තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුරෙහි ප්‍රධාන ජෙලර් අජිත් පල්ලියගේ විසින් කරන ලද මූලික පරික්ෂණය වාර්තාවේ මෙසේ සඳහන්ව ඇත.

2020.05.18 දින පෙ.ව 09.15ට පමණ බන්ධනාගාර කොමසාරිස් පාලන කේ.ඩබ්.බී. ජයසිංහ මහතා විසින් වටරැක බන්ධනාගාරයේ දුරකථනයට පණිවිඩයක් ගෙන ප්‍රධාන ජෙලර් අජිත් පල්ලියගේ වෙත 2020.05.17 දින ඔබ ආයතනයේ රඳවා සිටින තරුණ වරදකරුවන් කිහිප දෙනෙකුට ජේලර්වරයකු විසින් පහරදීමක් සිදුකර ඇති බවට කරුණු වාර්තා වන බවත්, එම ජේලර්වරයා වන්නේ උදාර කියන ජේලර්වරයක් බවත්, එබැවින් වහාම සොයා බලා මූලික විමර්ශනයක් කරන ලෙසත්, එම තුවාල ඇති ළමයින්ගේ ඡායාරූප ඔහු වෙත එවන ලෙසත්, එම ළමයින් වහාම වෛද්‍යවරයකු වෙත යොමු කරන ලෙසත් නියෝග කර ඇත. තවද, උක්ත මූලික විමර්ශනය ප්‍රධාන ජේලර් වන අජිත් පල්ලියගේ විසින්ම කළ යුතු බවත් දන්වා ඇති අතර මේ සබැඳිව ආයතනයේ අධිකාරීතුමා වෙත දන්වා ඔහුගේ උපදෙස් මත මූලික විමර්ශනය එම අවස්ථාවේ දී ම ආරම්භ කර ඇත.

මූලික විමර්ශනය සඳහා දෙවන පෙළ ජේලර් එම්. එල්.එල්.උදාර සුමනපාල, දෙවන පෙළ ජේලර් ශානක සේනාරත්න, සැරයන් එම්.ඩී පෙරේරා (දයාපාල), නියාමක කේ.අයි.ඩී පෙරේරා සහ සි - 08 සංජු ප්‍රදීප්, සි-28 චාමර ලක්ෂාන්, ඩි - 05 චමින්ද සමන් කුමාර, සී- 20 රශ්මි කාංචන, ඩි - 01 ෆරිස් මෙහොමඩ් පස්ලාන්, සී 17- අන්තෝනි සුරෙෂ්, බී -19 නිසල් අසංක, පි - 16 ඒ.ඩබ්. ප්‍රමොද් සම්පත්, සී -10 බී.ලක්ෂ්මිත ෂෙහාන් පෙරේරා, සි 06 -ජී.ඩබ්. සුපුන්, සි -15 සී - 25 තිළින මධුෂංක යන අයගේ ප්‍රකාශ ලබා ගෙන ඇත.

ඉහතින් නම් කළ තරුණ රැඳවියන් ලබාදුන් ප්‍රකාශ අතරින් සි-20 රෂ්මි කාංචන හැර සියලුම තරුණ රැඳවියන් ප්‍රකාශ කර ඇති පරිදි 2020.05.17 දින ප.ව. 3.30 ත් 4.00 ත් අතර වේලාව තුල බී2 වාට්ටුවේ වසා තිබූ දොර විවෘත කර ජෙලර් උදාර මහතා ස්ටම්ප් කූරක් ද අතැතිව එම වාට්ටුවට කෑ ගසාගෙන ඇතුලු වී සියලුම අයට පෝලිම් වෙයල්ලා කියමින් ටවල් (තුවා) ඇද සිටි අයට ද ඉදිරියට එන ලෙස ප්‍රකාශ කර ඇත.

සියලු ළමයින්ට පෝලිම් වන ලෙසත්, ටවල් ඇද සිටි අයද ඉදිරියට එන ලෙසත් දන්වා ඇත. සි - 08 සංජු ප්‍රදීප්, සි - 28 චාමර ලක්ෂාන්, ඩි -05 චමින්ද සමන් කුමාර, සි - 20 රෂ්මි කාංචන, ඩි - 01 ෆාරිස් මොහොඩ් ෆස්ලාන් යන පස්දෙනා ඉදිරියට පැමිණ ඇත. ඉන්පසු ඔවුන් දණගස්වා ඇත. සි- 17 අන්තෝනි යන රැඳවියාගේ යට ඇඳුම ඒ අසල තිබ් දැක එය ඔලුවෙන් බහා මුහුණ වැසෙන සේ දමා ගැනීමට එම රැඳවියාට අණ කර ඇත. අන්තෝනී එසේ කළ පසු ඔහුද බිම දණගස්වා, දණගසා සිටින අනෙක් පස්දෙනා සමග වාට්ටුව තුලට දණ ගාන ලෙස නියෝග කර ඇත. මෙසේ දණ ගාමින් යන අතරතුර ජෙලර් උදාර මහතාගේ අත තිබූ පොල්ලෙන් සහ අතින් පයින් පහරදුන් බවත් ප්‍රකාශ කර සිටි. එසේ වීම තුළින් එම 06 දෙනාට තුවාල සිදු වූ බව ද කියා සිටි. තවද, මෙදින ජේලර් උදාර මහතා සී-28 චාමර ලක්ෂාන් යන තරුණ වරදකරු ඇද සිටි තුවාය ගලවා නිර්වස්ත්‍රව වම දකුණ කියමින් එහාට මෙහාට වාට්ටුව තුළ ඇවිද්දෙව්ව බවද කියා සිටි.

සි- 20 රෂ්මි කාංචන විසින් තමා ද දණ ගස්සවා බිම දණ ගැවෙව්ව නමුත්, තමාට පහරදීමක් නොවුණ බවත්, දණගෑම නිසා දණහිස් තුවාල වූ බවත්, ඒ අසල සිටි දයාපාල මහතා අත ස්ටම්ප් කූරක් තිබෙනු දුටු බවත්, තමා දණගාන විට සිනාසුන ළමයින්ට දයාපාල මහතා අත වූ පොල්ලෙන් කිහිපයක් ගැසූ බව ද කියා ඇත. තවද, සි-28 චාමර ලක්ෂාන් ළමයා ඇද සිටි තුවාය ගලවලා වාට්ටුව තුළම වම දකුණ ගසන්න කියා උදාර මහතා කී බව ද වැඩිදුරටත් කියා සිටී.

මෙදින කාර්ය භාර නිලධාරි ලෙස රාජකාරියේ යෙදි සිටි එම්.ඩී. පෙරේරා මහතා, ජෙලර් උදාර මහතා සමඟ වාට්ටුව ඇතුලට ගිය පසු ළමයින්ට පෝලිම් කර වාඩි කලවිට තමා බී වාට්ටුවෙන් පිටතට පැමිණි බවත්, මෙම සිදුවීම පිළිබඳ කිසිත් නොදන්නා බවට මූලික පරික්ෂණයේ දී ප්‍රකාශ ලබා දී ඇත.

මෙදින භාර ගැනීමේ ජේලර්වරයා ලෙස කටයුතු කළ ජේලර් ශානක සේනාරත්න තමාගේ රාජකාරි කාලය තුළ කිසිදු තරුණ වරදකරුවකුගෙන් හෝ කිසිදු නිලධාරියෙකුගෙන් මෙවැනි සිදුවීමක් පිළිබඳව වාර්තා නොවූ බවත්, එවැන්නක් පිළිබඳ තමා දැන නොසිටි බවත්, පසුදින ප්‍රධාන ජේලර් මහතා විසින් තමා කැඳවීමෙන් පසු එවැනි සිද්ධියක් පිළිබඳ දැන ගත් බව දැනුම් දී ඇත.

දෙවන පෙළ ජේලර් උදාර සුමනපාල බී 2 වාට්ටුව භාර අධික්ෂණ නිලධාරියා ලෙස කටයුතු කර ඇත. ළමයින් පස්වරු 3.30ත් 4.00 අතර කාලය තුළ දී කෑකෝගසන ශබ්දයක් ඇසුන බවත්, ඉන්පසු තමා වාට්ටුවට ගොස් තරුණ වරදකරුවන් පොලිම් කර නිශ්ශබ්ද කලා හැරෙන්නට කිසිදු දඬුවමකට යටත් නොකළ බවත්, ළමයින්ගේ අඩුපාඩු සොයා බැලූ බවත් සඳහන් කර ඇත. තවද, සැරයන් දයාපාල තමා සමග වාට්ටුව තුළ රැදි සිටි අතර නියාමක කේ අයි.ඩී. පෙරේරා වාට්ටුවේ දොර අසල රැදි සිටි බව සඳහන් කර ඇත.

මෙම මූලික විමර්ශනය සඳහා වින්දිතයන්ට සහ වගඋත්තරකරුවන්ට අමතරව තවත් සිදු දරුවන් 05 දෙනකුගේ සහ නිලධාරියෙකුගේ සාක්ෂි විමසීම් කර ඇති අතර නිලධාරීන් විසින් මෙවැනි කටයුත්තක නිරත නොවූ බව සඳහන් කළ ද, මූලික විමර්ශනය අනුව දෙවන පෙළ ජේලර් උදාර සුමනපාල විසින් තරුණයන් බිම දණගස්වා දණ ගෑමක් සිදුකර පහරදීම් කර ඇති බව අනාවරණය වන හෙයින් එය විනය විරෝධී ක්‍රියාවක් ලෙස හඳුනාගනිමින් ඔහුට විරුද්ධව (අ) උපලේඛණය යටතේ චෝදනා ගොණු කර විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශ කර ඇත. කාර්ය භාර නිලධාරී සහ වාට්ටු භාර නිලධාරී මෙම සිදුවීම වාර්තා නොකිරිම, සිද්ධිය පිළිබඳ කරුණු වසන් කිරීම හා රාජකාරී පැහැර හැරීම හේතුවෙන් (අ) උපලේඛණය යටතේ චෝදනා ගොණු කර විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශ කර ඇත.

<u>වටරැක බන්ධනාගාර රෝහල් වෛද්‍ය වාර්තා</u>

2023.05.18 දින වටරැක බන්ධනාගාර වෛද්‍යවරයා වෙත තරුණයන් සය දෙනා යොමු කර ඇත.වෛද්‍ය වාර්තාවේ පහත පරිදි දක්වා ඇත.

2020.05.18 දින දණහිස් දෙකෙහි මතුපිට තුවාල ඇති දරුවන් 06 දෙනකු මා වෙත යොමු කර ඇත. රෝගීන්ගේ ඉතිහාසයට අනුව, මෙම ළමුන් ළමා නේවාසිකාගාර ශාලාවේ දණගැසීමෙන් තුවාල සිදුවී ඇත. ජේලර්වරයකු විසින් දඬුවමක් ලෙස ළමුන් බලහත්කාරයෙන් දණ ගස්සවා ශාලාව වටා දණහිස් මඟින් ඇවිද්දවීමට ලක් කර ඇත. ලී පොල්ලකින් පිටට, තට්ටම්වලට,සහ කකුල්වල පිටුපසට පහර දී ඇත. සිදුවීම 2020.05.17 දින සවස 3.00 සිට 4.30 දක්වා සිදුව ඇත. දරුවන්ගේ විස්තර සහ තුවාල පහත දක්වා ඇත.

**(01) D-01 - එම්.එෆ්. එම්. ෆස්ලාන් (වයස 16)**

- දණහිස් දෙකෙහිම මතුපිටින් තුවාල දැකිය හැකි ය.
  දකුණු පාදයේ - 4 cm x 2 cm ප්‍රමාණයේ තුවාලයක්
  වම් පාදයේ - 2 cm x 2 cm ප්‍රමාණයේ තුවාලයක්
- ශරීරයේ වෙනත් තැලීම් හෝ පහරදීම් සළකුණු සඳහා දැකිය හැකි සාක්ෂි නොමැත.

**(02) C-17 - ඒ.සුරේෂ් (වයස 19)**

- දණහිස් දෙකෙහිම මතුපිටින් තුවාල දැකිය හැකි ය.
  දකුණු පාදයේ - 1 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්
  වම් පාදයේ - 1 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්
- ශරීරයේ වෙනත් තැලීම් හෝ පහරදීම් සළකුණු සඳහා දැකිය හැකි සාක්ෂි නොමැත.

**(03) C-20- රෂ්මි කාංචන (වයස 18)**

- දණහිස් දෙකෙහිම මතුපිටින් තුවාල දැකිය හැකි ය.
  දකුණු පාදයේ - 3 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්
  වම් පාදයේ - 3 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්
- පහරදීමක් සිදු වී නැත.
- ශරීරයෙහි වෙනත් තැලීම් හෝ දැකිය හැකි පහරදීම් සළකුණු සඳහා සාක්ෂි නොමැත.

**(04) B -05 - චමින්ද සමන් කුමාර (වයස 18)**

- දණහිස් දෙකෙහිම මතුපිටින් තුවාල දැකිය හැකි ය.
- පතුලෙහි ඉහළ ඉදිරිපසින් සීරීම් සහිත තුවාල දැකිය හැකි ය.
  දකුණු පාදයේ - 2 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්
  වම් පාදයේ - 3 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්
- ශරීරයේ වෙනත් තැලීම් හෝ පහරදීම් සළකුණු සඳහා දැකිය හැකි සාක්ෂි නොමැත.

**(05) C-28 - චාමර ලක්ෂාන් සෙනෙවිරත්න (වයස 17)**

- දණහිස් දෙකෙහිම බාහිරින් තුවාල දැකිය හැකි ය.
  දකුණු පාදයේ - 1 cm x 2 cm ප්‍රමාණයේ තුවාලයක්
  වම් පාදයේ - 1 cm x 3 cm ප්‍රමාණයේ තුවාලයක්
- ශරීරයේ වෙනත් තැලීම් හෝ පහරදීම් සළකුණු සඳහා දැකිය හැකි සාක්ෂි නොමැත.

**(06) C-08 - සංජු ප්‍රදීප් (වයස 18)**

- දණහිස් දෙකෙහිම බාහිරින් තුවාල දැකිය හැකි ය.
- පතුලෙහි ඉහළ ඉදිරි පසින් රේඛීයව සිරීම් සහිත තුවාල දැකිය හැකි ය.
  දකුණු පාදයේ - 2 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්

වම් පාදයේ - 2 cm x 1 cm ප්‍රමාණයේ තුවාලයක්

- ශරීරයේ වෙනත් තැලීම් හෝ පහරදීම් සළකුණු සඳහා දැකිය හැකි සාක්ෂි නොමැත.

<u>**අවිස්සාවේල්ල මූලික රෝහලෙන් නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තා**</u>

2020.06.16 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව මගින් බන්ධනාගාර අධිකාරී, වටරැක වෙත වින්දිත පාර්ශවය අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කරන ලෙස නැවත දැනුම්දීමක් සිදු කර ඇත. ඒ අනුව බන්ධනාගාර අධිකාරී, වටරැක විසින් ඔහුගේ අංක වටා.වැක/ලි.ලි/01/විවිධ/2020 සහ 2020.06.16 වන දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර 2020.06.17 දින තරුණයන් සය දෙනා අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවේ පහත කරුණු දක්වා ඇත.

### (01) D-01 - එම්. එෆ්. එම්. ෆස්ලාන් (වයස 16)

සිදුවීමට අදාල කෙටි හැඳින්වීම-

කඳවුරේ මාස 02යි. ඊට ඉස්සර ගෙදර. හොරකම් කරලා අයිස් ගැහුවා. දැන් හිතෙන්නේ නෑ. අමාරු මොනවත් නෑ. නාලා හිටියේ. එක ඇඳුමයි තියෙන්නේ. හෙළුවෙන් හැංගිලා හිටියේ. සර් දැකලා දණ ගහන්න කිව්වා. උඩ වාට්ටුවේ සිමෙන්තියේ පැය භාගයක් විතර දුර මීටර් 20ක් විතර. හයියෙන් යන්න කියලා පිටි පස්සට පයින් ගැහුවා. කකුල බලලා හරියට තුවාල වෙලා නෑ ආයිත් පලයන් කිව්වා මටයි චාමරටයි. ආයෙත් දණ ගාන්න කිව්වා තුවාල වෙනකම්. කම්මුලට ගැහුවා. පයින් පිටට ගැහුවා. සපත්තු දාලා හිටියේ. ඊට පස්සේ ගැහුවේ නෑ.

- 3 cm x 2 cm ප්‍රමාණයේ දකුණු දණහිසෙහි ඉදිරිපස අඳුරු කැළැල් (දන ගානකොට තුවාල වෙලා)
- 3 cm x 2 cm ප්‍රමාණයේ වම් දණහිසෙහි ඉදිරිපස අඳුරුකැළැල් (දන ගානකොට තුවාල වෙලා)
- දකුණු සහ වම් යටි බාහුවෙහි සිදුවීමට අදාළ නොවන පෙර සිදු කර ගත් කැපුම් තුවාල කැළැල් (horizontally) ඇත.
- දණහිස් ඉදිරිපස අඳුරු කැළැල් රළු මතුපිටක් මත දණහිස් වලින් ඇවිදීමේ සිද්ධිය නිසා විය හැකිය.
- නිදන්ගත ශාරීරක හිංසනයක් සඳහා සාක්ෂි නොමැත.

### (02) C-28 - චාමර ලක්ෂාන් සෙනෙවිරත්න (වයස 17)

සිදුවීමට අදාල කෙටි හැඳින්වීම-

කඳවුරේ මාස 06යි. ඊට ඉස්සර මීගමුව බන්ධනාගාරේ මාස 04යි. වරද හොරකම. අරක්කු බිව්වා. බොන්න හිතෙන්නේ නෑ දැන්. උදාර මහත්තයා අපට දණ ගහන්න කියලා ඇවිද්දුවා. වාට්ටුවේ සිමෙන්ති පොළවේ මැදලා තියෙන්නේ. විනාඩි 15 විතර අඩි 12-14 විතර. ටවල් ඇඳන් හිටියා කියලා. ස්ටම්ප් පොල්ලෙන් කකුල් වලට කලවට ගැහුවා. දණහිස සීරුණා. පී.එච්. යවලා 18 බේත් දැම්මා. මාසය මතක නෑ. දැන් අමාරු නෑ. ඊට පස්සේ ගැහුවේ නෑ.උදාර මහත්තයා බීලා හිටියේ. දකුණු කණට ගැහුවා අමාරු නෑ.

- සිදුවීමට සම්බන්ධ නොවන විකෘති පච්ච කැලල් සහ වෙනත් පැරණි කැළැල් ශරීරයේ ඇත.
- 2 cm x 2 cm ප්‍රමාණයේ දිලිසෙන කැළැල් දෙකක් පාද දෙකෙහි දණහිස ඉදිරිපස ඇත. (දණ ගානකොට තුවාල වෙලා)
- 8 cm x 1 cm ප්‍රමාණයේ දිලිසෙන දිගටි කැලලක්, දකුණු කලවා පිටුපස ඇති අතර එහි අභ්‍යන්තර කෙලවර එහි පිටත කෙලවරට වඩා ඉහළ මට්ටමක පවතී. (ස්ටම්ප් එකෙන් ගහන කොට තුවාල වෙලා දිය පට්ට ඇවිත් හොඳවෙලා)
- දණහිසෙහි අඳුරු කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල විය හැකිය.
- කඩුල්ලක් වැනි මොට වස්තුවක් නිසා ඇති වූ දිය පට්ටා විය හැකි ය.
- නිදන්ගත ශාරීරික හිංසනයන් සඳහා සාක්ෂි නොමැත.

**(03) C - 08 - ඉෂාරගේ සංජු ප්‍රදීප් (වයස 18)**

සිදුවීමට අදාල කෙටි හැඳින්වීම-
කඳවුරේ අවුරුදු 1යි මාස 3. ඊට ඉස්සර මාකොල මාස 09යි. හොරකම් කරලා. කේරළ ගංජා ගැහුවා. දැන් ගහන්න හිතෙන්නේ නෑ. නාලා ටවල් ඇඳන් හිටියා. උදාර මහත්තයා ඇවිල්ලා ඇඳුම් අදින්න කියලා - කොට කලිසම් - දණ ගාන්න කිව්වා. සිමෙන්ති පොලවේ රළු සිමෙන්තියේ. දනිස් තුවාල වෙනකම් දණ ගාන්න කිව්වා. 50 පාරක් විතර අඩි 30 විතර. කොන්දට බූට් එකෙන් දන ගානකොට ගැහුවා. ලීයකිනුත් ගැහුවා. තුවාල වලට බේත් දැම්මා ඊට පසුදා පී.එච්. එකෙන්. දැන් අමාරු නෑ.

- දකුණු සහ වම් අත් බාහුවෙහි ඉදිරිපස සිද්ධියට සම්බන්ධ නොවන පූර්වයෙන් කපා ගන්නා ලද තද පැහැති කැළල් ඇත.
- 2 cm x 1.5 cm ප්‍රමාණයේ දකුණු දණහිසෙහි ඉදිරිපස දිලිසෙන කැළැල ( දන ගානකොට තුවාල වෙලා)
- 2 cm x 1 cm ප්‍රමාණයේ වම් දණහිසෙහි ඉදිරිපස දිලිසෙන කැළැල ( දන ගානකොට තුවාල වෙලා)
- 1 cm x 1 cm ප්‍රමාණයේ තද පැහැති කුඩා කැලල් වම් පාදයේ පෘෂ්ඨය මත ඇත. (දන ගානකොට තුවාල වෙලා)
- දණහිස් ඉදිරිපස සහ වම් පාදයේ කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල විය හැකි ය.
- නිදන්ගත ශාරීරික හිංසනයන් සඳහා සාක්ෂි නොමැත.

**(04) C-17 - ඒ.සුරේෂ් (වයස 19)**

සිදුවීමට අදාල කෙටි හැඳින්වීම-
කඳවුරේ මාස 08යි. ඊට ඉස්සර අද්දෙස්සේ පුනරුත්ථාපනේ හිටියේ. ඩ්‍රග්ස් පාවිච්චි කරා. හොරොයින් අයිස් අවුරුදු 02ක් විතර. දැන් නෑ. දැන් අමාරු නෑ. දවසක් කට්ටිය ඇඳුම් නැතිව හිටියා. පස්නාම්ට උදාර මහත්තයා ස්ටම්ප් එකෙන් ගැහුවා. තට්ටමට ගහනකොට මගේ කලිසම වැලෙන් වැටුනා. ඒක මගේ මූණට දාලා දණ ගාන්න කිව්වා. දණ ගැවේ වාට්ටුවේ සිමෙන්ති මැදලා තියෙන්නේ. විනාඩි 10ක් විතර අඩි 10—5 විතර දනිස් සීරුණා. ඒකට පහුවදා බේත් දැම්මා. පිටට පයින් උදාර මහත්තයා ගැහුවා. සපත්තු දාලා හිටියේ පාරවල් දෙකයි. ස්කොට් ගැස්සුවා.අමාරු නෑ. වෙනදා ගහන්නේ නෑ. ඊට පස්සේ ගැහුවේ නෑ. තවම හෙරොයින් ගහන්න හිතෙනවා.

- සිද්ධියට අදාළ නොවන පූර්ව කපාගැනීම් සිදුකළ කැළැල් ශරීරයේ ඇත.
- 2 cm x 2 cm ප්‍රමාණයේ දකුණු දණහිස ඉදිරිපස සිරිම් සහිත කැළැල් (දණ ගානකොට තුවාල වෙලා කැසුවා)
- 1.5 cm x 1 cm ප්‍රමාණයේ වම් දණහිස ඉදිරිපස සිරිම් සහිත කැළැල් (දණ ගානකොට තුවාල වෙලා කැසුවා)
- පැරණි තුවාල කැළැල්
- දණහිස් කැළැල් රළු මතුපිටක දණහිස් මගින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල විය හැකිය. කැසීම හේතුවෙන් තුවාල සුව වීම ප්‍රමාද විය හැකිය.
- නිදන්ගත ශාරීරික හිංසනයක් සඳහා සාක්ෂි නොමැත.
- හෙරොයින් සඳහා ඇති ආශාව නැති කරලීමට පුනරුත්ථාපනය කිරීම අවශ්‍ය වේ.

**(05) C-20- රශ්මි කාංචන (වයස 18)**

සිදුවීමට අදාල කෙටි හැඳින්වීම-
කඳවුරේ මාස 8ක ඉඳන් ඉන්නවා. ඊට ඉස්සර අඟුනකොල බන්ධනාගාරයේ මාසයයි. ඊට ඉස්සර ගෙදර. කෝලහාලේකට බන්ධනාගාර ගතවුණා. දිනය මතක නෑ. නාලා ටවල් නැතිව ඇඳුම් නැතිව හිටියා.

වාට්ටුවට ජේලර් මහත්තයයි - උදාර, ඉන්චාර්ජ් දයාපාල මහත්තයා, නියාමක පෙරේරා මහත්තයා ආවා. ටවල් නැති හය දෙනාට දණගහන් ඉන්න කිව්වා. දණගාගෙන ඇවිදින්න කිව්වා. ඒ වාට්ටුවේ සිමෙන්ති පොළවේ මැදපු පොළවේ විනාඩි 10ක් දණගෑවා. අඩි12-13 විතර. අඩු පාඩු ඇහුවා පහර දුන්නේ නෑ. කිසිම අමාරුවක් නෑ. සති 3 - 4කට ඉස්සර වුනේ. වෙන ප්‍රශ්න නෑ. ප්‍රිසන් හොස්පිටල් එකට ගෙනිච්චා. එහෙදී දණහිසේ හමගිය තුවාල වලට බෙත් දැම්මා. ඊට පහුවදා බෙත් දැම්මේ.

- සිදුවීමට සම්බන්ධ නොවන පූර්ව කපා ගැනීම් කැෙළැල් ශරීරයේ ඇත.
- සුදු පැහැති කැළලක් ආසන්න වශයෙන් 1.5 cm x 1 cm ප්‍රමාණයේ දකුණු දණහිසෙහි ඇත. (දණ ගානකොට එදා තුවාල වෙලා)
- රෝස පැහැති කැළලක් ආසන්න වශයෙන් 2 cm x 0.5 cm ප්‍රමාණයේ වම් දණහිසෙහි (දණ ගානකොට එදා තුවාල වෙලා)
- දණහිසෙහි තුවාල කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල විය හැකි ය.
- නිදන්ගත ශාරීරික හිංසනයක් සඳහා සාක්ෂි නොමැත.

**(06) B-05 - චමින්ද සමන් කුමාර (වයස 18)**

සිදුවීමට අදාල කෙටි හැඳින්වීම -
කඳවුරේ මාස 02යි. ඊට ඉස්සර ගෙදර හිටියේ. හොරකම් කරලා කඳවුරට දැම්මා. කතා කරන කොට ගොත ගැහෙනවා පුංචි කාලේ ඉඳලා. නාලා ටවල් ඇඳගෙන හිටියේ. උදාර මහත්තයා දණ ගහගෙන ඉන්න කිව්වා. ගැහුවේ නෑ. මීටර් දෙකක් විතර දණ ගෑවා විනාඩි 10ක් විතර. ඊට පස්සේ ගැහුවේ නෑ. කකුල හම ගියා. ඇතුලේ කොන්ක්‍රීට් සිමෙන්ති පොලවේ. තුවාල වලට බෙත් දැම්මේ ඊට පසුදා. අමාරු මොනවත් නෑ. දැන් අරක්කු බොන්න හිතෙනවා. බොන්නේ නෑ.

- සිද්ධියට සම්බන්ධ නොවන කැලල් ශරීරයේ ඇත.
- 1.5 cm x 1.5 cm ප්‍රමාණයේ දකුණු දණහිසෙහි ඉදිරිපස තද පැහැති කැළලක් ඇත. (දණ ගානකොට තුවාල වෙලා)
- 2 cm x 1 cm ප්‍රමාණයේ සුදු පැහැති කැළැලක් වම් දණහිස ඉදිරිපස ඇත. (දණ ගානකොට තුවාල වෙලා)
- 1 cm x 0.5 cm ප්‍රමාණයේ සුදු පැහැති කැළැලක් දකුණු පාදයේ පෘෂ්ඨය මත ඇත. (දණ ගානකොට තුවාල වෙලා)
- දණහිසෙහි සහ පාදයේ තුවාල කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හට ගැනීමෙන් ඇතිවූ තුවාල විය හැකි ය.
- නිදන්ගත ශාරීරික හිංසනයක් සඳහා සාක්ෂි නොමැත
- අරක්කු සඳහා ඇති ආශාව නැති කරලීමට පුනරුත්ථාපනය කිරීම අවශ්‍ය වේ.

<u>**නිරීක්ෂණ**</u>

වාර්තාගත සිදුවීම 2020.05.17 වන දින පස්වරු 2.30 සිට 4.30 අතර කාලය තුළ වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය සහ එළිමහන් වැඩ කඳවුරෙහි ඉහළ මහලයේ බී 02 වාට්ටුව අභ්‍යන්තරයේ සිදුව ඇති බවත්, ස්නානය සඳහා යොමු ව ඇති වින්දිතයන් අතරින් ඇතැම් තරුණයන් තුවාය හැඳගෙන සහ ඇතමෙක් නිර්වස්ත්‍රව සිට ඇති බවත්, වාට්ටුව තුළ ඝෝෂාවක් තිබූ බවත් වින්දිත දරුවන්ගේ ප්‍රකාශ හා වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම් සහ බන්ධනාගාර මූලික පර්යේෂණ වාර්තාව, වෛද්‍ය වාර්තා සටහන් අනුව නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිදුවීම වාර්තා වූ 2020.05.23 වන දිනම වටරැක බන්ධනාගාරය වෙත වින්දිත දරුවන් පැය 48ක් තුළ අධිකරණ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණ ද, 2020.06.15 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන

කණ්ඩායමක් වටරැක බන්ධනාගාරය වෙත ගොස් ස්ථානීය පරීක්ෂණය සිදුකරන අවස්ථාව වන විටත් වින්දිත දරුවන් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත්ව ඇති අතර අදාළ සිදුවීම සිදුවී මසක් ගත වීමෙන් පසුව කොමිෂන් සභාව විසින් සිදු කළ දෙවන සිහි කැදවීම අනුව වින්දිතයන් 2020.06.17 දින අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බව පෙනී යයි.

වින්දිතයන් තුවා සහ නිර්වස්ත්‍රවයෙන් සිටීම සඳහා ප්‍රමාණවත් ඇඳුම් නොතිබීම හේතුවී ඇති බවත්, ලබා දී ඇති ඇඳුම සේදීම නිසා ඇඳුම් තෙත බැවින් මෙලෙස සිට ඇති බව නිරීක්ෂණය වේ. මෙම ගැටලුවෙන් පසු යම් පිරිසකට පමණක් බන්ධනාගාරය වෙතින් අමතර ඇඳුම් ලබා දී ඇති නමුත්, සියලුම ළමුන් හට ප්‍රමාණවත් තරම් ඇඳුම් ලබා දී නොමැති බව ද නිරීක්ෂණය වේ.

1 වන වින්දිත තැනැත්තා වන රෂ්මි කාංචන විසින් 2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද ප්‍රකාශයට අනුව දෙවන පෙළ ජේලර් උදාර සුමනපාල විසින් විනාඩි 10ක් 15ක් පමණ දණගස්වා ඇවිද්ද වූ බවත්, පහර දීමක් සිදු නොකළ බවත් දක්වා ඇත. 1 වන වින්දිත තැනැත්තා සම්බන්ධයෙන් බන්ධනාගාර රෝහල විසින් නිකුත් කර ඇති වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති කරුණු නිරික්ෂණයේ දී, දකුණු පාදයේ - 3 cm x 1 cm ප්‍රමාණයේ සහ වම් පාදයේ 3 cm x 1 cm ප්‍රමාණයේ වශයෙන් දණහිස් දෙකෙහිම මතුපිටින් තුවාල පවතින බව දක්වා ඇත. එසේම, 1 වන වින්දිත තැනැත්තා සම්බන්ධයෙන් අවිස්සාවේල්ල මූලික රෝහල මගින් නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ වින්දිතයාගේ දකුණු දණහිසෙහි 1.5 cm x 1 cm ප්‍රමාණයේ  සුදු පැහැති කැලලක් ද, වම් දණහිසෙහි ආසන්න වශයෙන් 2 cm x 0.5 cm ප්‍රමාණයේ රෝස පැහැති කැළැලක් ද ඇති බවත්,  දණහිසෙහි තුවාල කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල විය හැකි බවත් දක්වා ඇත.

රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති රෝග ඉතිහාසයේ ජේලර් උදාර විසින් වාට්ටුවේ සිමෙන්ති පොලවෙහි විනාඩි 10ක් අඩි 12-13 විතර දණගාගෙන ඇවිදින ලෙස දැන්වූ බවත්, එලෙස දණ ගෑම නිසා තුවාල ඇති වූ බවත්, තමාට පහර නොදුන් බවත් දක්වා ඇත. ඒ අනුව 1 වන වින්දිත තැනැත්තා වන රෂ්මි කාංචන යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට සමාන ප්‍රකාශයක් අධිකරණ වෛද්‍යවරයා වෙත ද ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත නිරීක්ෂණ අනුව 1 වන වින්දිත තැනැත්තා වන රෂ්මි කාංචන යන අයට පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ  ජේලර් ) විසින් දණහිස් තුවාල වනතුරු දණහිසින් ඇවිද්දවා ඇති බව තහවුරු වේ.

2 වන වින්දිත තැනැත්තා වන අන්තෝනි සුරේෂ් යන අය විසින් 2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට අනුව, ජේලර් උදාර විසින් අන් ළමයි 05 දෙනාට වාට්ටුවේ දණගාන්න ලෙස දැන්වූ බවත්, ඔවුන්ගේ අත් සහ පාද වලට විකට් කූරකින් ඔහු පහර දුන් බවත්, එලෙස පහර දෙන අවස්ථාවේ දී විකට් කූර වැලේ වැදී ඔහුගේ යට ඇඳුම බිම වැටුණු බවත්, ඒ අවස්ථාවේ දී ජේලර් උදාර නිලධාරියා විසින් යට ඇඳුම ඔළුවෙහිලා දණහිස් වලින් බිම ඇවිද්දවූ බවත්, එලෙස දණගාන අතර තුරදී පිටට පහර දුන් බවත් දක්වා ඇත.

එසේම, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වින්දිත චාමර ලක්ෂාන් සෙනවිරත්න විසින් 2020.06.15 වන දින ලබාදී ඇති ප්‍රකාශය තුළ ද ඔහුට පහරක් එල්ල කිරීමට ජේලර් උදාර නිලධාරියා විසින් පොල්ල ඉහලට එසවීමේ දී රෙදි වැලෙහි වැදී එහි තිබූ යට කලිසමක් බිම වැටුණු බවත්, එය අන්තෝනි සුරේෂ්ගේ බවත්, ජේලර් උදාර නිලධාරියා විසින් අන්තෝනි සුරේෂ් කැඳවා එය ඔහුගේ හිසට දමා දණහිසින් ඇවිද්දවූ බවත් සඳහන් කර ඇත.

බන්ධනාගාර මූලික විමර්ශන වාර්තාවේ ද මෙම සිදුවීම පිළිබඳව, අන්තෝනි යන රැඳවියාගේ යට ඇඳුම ඒ අසල තිබී දැක එය ඔලුවෙන් බහා මුහුණ වැසෙන සේ දමා ගැනීමට අණ කර ඇති බවත්, අන්තෝනී එසේ කළ පසු ඔහු බිම දණගස්වා, දණගසා සිටින අනෙක් පස්දෙනා සමග වාට්ටුව තුළට දණ ගාන ලෙස නියෝග කර ඇති බවත් සඳහන් කර ඇත. 2 වන වින්දිත තැනැත්තා වන අන්තෝනි සුරේෂ් විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති රෝග ඉතිහාසයේ ද, ෆස්නාමේගේ තට්ටමට උදාර පහර දෙන විට ඔහුගේ කලිසම වැලෙන් වැටුණු බවත්, එය මූණට දමා දණ ගාන ලෙස දැන්වූ බවත්, වාට්ටුවේ

සිමෙන්තියේ විනාඩි 10ක් පමණ අඩි 10-15 විතර පමණ ඇවිදීම නිසා දණහිස් සීරුණු බවත් සඳහන් කර ඇත.

එසේම, මෙම 2 වන වින්දිත තැනැත්තා සම්බන්ධයෙන් බන්ධනාගාර වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති කරුණු නිරීක්ෂණය කිරීමේ දී, දකුණු පාදයේ 1 cm x 1 cm සහ වම් පාදයේ 1 cm x 1 cm ප්‍රමාණයේ තුවාල දණහිස් දෙකෙහිම මතුපිටින් දැකිය හැකි බව දක්වා ඇත. තවද, අවිස්සාවේල්ල මහ රෝහලෙන් ලබාගත් අධිකරණ වෛද්‍ය වාර්තාව නිරීක්ෂණයේ දී, දකුණු දණහිස ඉදිරිපස 2 cm x 2 cm ප්‍රමාණයේ සිරිම් සහිත කැළැල් සහ වම් දණහිස ඉදිරිපස 1.5 cm x 1 cm ප්‍රමාණයේ සිරිම් සහිත කැළැල් සහිත බවත්, මෙම දණහිස් කැළැල් රළු මතුපිටක දණහිස් මගින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල විය හැකි බවත්, තුවාල කැසීම හේතුවෙන් තුවාල සුව වීම ප්‍රමාද විය හැකි බවත් දක්වා ඇත. තවද, අධිකරණ වෛද්‍ය වාර්තාවේ 2 වන වින්දිත තැනැත්තා වන අන්තෝනි සුරේෂ් යන අයගේ හෙරොයින් සඳහා ඇති ආශාව නැති කරලීමට පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම අවශ්‍ය විය හැකි බව නිර්දේශ කර ඇත.

ඉහත නිරීක්ෂණ අනුව 2 වන වින්දිත තැනැත්තා වන අන්තෝනි සුරේෂ් යන අය පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර් ) විසින් යට ඇඳුම ඔලුවෙහි දමා දණහිස් තුවාල වනතුරු දණහිසින් ඇවිද්දවා ඇති බව තහවුරු වේ.

3 වන වින්දිත තැනැත්තා වන චමින්ද සමන් කුමාර යන අය විසින් 2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශය අනුව, ජේලර් උදාර විසින් දණගසා සිමෙන්ති පොළොවේ ඇවිදින ලෙස දැනුම් දී ඇති බවත්, ජේලර් උදාර අත විකට් පොල්ලක් තිබූ බවත්, එයින් පිටට එකක් ගැසූ බවත්, දණහිස් තුවාල වී ලේ එනතුරු වට 20ක් පමණ ඇවිද්ද වූ බවත් සඳහන් කර ඇත. මොහු විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති රෝග ඉතිහාසයේ ද තමාට උදාර මහතා ඇතුලත සිමෙන්ති පොලවේ දණ ගහන ලෙසත්, කකුල හම යනතුරු මීටර් දෙකක් පමණ විනාඩි 10ක් දණහිසින් ඇවිදින ලෙස නියෝග කළ බවත් සඳහන් කර ඇත.

3 වන වින්දිත තැනැත්තා සම්බන්ධයෙන් නිකුත් කර ඇති බන්ධනාගාර රෝහල් වෛද්‍ය වාර්තාවේ දකුණු පාදයේ - 2 cm x 1 cm සහ වම් පාදයේ 3 cm x 1 cm ප්‍රමාණයේ තුවාල දණහිස් දෙකෙහිම මතුපිටින් දැකිය හැකි බව දක්වා ඇත. අවිස්සාවේල්ල මහ රෝහලෙන් ලබාගත් අධිකරණ වෛද්‍ය වාර්තාවේ වින්දිතයාගේ දකුණු දණහිසෙහි ඉදිරිපස 1.5 cm x 1.5 cm ප්‍රමාණයේ තද පැහැති කැළලක් ද, වම් දණහිස ඉදිරිපස 2 cm x 1 cm ප්‍රමාණයේ සුදු පැහැති කැළලක් ද, දකුණු පාදයේ පෘෂ්ඨය මත 1 cm x 0.5 cm ප්‍රමාණයේ සුදු පැහැති කැලලක් ද ඇති බවත්, දණහිසෙහි සහ පාදයේ තුවාල කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හට ගැනීමෙන් ඇතිවූ තුවාල විය හැකි බවත් දක්වා ඇත. එසේම, 3 වන වින්දිත තැනැත්තා වන චමින්ද සමන් කුමාර යන අයගේ අරක්කු සඳහා ඇති ආශාව නැති කරලීමට පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම අවශ්‍ය විය හැකි බව අධිකරණ වෛද්‍යවරයා නිර්දේශ කර ඇත.

ඉහත නිරීක්ෂණ අනුව 3 වන වින්දිත තැනැත්තා වන චමින්ද සමන් කුමාර යන අය, පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර් ) විසින් දණහිස් තුවාල වනතුරු දණහිසින් ඇවිද්දවා ඇති බව තහවුරු වේ.

4 වන වින්දිත තැනැත්තා වන චාමර ලක්ෂාන් සෙනෙවිරත්න යන අය විසින් 2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශය අනුව, ජේලර් උදාර විසින් දණ ගසා ඇවිදින ලෙස දැනුම් දුන් බවත්, ක්‍රිකට් පොල්ලක් ඔහු අතැතිව තිබූ බවත්, තමා පමණක් ඉතිරි වූ පසු පොල්ලෙන් කකුලට පහර දුන් බවත්, හැඳ සිටි තුවාය ගලවා නිරුවතින් ආමි ට්‍රේනින් බව පවසා ලෙෆ්ට් රයිට් ලෙස පවසමින් ඇවිදින ලෙස දැන්වූ බවත් සඳහන් කර ඇත. බන්ධනාගාර මූලික පරීක්ෂණ වාර්තාවේ 4 වන වින්දිත තැනැත්තා වන චාමර ලක්ෂාන් සෙනෙවිරත්න යන අයව ඇඳ සිටි තුවාය ගලවා නිරුවතින් වම දකුණ කියමින් වාට්ටුව තුළ ඇවිද්ද වූ බව සඳහන් වන අතර, ලබාගත් ඡායාරූපවල ඔහුගේ දකුණු කකුලේ ඉහළ බාහුවේ තැලීම් පාරක් ඇති බවත් දක්වා ඇත. අධිකරණ වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසයේ ද ස්ටම්ප් පොල්ලකින් කකුල් වල කලවාට පහර දී ඇති බව සඳහන් කර ඇත.

4 වන වින්දිත තැනැත්තා වන චාමර ලක්ෂාන් සෙනෙවිරත්න යන අය සම්බන්ධයෙන් නිකුත් කර ඇති බන්ධනාගාර රෝහල් වෛද්‍ය වාර්තාවේ, දකුණු පාදයේ දණහිසෙහි - 1 cm x 2 cm සහ වම් පාදයේ 1 cm x 3 cm ප්‍රමාණයේ තුවාලයක් දක්නට ලැබෙන බව සඳහන් කර ඇත. මෙම අය සම්බන්ධයෙන් අවිස්සාවේල්ල මහ රෝහල මගින් නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ ද, 2cm x 2 cm ප්‍රමාණයේ දිලිසෙන කැළැල් දෙකක් පාද දෙකෙහි දණහිස ඉදිරිපස ඇති බවත්, 8 cm x 1 cm ප්‍රමාණයේ දිලිසෙන දිගටි කැළලක් දකුණු කලවා පිටුපස ඇති අතර එහි අභ්‍යන්තර කෙලවර එහි පිටත කෙලවරට වඩා ඉහළ මට්ටමක පවතින බවත්, එය "ස්ටම්ප් එකෙන් ගහන කොට තුවාල වෙලා දිය පට්ට ඇවිත් හොඳවෙලා" ලෙස ද දක්වා ඇති අතර දණහිසෙහි අඳුරු කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල බවත්, කඩුල්ලක් වැනි මොට වස්තුවක් නිසා ඇති වූ දිය පට්ටා බවත් සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ. වෛද්‍ය වාර්තාව අනුව ප්‍රකාශයන්ට අදාලව කරුණු සනාථ වේ.

ඉහත නිරීක්ෂණ අනුව 4 වන වින්දිත තැනැත්තා වන චාමර ලක්ෂාන් සෙනෙවිරත්න යන අය පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර් ) විසින් දණහිස් තුවාල වනතුරු දණහිසින් ඇවිද්දවා ඇති බව තහවුරු වේ.

5 වන වින්දිත තැනැත්තා වන එම්. එෆ්. එම්. ෆස්ලාන් යන අය විසින් 2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද ප්‍රකාශයේ සඳහන් වන්නේ, ජේලර් උදාර අතින් පයින් ගැසූ බවත්, දණ ගසා ඇවිදින්න සහ දුවන්න ලෙස දැන්වූ බවත්, ඔහු වේගය අඩු කර දණ හිසින් ඇවිදින විට තමාගේ පසුපසට පහරදුන් බවත්, කකුල් තුවාල නොවීම හේතුවෙන් නැවත දණගස්වා ඇවිද්දවූ බවත් ය.බන්ධනාගාර මූලික පර්යේෂණ වාර්තාවේ ද වින්දිතයාගේ දණහිස් තුවාල වී ඇති බව සඳහන් කර ඇත. තවද, බන්ධනාගාර රෝහල් වෛද්‍ය වාර්තාව තුළ දකුණු පාදයේ 4 cm x 2 cm සහ වම් පාදයේ 2 cm x 2 cm ප්‍රමාණයේ වශයෙන් දණහිස් දෙකෙහිම මතුපිටින් තුවාල දැකිය හැකි බව සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

5 වන වින්දිත තැනැත්තා වන එම්. එෆ්. එම්. ෆස්ලාන් යන අය විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසයේ ද උඩ වාට්ටුවේ සිමෙන්තියේ පැය භාගයක් පමණ මීටර් 20ක් පමණ දුර දණහිසින් ඇවිද්දවූ බවත්, වේගයෙන් යන ලෙස දන්වා සපත්තු සහිත පාදයෙන් පහරදුන් බවත්, දණහිස් තුවාල නොවී තිබූ බැවින් නැවත තුවාල වනතුරු දණ හිසින් ඇවිද්දවූ බවත්, කම්මුලට පහර දුන් බවත් සඳහන් කර ඇත. අවිස්සාවේල්ල මහ රෝහලෙන් ලබාගත් අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව 5 වන වින්දිත එම්. එෆ්. එම්. ෆස්ලාන් යන අයගේ දණහිස් තුවාල වී ඇති බව සනාථ කර ඇත. ඒ අනුව පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) විසින් චේතනාන්විතවම මෙම වින්දිතයාගේ දණහිස් තුවාල වනතුරුම දණහිසින් ඇවිද්දවා ඇති බව සනාථ වේ. එසේම, අධිකරණ වෛද්‍ය වාර්තාවේ දකුණු දණහිසෙහි ඉදිරිපස 3 cm x 2 cm ප්‍රමාණයේ අඳුරු කැළැල් ද , වම් දණහිසෙහි ඉදිරිපස 3 cm x 2 cm ප්‍රමාණයේ අඳුරුකැළැල් ද සහිත බවත්, මෙම දණහිස් ඉදිරිපස අඳුරු කැළැල් රළු මතුපිටක් මත දණහිස් වලින් ඇවිදීම නිසා සිදුවූවක් බවත් සඳහන් කර ඇත.

ඉහත නිරීක්ෂණ අනුව 5 වන වින්දිත තැනැත්තා වන එම්. එෆ්. එම්. ෆස්ලාන් යන අය පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර් ) විසින් දණහිස් තුවාල වනතුරු දණහිසින් ඇවිද්දවා ඇති බව තහවුරු වේ.

6 වන වින්දිත තැනැත්තා වන සංජු ප්‍රදීප් යන අය විසින් 2020.06.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයේ ජේලර් උදාර විසින් දණ ගසා දණහිස් වලින් ඇවිදින ලෙස දැනුම් දුන් බවත්, දණහිස් තුවාල සිදුවූ පසු සපත්තු පැළැද සිටි පාදයෙන් පසු පසට පහර දුන් බවත් සඳහන් කර ඇත. බන්ධනාගාරයේ මූලික පර්යේෂණ වාර්තාව තුළ ද මෙම වින්දිතයාගේ දණහිස් තුවාල වී ඇති බව සඳහන් කර ඇත. මෙම වින්දිතයා සම්බන්ධයෙන් ලබා දී ඇති බන්ධනාගාර වෛද්‍ය වාර්තාවේ පාදය පතුලෙහි ඉහළ ඉදිරි පසින් රේඛීයව සිරීම් සහිත තුවාල සහ දකුණු පාදයේ - 2 cm x 1 cm සහ වම් පාදයේ - 2 cm x 1 cm ප්‍රමාණයේ තුවාල ලෙස දණහිස් දෙකෙහිම බාහිරින් තුවාල දැකිය හැකි බව සඳහන් කර ඇත.

6 වන වින්දිත තැනැත්තා වන සංජු ප්‍රදීප් යන අය විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසයේ ද ජේලර් උදාර රළු සිමෙන්ති පොළවේ දණහිස් තුවාල වනතුරු දණ ගාන ලෙස දැන්වූ බවත්,

අඩි 30ක් පමණ 50වරක් දණ ගෑ බවත්, සපත්තු සහිත පාදයෙන් කොන්දට පහර දුන් අතර ලීයකින් පහර දුන් බවත් සඳහන් කර ඇත. මෙම ප්‍රකාශය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදුන් ප්‍රකාශයට සමාන ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ. දකුණු දණහිසෙහි ඉදිරිපස 2 cm x 1.5 cm ප්‍රමාණයේ දිලිසෙන කැළැලක් ද, වම් දණහිසෙහි ඉදිරිපස 2 cm x 1 cm ප්‍රමාණයේ දිලිසෙන කැළැලක් ද, වම් පාදයේ පෘෂ්ඨය 1 cm x 1 cm ප්‍රමාණයේ තද පැහැති කුඩා කැළැල් මත ඇති බවත් අවිස්සාවේල්ල මහ රෝහල මගින් ලබා දී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වන අතර එහි දණහිස් ඉදිරිපස සහ වම් පාදයේ කැළැල් රළු මතුපිටක දණහිස් වලින් ඇවිදීම හේතුවෙන් හටගත් තුවාල බව දක්වා ඇත.

ඉහත නිරීක්ෂණ අනුව 6 වන වින්දිත තැනැත්තා වන සංජු ප්‍රදීප් යන අය පළමු වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර් ) විසින් දණහිස් තුවාල වනතුරු දණහිසින් ඇවිද්දවා ඇති බව තහවුරු වේ.

ඉහත නිරීක්ෂණ අනුව 1, 2, 3, 4, 5 සහ 6 වින්දිත තැනැත්තන් 1 වන වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) විසින් දණහිස් තුවාල වන අයුරින් රළු පොළවක් මත දණහිසින් ඇවිද්දවා ඇති බවත්, 1 වන විනිදිත තැනැත්තා හැර අනෙකුත් 2,3,4,5 සහ 6 වින්දිත තැනැත්තන් හට පහරදීම් සිදුකර ඇති බවත් පැහැදිලි වේ.

2 වන වගඋත්තරකරු වන එම්.ඩී. පෙරේරා (කාර්ය භාර නිලධාරි) සහ 3 වන වගඋත්තරකරු වන අයි. ඩී. පෙරේරා (වාට්ටු භාර නියාමක) සිදුවීමට අදාළ දිනයේ වගකීම් සහිත නිලධාරීන් ලෙස හඳුනා ගැනෙන අතර වින්දිත පාර්ශවයට සිදුවූ අගතිය සම්බන්ධයෙන් සත්‍ය කරුණු වසන් කිරීම හා වගකීම් වලින් බැහැරව වින්දිතයන් හට ආරක්ෂාව සැපයීමට අපොහොසත්ව රාජකාරී කටයුතු සිදුකර ඇති හෙයින් සිදුවීමට අදාළ වගඋත්තරකරුවන් ලෙස හඳුනාගෙන ඇත.

4 වන වගඋත්තරකරු වන සහකාර බන්ධනාගාර අධිකාරි ඩී.එම්. නිමල් ශාන්ත මහතා විසින් 1වන වගඋත්තරකාර එම්. එල් උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) නිලධාරියා දරුවන්ගේ විනය විරෝධී ක්‍රියා කලාපය පාලනය සඳහා අවම බලය පාවිච්චි කර ඇති බව සඳහන් කර ඇත. ඇතැම් රැඳවියන් සාමාන්‍ය හැසිරීම් රටාවෙන් වෙනස්ව හැසිරෙනවා නම් ඔවුන් මර්ධනය කිරිමට ගන්නා ක්‍රියා මාර්ගය අවම බලය ලෙස ද ඔහු විසින් අර්ථ දක්වා ඇත. ළමා රැඳවියන් හය දෙනෙකු රළු පොලවක දණහිස් තුවාල වන ලෙස ඇවිදවීමට යම් නිලධාරියෙකු විසින් කටයුතු කිරීම අවම බලය ලෙස අර්ථ නිරූපනය කිරීම වගකිව යුතු නිලධාරියකු වශයෙන් ඔහුගේ වෘත්තීමය තත්ත්වය අනුව ඉතා කණගාටුදායක තත්ත්වයක් ලෙස නිරීක්ෂණය වේ. එසේම, 4 වන වගඋත්තරකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ දැනුම්දීම මත වින්දිතයන් පැය 48ක් ඇතුලත අධිකරණ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම අගතිය සම්බන්ධයෙන් වගඋත්තරකරුවෙකු ලෙස හඳුනාගෙන ඇත.

5 වන වගඋත්තරතරු වන එවකට ප්‍රධාන ජේලර්වරයා වූ අජිත් පල්ලියගේ මහතා විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් සාධාරණ සහ යුක්තිසහගත මූලික විමර්ශනයක් පවත්වා 1,2 සහ 3 වන වගඋත්තරකාර නිලධාරීන් හට චෝදනා ගොනු කර විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශ කර ඇති බව ද නිරීක්ෂණය වේ.

එසේම, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් අංක ඩී17/වටරක/පොදු සහ 2024.08.24 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් වටරැක බන්ධනාගාරයේ සිදු වූ මෙම විනය විරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් එවකට ප්‍රධාන ජේලර්වරයා වූ අජිත් පල්ලියගේ මහතා විසින් සිදු කරන ලද මූලික විමර්ශනයට අනුව දෙවන පෙළ ජේලර් - එම්.එල්.එල්. උදාර සුමනපාල, සැරයන්- එම්.ඩී. පෙරේරා සහ නියාමක - කේ.අයි.ඩී. පෙරේරා යන නිලධාරීන්ට එරෙහිව පළමු උපලේඛනය යටතේ චෝදනා ගොනු කිරීමට නිර්දේශ කර මූලික විමර්ශන වාර්තාව වටරැක බන්ධනාගාර අධිකාරී වෙත යොමු කර ඇති බවත්, ඉන් අනතුරුව වටරැක බන්ධනාගාර අධිකාරී විසින් දෙවන පෙළ ජේලර් - එම්.එල්.එල්. උදාර සුමනපාල නිලධාරියාට එරෙහිව පමණක් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ දෙවන උපලේඛනය යටතේ චෝදනා පත්‍ර කෙටුම්පත් කර අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව 2020.07.15 දිනැතිව අනුමත කරන ලද චෝදනා පත්‍රය තුළ සඳහන් චෝදනාවට දෙවන පෙළ ජේලර් - එම්.එල්.එල්. උදාර සුමනපාල

මහතා විසින් වරද පිළිගෙන නිදහසට කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අංක ඩී17/වටරක/35/20 සහ 2020.10.06 දිනැතිව නිලධාරියා චෝදනාවට වැරදිකරු කරමින් දින 05ක වැටුප් දඩ ගසා වැලිකඩ බන්ධනාගාරයට ස්ථාන මාරු කර ඇති බව දන්වා ඇත. මේ අනුව මෙම සිදුවීමට අදාළව 1 වන වගඋත්තරකරු වන දෙවන පෙළ ජේලර් - එම්.එල්.එල්. උදාර සුමනපාල මහතා සම්බන්ධයෙන් පමණක් විනය ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

**<u>නිගමනය</u>**

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේ දී 1 වන වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) විසින් 1, 2, 3, 4, 5 සහ 6 වින්දිත තැනැත්තන්ගේ දණහිස් තුවාල වන අයුරින් රළු පොළවක් මත දණහිසින් ඇවිද්දවා ඇති බවත්, 1 වන වින්දිත තැනැත්තා හැර අනෙකුත් 2,3,4,5 සහ 6 වින්දිත තැනැත්තන් හට පහරදීම් සිදුකර ඇති බවත් තහවුරු වී ඇති බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කොට ඇති "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර ආමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාර එම්.එල්.උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) නිලධාරියා විසින් 01,02,03,04,05 සහ06 යන වින්දිත තැනැත්තන් සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

2 වන වගඋත්තරකරු වන එම්.ඩී. පෙරේරා (කාර්ය භාර නිලධාරි) සහ 3 වන වගඋත්තරකරු වන කේ. අයි. ඩී. පෙරේරා (වාට්ටු භාර නියාමක) සිදුවීමට අදාළ දිනයේ බී 2 වාට්ටුවේ රාජකාරී භාරව සිටි නිලධාරීන් වන බැවින් වින්දිත පාර්ශවයට සිදුවූ අගතිය සම්බන්ධයෙන් සත්‍ය කරුණු වසන් කිරීම හා වගකීම් වලින් බැහැරව වින්දිතයන් හට ආරක්ෂාව සැපයීමට අපොහොසත් වීම මත ඉහත කී මූලික අයිතිවාසිකම් උල්ලංඝණය සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බව ද නිගමනය කරනු ලැබේ.

4 වන වගඋත්තරකරු වන සහකාර බන්ධනාගාර අධිකාරි ඩී.එම්. නිමල් ශාන්ත මහතා විසින් මෙම සිදුවීම වාර්තා වූ අවස්ථාවේදී වින්දිත තැනැත්තන් අධිකරණ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඔහු හට පැවරී ඇති රාජකාරීමය වගකීම් පැහැරහැර ඇති බවත්, තමා යටතේ සිටින රැඳවියන්ගේ ආරක්ෂාව පිළිබඳව ඔහු හට පවතින අධීක්ෂණ වගකීමෙන් කිසිදු විටෙක බැහැර විය නොහැකි බවත් නිගමනය කරනු ලැබේ. එසේම, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තුවාලකරුවන් අධිකරණ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කරන ලෙසට සිදු කරනු ලැබූ නියමය ද නොසලකා හැර හා/හෝ ප්‍රමාද කිරීම මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම 4 වන වගඋත්තරකරු වන සහකාර බන්ධනාගාර අධිකාරි ඩී.එම්. නිමල් ශාන්ත මහතා විසින් උල්ලංඝණය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

තවද, මෙම ප්‍රශ්නගත සිදුවීම සිදු වූ කාලවකවානුවේදී වටරක බන්ධනාගාරය තුළ ප්‍රධාන ජේලර්වරයා වශයෙන් කටයුතු කළ අජිත් පල්ලියගේ මහතා 5 වන වගඋත්තරතරු වශයෙන් නම් කර තිබුණ ද, ඔහු විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් සාධාරණ සහ යුක්තිසහගත මූලික විමර්ශනයක් පවත්වා නිර්දේශ නිකුත් කිරීමට කටයුතු කර ඇති බැවින්, ඔහු හට එකී සිදුවීමට අදාළව ඍජු හෝ වක්‍ර වගකීමක් පැවරිය යුතු බවට කරුණු අනාවරණය නොවන බවට ද නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

01. 1 වන වගඋත්තරකාර එම්. එල් උදාර සුමනපාල (දෙවන පෙළ ජේලර්) නිලධාරියා විසින් එක් වින්දිත තැනැත්තෙකු සඳහා රුපියල් දෙදහස් පන්සියය (රු.2,500/-)ක මුදලක් බැගින් රුපියල් පහළොස්දහස (රු.15,000/-)ක මුදලක් වින්දිත තැනැත්තන් හයදෙනා වෙත වන්දි වශයෙන් ලබාදිය යුතු ය.

02. 2 වන වගඋත්තරකරු වන කාර්ය භාර නිලධාරි එම්.ඩී. පෙරේරා , 3 වන වගඋත්තරකරු වන වාට්ටු භාර නියාමක කේ. අයි. ඩී. පෙරේරා සහ 4 වන වගඋත්තරකරු වන සහකාර බන්ධනාගාර අධිකාරි ඩී.එම්. නිමල් ශාන්ත යන නිලධාරීන් එරෙහිව සුදුසු විනයානුකූල පියවර ගෙන මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කළ යුතු ය.

03. වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා එළිමහන් වැඩ කඳවුර තුළ සිටින රැඳවියන් හට ඇඳුම් පැළඳුම් ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් සුදුසු පියවර ගත යුතු ය.

2024.11.20 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් :-

01. අමාත්‍යතුමා,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නො.19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ10

02. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
බන්ධනාගාර දෙපාර්තමේන්තුව,
නො.150, බේස්ලයින් පාර,
කොළඹ 09.

**<u>නිර්දේශ අංක 04</u>**

පැමිණිලිකරු : ජැක්සන් ප්‍රේමසිරි කන්නන්ගර මහතා,
K.E.W. අපර් ඇබර්ඩීන් පවර් ග්‍රිඩ් ලිමිටඩ්,
අංක 115ඒ, පාසල් මාවත,
ගංගොඩවිල, නුගේගොඩ.

වගඋත්තරකරුවන් : 01. සභාපති,
මධ්‍යම පරිසර අධිකාරිය,
පරිසර පියස,
අංක 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් පරිසර අධිකාරි කාර්යාලය,
පොල්ගොල්ල.

**<u>පැමිණිලි අංකය : HRC/4835/23</u>**

**පැමිණිල්ල :**
ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, යෝජිත ඉහළ ඇබර්ඩීන් කුඩා ජල විදුලි බලශක්ති ව්‍යාපෘතිය සඳහා පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදානාගාරයක් අළුතින් ස්ථාපනය කිරීමට අදාළව පැමිණිලිකරු විසින්,

01. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
02. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය
03. ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය
04. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
05. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
06. ගොවිජන දිස්ත්‍රික් කාර්යාලය
07. අඹගමුව ප්‍රාදේශීය සභාව
08. මධ්‍යම පරිසර අධිකාරිය
09. ශ්‍රී ලංකා සුනත්‍ය බලශක්ති අධිකාරිය
10. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
11. අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
12. මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය
13. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

යන ආයතන වලින් අනුමැතිය ලබාගෙන ඇති බවත්, ඒ අනුව පරිසර අමාත්‍යංශයේ එකඟත්වය මත ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබියදී, ගැසට් පත්‍රයේ පළ කර තිබියදී සුනිත්‍ය බල ශක්ති අධිකාරිය ගිවිසුම් ගතව බලපත්‍රය නිකුත් කර තිබියදීත්, නෛතික ලංකා විදුලි බල මණ්ඩලයේ එකඟත්වය තිබියදීත්, කිසිදු නෛතික හිමිකමක් නොමැති පළාත් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ

විසින් ඉහත සියළුම අනුමැතීන් අභිබවා කටයුතු කර අප්‍රතිකාරි අලාභයක් සිදුකර ඇති බවට පැමිණිල්ලක් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිදුකර ඇත.

පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, අදාළ සියළුම ආයතන වලින් අනුමැතිය දීමෙන් අනතුරුව සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ව්‍යාපෘති ඉදි කිරීම් බලපත්‍රය ද මහජන උපයෝගීතා කොමිසමෙන් බලශක්ති නිපදවීමට බලපත්‍රය සහ ලංකා විදුලි බල මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය විසින් නිපදවන විදුලිය මිලට ගැනීමේ ගිවිසුම ද අත්සන් කිරීමෙන් පසුව 2012.01.31දින සිට 2014.01.31 දින දක්වා කාලය තුළ දී ඉදි කිරීම සම්පූර්ණ කර පෙබරවාරි සිට විදුලි බලය සැපයීමට නියම කර තිබුණු බවත්, ඉදි කිරීම් ආරම්භ කිරීමෙන් පසුව එම ප්‍රදේශයේ දේශපාලන ආයතනයක බලපෑම මත මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2014.07.21 දින ලිපියකින් අප වෙත දන්වා සිටියේ එම ගඟ දිගේ මීටර් 60ක් පමණ උසින් ඇති ගල් ගෙඩි වල දක්වා බලාගාරය දීර්ඝ කර ගඟේ හරස් බැම්ම කැමති දුරක් උසට ගන්නා ලෙසත්, මෙම වෙනස් කිරීම අනුමත ව්‍යාපෘතියට සංශෝධනයක් පමණක් බවත්, අවශ්‍ය සැලසුම් හා අතිරේක වාර්තාව ලැබුනු වහාම එය අනුමත කළ හැකි බවත්, බලාගාරයේ ඉදි කිරීම් ඉදිරියට ගෙන යා හැකි බවත්ය.

ඉහත සංශෝධන සඳහා නැවත මැන පාරිසරික අතිරේක වාර්තාව ලබා දීමට හැකිවූයේ 2016.10.04 දින බවත්, (තවද, ප්‍රමාද වීමට හේතුව ලෙස අයහපත් කාලගුණයක් පැවති බැව් සඳහන් කර ඇති අතර) එම සංශෝධනය බැලීමට යාම සඳහා රු. 50,000/- ගෙවන ලෙසට මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2019.03.22 දින දී දැනුම් දුන් පසුව පැමිණිලිකරු විසින් අදාළ මුදල ගෙවා නිම කළ බවත්, එයින් පසුව පරිසර අධිකාරිය විසින් 2019.06.03 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත්තේ පරිසර අධිකාරිය විසින් කරනු ලැබූ එකී යෝජනා ඇතුළත් ව්‍යාපෘතියට අනුමැතිය දිය නොහැකි බවය. එසේම, එම තීරණයට එරෙහිව අමාත්‍යාංශ ලේකම් වෙත දින 30ක් ඇතුළත අභියාචනාවක් සිදුකරන ලෙසටත් දැනුම්දීමක් සිදුකළ බවත් පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

එහෙත් පැමිණිලිකාර ආයතනයේ අධ්‍යක්ෂ විදේශ ගතව සිටි බැවින්, 2019.06.03 දින ලිපියට පිළිතුරක් එවීමට දින දීර්ඝ කර දෙන ලෙසට ඉල්ලා සිටියද, එම ලිපියට ප්‍රතිචාරයක් නොලැබුණු බවත්, එසේ වුවද එම ලිපිය ලේකම්වරයා වෙත යොමු කර ඇති බව පැමිණිලිකරු සිතූ බවයි. කෙසේ වෙතත්, පැමිණිලිකාර ආයතනයේ අධ්‍යක්ෂවරයා ලංකාවට පැමිණීමෙන් පසුව අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය ප්‍රතික්ෂේප වී ඇත. පසුව මෙම ව්‍යාපෘතිය සඳහා දින 14ක් ඇතුළත අවසර ලබාදෙන ලෙසට 2021.08.17 දිනැතිව සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත දන්වා ඇතත්, පරිසර අධිකාරිය විසින් එකී ලිපියට ද ප්‍රතිචාර දක්වා නොමැති අතර, 2023.10.19 දින පරිසර අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේදී එහිදි සහභාගිවූ සෑම දෙනාම පැමිණිලිකාර සමාගමට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගත් බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :**

වගඋත්තරකාර මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කොමිෂන් සභාව වෙත 2024.01.03 දින ලිඛිත දේශන මඟින් ප්‍රකාශ කර ඇත්තේ අයදුම්කරු විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ අනුමැතිය ලබාදීම සඳහා වූ කමිටුවක් අධ්‍යක්ෂ ජනරාල් මධ්‍යම පරිසර අධිකාරිය, අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන සාමාජිකයින්ගෙන් සමන්විතව රැස්වී ඇති බවත්, යෝජිත ව්‍යාපෘතිය මඟින් දිය ඇල්ලට හානියක් නොවන බව හඳුනා ගැනීමෙන් පසුව අංක PA – 207001 හා 2003.10.12 දින දරණ සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ අනුමැතිය ලබාදී ඇති බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා පරිසර බලපෑම ඇගයීමේ ක්‍රියාවලිය යටතේ මූලික පාරිසරික පරීක්ෂණයක් 2008 වර්ෂයේ සිදුකර ඇති අතර, 2010.09.03 දින පාරිසරික

අනුමැතිය ද අවුරුදු තුනක් සඳහා ලබාදී ඇති බවත්, මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය සඳහා භූ විද්‍යා වාර්තාව, නායයාම් අධ්‍යයන වාර්තාව, ජල විද්‍යාත්මක වාර්තාව, ශාක හා සත්ව අධ්‍යයන වාර්තාව, මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව යන වාර්තාවන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව විවිධ පාරිසරික බලපෑම් පිළිබඳව කරුණු අනාවරණය වී ඇති බවත්, ප්‍රධාන වශයෙන්ම මෙම ව්‍යාපෘතිය අයත් බිම් ප්‍රදේශය වන සංරක්ෂන දෙපාර්තමේන්තුවට අයත් බැවින්, එම ආයතනයෙන් අවසර ලබා නොතිබීම හා ඇබර්ඩීන් දිය ඇල්ලට ඉහළින් ඇති කුඩා දිය ඇලි සිඳී යාමෙන් දිය ඇල්ලේ අලංකාරය අඩු වී යාම ගැන ගැටළුවක් නිරීක්ෂණය වී ඇති බැවින්, මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නියෝගය පරිදි අදාළ ව්‍යාපෘති භූමිය පිළිබඳ මිනින්දෝරු වාර්තාවක් ලබාගත් බවත්, ඇබර්ඩීන් දිය ඇල්ලට ඉහළින් පවතින කුඩා දිය ඇලි පිළිබඳව තාක්ෂණ කමිටුවේ නිලධාරින්ගේ නිර්දේශයට අනුව එම දිය ඇලි වල සුන්දරත්වය පවත්වා ගැනීම සඳහා ජලය 700 1/5 – 1 නිදහස් කිරීම ප්‍රමාණවත් බවත්, මෙම ගණනය කිරීමට පදනම් වී ඇත්තේ වර්ෂා කාල වලදී උපරිම විදුලිය ගණනය කිරීමෙන් වර්ෂාව අඩු කාල වලදී විදුලිය ජනනය කිරීම අත්හිටුවීමට යටත්ව බවත්, එම නිසා ඇබර්ඩීන් දිය ඇල්ලට හානි නොවීම ඉහළ දිය ඇලි වල සුන්දරත්වය හැකිතාක් ආරක්ෂා කිරීම සහ වර්ෂා කාල වලදී උපරිම විදුලි ජනනයක් සිදුකිරීම එම කමිටුවේ සාමුහික තීරණයක් වී ඇත. මේ සම්බන්ධයෙන් පාරිසරික හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2013.06.04 දින පැවති විශේෂ සාකච්ඡාවෙන් ඇමතිතුමාගේ උපදෙස් පරිදි පහත තීරණයන්ට එළබී ඇත.

01. ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර නිරීක්ෂණ, නිගමනයන් සහිත වාර්තාවක් මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති විසින් ඇමතිතුමාට ඉදිරිපත් කිරීම.
02. මින් ඉදිරියට කුඩා ජල විදුලි බලාගාරයන් ඉදි කිරීමේදී සුදුසු ස්ථාන සංගනනය කොට ඒවායේ කාර්ය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් සිදුකිරීම.
03. ශක්‍යතා අධ්‍යයනයෙන් පසුව සුදුසු යැයි හඳුනා ගනු ලබන ස්ථාන වල අදාළ පාරිසරික වාර්තා ඉඩම් නිරවුල් කර ගැනීම ආදී සියළුම ආයතන වලින් ලබාගත යුතු අනුමැතීන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදුකිරීම.
04. අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමෙන් පසු විවෘත මිල ගණන් කැඳවීමෙන් පසුව කොන්ත්‍රාත් සමාගමට ව්‍යාපෘතිය ලබාදීම.

පළවන තීරණය අනුව 2013.08.12 දින රැස්වීමක් හා ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් පවත්වා ඇත. ඒ සඳහා කලවැල්දෙණිය උදය රතන හිමි, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් ලේකම් නුවරඑළිය, ප්‍රාදේශීය ලේකම් අඹගමුව, දිසා වන කාර්යාලය නුවර එළිය, Provincial Land Commission, පැමිණිලිකාර ආයතනය, ඇබර්ඩීන් පරිසර පදනම යන ආයතනයන් සහභාගිවී ඇත.

එහිදී මෙම කුඩා ජල විදුලි බලාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් තමාගේ හෝ ප්‍රදේශවාසින්ගේ කිසිදු විරෝධතාවයක් නොමැති බවත්, පරිසරයට හා දිය ඇල්ලෙහි සුන්දරත්වයට හානි සිදුවන බැවින්, විදුලි බලාගාරය වම් ඉවුරට හෝ ඇල්ලෙහි ඉහළ කොටසට ගෙන යන්නේ නම්, වඩාත් සුදුසු බවටත් යෝජනා කර ඇත. ඒ අනුව දිය ඇල්ලේ සිට තවදුරටත් මෙම ව්‍යාපෘතිය ඉහළට ගෙන යාම සම්බන්ධයෙන් සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් අධ්‍යයනය කර බලාගාරයේ සහ හැරවුම් බැම්මේ සංශෝධිත ස්ථානය පිළිබඳව 2014.01.30දින මධ්‍යම පරිසර අධිකාරිය වෙත දන්වා ඇත. එම යෝජිත සංශෝධන සම්බන්ධයෙන් 2014.06.24 දින මධ්‍යම පරිසර අධිකාරිය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ප්‍රාදේශීය සභාව අඹගමුව, ගොඩනැඟිලි සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂන දෙපාර්තමේන්තුව, ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් පවත්වා ඇති අතර, අදාළ සෑම ආයතනයකින්ම නිර්දේශයන්/ කාලයන් දීර්ඝ කිරීම/ එකඟතාවයන් සහිත නව සංශෝධනයන්ට අදාළ වූ කරුණු ඇතුළත් පරිපූරක වාර්තාවක් (Supplementary Report) සැපයීමට සහ එකී වාර්තාවේ ඇතුළත් කරුණු තාක්ෂණික කමිටුවේ ඇඟයීමකට ලක් කිරීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවටත්, එසේ කටයුතු කිරීමේදී තාක්ෂනික කරුණු සහ මතුවිය හැකි සාමාජික ගැටළු ද සැලකිල්ලට ගැනීම වැදගත් වන හෙයින්, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්තුමාගේ

සහභාගීත්වයෙන් යුත් දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ විශේෂ අවධානයක් මෙම ව්‍යාපෘතිය පිළිබඳව යොමු කර නිර්දේශ ලබාගැනීමට තීරණය කළ බවත් සඳහන් කර ඇත.

කෙසේ නමුත්, 2013.08.12 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ හා එහිදී ගන්නා ලද තීරණ වලින් පසුව යෝජිත ව්‍යාපෘතියේ හැරවුම් බැම්ම සහ බලාගාරය ඉදි කිරීමට යෝජිත සංශෝධිත ස්ථාන පිළිබඳව විවිධ විරෝධතා ඉදිරිපත් කර ඇති බවත්, 2016.10.11 දින ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත නව ස්ථානය පිළිබඳව අතිරේක වාර්තාවක් ඉදිරිපත් කරන ලද බවත්, එම වාර්තාව අනුව සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලිපියෙහි වලංගුතාවය පිළිබඳ නිශ්චිත දිනයක් නොමැති හෙයින්, ඒ සම්බන්ධව විමසා 2018.10.12 දින පැවති Over site කමිටුව වෙත ඉදිරිපත් කර උපදෙස් ඉල්ලා ඇත. එහිදී ලබාදුන් උපදෙස් අනුව සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් නිරීක්ෂණය කරන ලද වලංගු Provincial Approval ඉදිරිපත් කරන ලෙසටත්, ඉන්පසුව පාරිසරික අනුමැතිය Env. Approval ලබාදීම සලකා බලන බවත් පැමිණිලිකරුට දැනුම්දෙන ලදි. (දැනුම් දුන් ලිපිය අමුණා නොමැත)

එහෙත්, ඔහු විසින් වලංගු Provincial Approval ඉදිරිපත් කර නැති අතර, 2018.01.15 වන දින සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් නිකුත් කර ඇති ලිපිය මඟින් සඳහන් කර ඇත්තේ, අදාළ ව්‍යාපෘතියේ නව ස්ථාන සඳහා බලශක්ති බලපත්‍රයේ (Energy Permit) වලංගු කාලය දීර්ඝ කිරීම සඳහා වලංගු පාරිසරික නිර්දේශය බලාපොරොත්තු වන බවයි.

ඉහත කරුණු දෙක සම්බන්ධයෙන් 106 වන තීරණ ගැනීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නැවත තාක්ෂණික කමිටුවක් කැඳවා ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දී ඇති බවත්, එම කමිටුවේ වාර්තාව අනුව එම ස්ථානය නුසුදුසු බැවින්, අනුමැතිය අවලංගු කර ඇති බවටත් කරුණු දක්වා ඇත. තවද එසේ අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බවට 2019.06.03 දින ව්‍යාපෘති යෝජක වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දී ඇති අතර, එම තීන්දුවෙන් අතෘප්තියට පත් වන්නේ නම්, දින 30ක් ඇතුළත පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් යොමු කළ යුතු වුවද, එම අභියාචනය ගොනු කර ඇත්තේ 2019.08.29 දිනැතිවය. ඒ අනුව නියමිත කාලය තුළ දී අභියාචනය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම අභියාචනය විභාග කළ නොහැකි බවට 2023.02.03 දිනැති පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරි විසින් අභියාචක වෙත දන්වා ඇති බවටත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :**

පැමිණිලිකරු විසින් පහත සඳහන් ආයතන වලින් ඔහුගේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගෙන ඇති බවට නිරීක්ෂණය වේ.

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය
3. ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය
4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
5. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
6. ගොවිජන දිස්ත්‍රික් කාර්යාලය
7. අඹගමුව ප්‍රාදේශීය සභාව
8. මධ්‍යම පරිසර අධිකාරිය
9. ශ්‍රී ලංකා සුනත්‍ය බලශක්ති අධිකාරිය
10. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
11. අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
12. මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය
13. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් සියළු අනුමැතීන් ලබාගැනීමෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරිය 2010.09.06 දිනැතිව ඉහත කී ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කොන්දේසි කිහිපයක් සහිතව අවුරුදු 03 ක කාලයක් සඳහා අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරියේ අංක CEA/CPO/NW/P&E/08/32 හා 2010.09.06 දිනැතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කොන්දේසි කිහිපයක් සහිතව අවුරුදු 03 ක කාලයක් සඳහා අනුමැතිය ලබාදීම හා අදාළ අනෙකුත් ආයතන වෙතින් ලබාදී ඇති නිර්දේශ ප්‍රකාරව සුනත්‍ය බලශක්ති අධිකාරිය විසින් අංක EP/322900 හා 2012.01.31 දිනැතිව විදුලි බලාගාරය ඉදි කිරීමට අවශ්‍ය බලපත්‍රය නිකුත් කර ඇත. පැමිණිලිකරු වෙත ලබාදී තිබූ Envirnmental Approval පත්‍රයට හිමි වලංගු කාලය තුළදී වගඋත්තරකරු වෙත රාජ්‍ය නොවන සංවිධාන හා ගම්වාසීන් විසින් කරන ලද පැමිණිලි හේතු කොට ගෙන සහ අදාළ ව්‍යාපෘතියේ ඉදි කිරීම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කොටසක් ඇතුළත් වන පරිදි තිබුණු හෙයින් ද, පරිසර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් 2013.06.04 දින පැවති රැස්වීමේදී නැවත ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට මධ්‍යම පරිසර අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත උපදෙස් දී ඇති බවට නිරීක්ෂණය වන අතර, අදාළ ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නොවන බවත්, ඉඩම් කොමසාරිස් විසින් අවසර ලබාදී ඇති බවත්, සාමාන්‍යාධිකාරී වන (DG) වන සංරක්ෂන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර ඇත. පළමුවන උපදෙස් අනුව වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා 2013.08.12 රැස්වීමක් හා ඒකාබද්ධ ක්ෂේත්‍ර පරික්ෂණයක් පවත්වා ඇති බවට ද කරුණු තහවුරු වේ.

එම රැස්වීමේදී හරස් බැම්ම සහ බලාගාරයේ ඉදි කිරීම සම්බන්ධයෙන් විකල්ප යෝජනා ඉදිරිපත් කර ඇත. ඒ අනුව නව සංශෝධිත ස්ථානය පිළිබඳව 2014.05.30 දින මධ්‍යම පරිසර අධිකාරිය වෙත සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි දැන්වීමෙන් අනතුරුව 2014.06.24 දින ඒකාබද්ධ පරික්ෂණයක් (යෝජිත සංශෝධනය) පවත්වා නව සංශෝධනයට අදාළ පරිපූරක වාර්තා සැපයීමෙන් අනතුරුව තාක්ෂණික කමිටුවේ ඇගයීමට ලක් කර පසුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමැතිය ලබාදීමට කටයුතු කරන බවටත්, එසේ අනුමැතිය ලබාදීමට පෙර තාක්ෂණික කරුණු සහ මතුවිය හැකි ගැටළු සැලකිල්ලට ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙතින් නිර්දේශ ලබාගන්නා බවටත් තීරණය කර ඇත.

අදාළ නව සංශෝධනය පැමිණිලිකරු වෙත 2014.07.21 දින යවා ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරු නැවත මැන පාරිසරික අතිරේක වාර්තාවක් 2016.10.04 දින ලබාදුන් බවත්, පැමිණිලිකරුගේ ලිඛිත සැල කිරීම් අනුව පැහැදිලි වේ. ප්‍රමාද වීමට හේතුව වශයෙන් එම කාලය තුළ අයහපත් කාළගුණයක් පැවතුනු බව පැමිණිලිකරු විසින් සඳහන් කර ඇති බවට ද නිරීක්ෂණය වේ.

එම අතිරේක වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මධ්‍යම පළාත් මධ්‍යම පරිසර අධිකාරිය වෙත යවා ඇත්තේ 2017.09.22 දින බවත්, එනම් අවුරුද්දකට ආසන්න කාලයක් ගත කර ඇති බවට නිරීක්ෂණය වන අතර, එම සංශෝධිත ස්ථානය බැලීමට යාම සඳහා රු. 50,000/- ක් ගෙවන ලෙසට පැමිණිලිකරුට දැනුම් දී ඇත්තේ 2019.03.22 දින බවත්, ඒ අනුව අදාළ ගෙවීම දැනුම්දීම සඳහා වසර 2 ½ ක් පමණ කාලයක් ගත කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින්ම යෝජනා කරන ලද එකී නව සංශෝධනයට අදාළව පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා අවුරුදු 2 ½ ක කාලයක් ගත කර ඇති නමුත්, ඒ සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කර නොමැති බවට නිරීක්ෂණය වේ.

තවද, 2013.08.12 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂණය හා ඒ අනුව ගන්නා ලද තීරණ වලින් පසුව මෙම ව්‍යාපෘතියේ සංශෝධිත ස්ථානය සම්බන්ධයෙන් ගම්වාසීන්ගේ ජල අවශ්‍යතාවයට බලපෑමක් වන බවට ගම්වාසීන් විසින් ප්‍රකාශ කර ඇති බව 2019.06.03 දිනැති මධ්‍යම පරිසර අධිකාරියේ ලිපියේ සඳහන් වුවද, එය සනාථ කිරීමට කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැත.

පැමිණිලිකරු විසින් 2016.10.11දින ඉදිරිපත් කරන අතුරු වාර්තාව සම්බන්ධයෙන් Over site කමිටුවෙන් උපදෙස් ලබාගැනීම සඳහා එම වාර්තාව ඉදිරිපත් කර ඇත්තේ 2019.10.12 දිනදීය. එනම්, වසර 03කට පසුව බවට නිරීක්ෂණය වේ. තවද, අදාළ යෝජිත ව්‍යාපෘතියේ හරස් බැම්ම සහ බලාගාරය සම්බන්ධව සංශෝධිත ස්ථානයන් පිළිබඳව යෝජනා කර ඇත්තේ වගඋත්තරකරු හා ඊට සම්බන්ධ අනිකුත් ආයතන වලින් සමන්විත ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් හා සාකච්ඡාවෙන් අනතුරුව බවත්, කෙසේ නමුත් ඔවුන් විසින්ම යෝජනා කරන ලද සංශෝධිත ස්ථාන නුසුදුසු බවට තාක්ෂණික කමිටුව විසින් තීරණය කිරීම හේතුවෙන් බලපත්‍ර අවලංගු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

බලපත්‍රය අවලංගු කිරීමේ තීන්දුවට විරුද්ධව දින 30ක් ඇතුළත පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනා කිරීමේ හැකියාවක් පැවති නමුත්, පැමිණිලිකරු විසින් අධ්‍යක්ෂවරයා විදේශ ගතව සිටි බැවින්,

අභියාචනා කිරීමට දින දීර්ඝයක් ඉල්ලා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලිපියක් යවා ඇත. එහෙත් එකී ලිපිය සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේ ලේකම් කිසිම අවස්ථාවක මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනුවත් කිරීමක් සිදුකර නොමැති බවට නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරු නිසි කාලය තුළ දී ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බවට සලකා පැමිණිලිකරු විසින් ලේකම් වෙත ගොනු කර ඇති 2019.08.27 දිනැති අභියාචනය ප්‍රතික්ෂේප වී ඇති බවට ද නිරීක්ෂණය වේ. තවද, මෙම ව්‍යාපෘතිය දින 14ක් ඇතුළත කරගෙන යාමට ඉඩ ලබාදෙන ලෙසට සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් 2021.08.19 දින මධ්‍යම පරිසර අධිකාරිය වෙත දැනුම්දී තිබුණ ද, එම ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රතිචාර දක්වා ඇති බව අනාවරණය නොවේ. ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත ස්ථානය පිළිබඳ අතිරේක වාර්තා සම්බන්ධව කටයුතු කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් සාධාරණ හේතුවක් ඉදිරිපත් නොකර අවුරුදු 03කට ආසන්න කාලයක් ගත කර තිබියදීත් පැමිණිලිකරු විසින් සාධාරණ හේතුවක් මත (එනම්, ආයතනයේ අධ්‍යක්ෂවරයා විදේශ ගතවීම) අදාළ තීන්දුවට විරුද්ධව අභියාචනා කිරීම සඳහා දින දීර්ඝයක් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කරමින් මධ්‍යම පරිසර අධිකාරියේ තීන්දුව ලබාදී දින 30ක් ඇතුළත මධ්‍යම පරිසර අධිකාරිය වෙත යවන ලද ලිපිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැති බවත්, මෙවැනි විශාල මුදලක් වැය කරමින් ජාතික බල ශක්ති ඉලක්කයක් සපුරා ගැනීම සඳහා වන ව්‍යාපෘතියකට ලබාදෙන ලද අනුමැතිය අවලංගු කිරීමට අදාළව කරන ලද අභියාචනයක් සලකා බැලීමේදී මධ්‍යම පරිසර අධිකාරිය සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා වඩා සැලකිලිමත්ව කටයුතු කිරීමට තිබූ අවස්ථාවන් ද පැහැර හැර ඇති බවට වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු වෙත ඔහුගේ අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවශ්‍ය වන සියළුම අවසර හා අනුමැතියන් ලබාදී තිබියදීත් වගඋත්තරකරු විසින් පරිසර අනුමැතිය (Env. Approva) වලංගුව පවතින කාලය තුළ දී මෙම ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාමට රාජ්‍ය ආයතන විසින්ම අවහිරතා ඇති කර තිබෙන බව නිරීක්ෂණය වේ.

තවද රටේ ආර්ථික තත්ත්වය ද ඉහළ නැංවීමට සහයෝගයක් ලබාගැනීමට සහ රටේ පුරවැසියන්ට ද අවශ්‍ය වන මෙවන් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් අදාළ පැමිණිලි පාර්ශවය වන ව්‍යාපෘති යෝජක විසින් විශාල මුදලක් වැය කිරීමට පෙර අවශ්‍ය අනුමැතියන් ලබාදීමට පෙර සියළුම පරීක්ෂණ කටයුතු විධිමත්ව කිරීමෙන් අනතුරුව සහ මහජනතාවගෙන් ලැබෙන ප්‍රතිචාර ද සලකා බැලීමෙන් අනතුරුව මෙවැනි ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම සුදුසු නමුත්, මෙම පැමිණිලිකරුට අදාළ සියළුම කරුණු සලකා බැලීමේදී ඉහත සඳහන් පරිදි නිසි ලෙස වගඋත්තරකරු ක්‍රියාත්මක වීමට අපොහොසත් වී ඇති අතර, විශාල මුදලක් වැය කර අදාළ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව විවිධ සංශෝධන යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු විසින් 2010.09.06 දින අදාළ අනුමැතිය ලබාදී (Environmental Approval) 2019.06.03 මෙම ව්‍යාපෘතියට අදාළ සංශෝධිත ස්ථාන නුසුදුසු බවට තීරණය කර ඇත. එනම්, ව්‍යාපෘතියට අදාළව

ස්ථාන සුදුසු ද නැත්ද යනුවෙන් තීරණය කිරීමට අවුරුදු 10කට ආසන්න කාලයක් ගත කර ඇත. ශ්‍රී ලංකාව වැනි කුඩා රටක මෙවැනි තීන්දුවක් ලබාගැනීමට විශාල කාලයක් ගත කිරීම තුළින් රටේ සංවර්ධනයට හානියක් වන අතර, වැය කරන මුදල් හි වටිනාකමට ද මෙවැනි තත්ත්වයන් බලපෑම ඇති කර ඇති බවට ද නිරීක්ෂණය වේ.

ඒ අනුව අවුරුදු 10කට ආසන්න කාලයක් වැය කිරීමෙන් අනතුරුව සහ වගඋත්තරකරුවන් විසින්ම යෝජනා කරන ලද සංශෝධන ස්ථානයන් නුසුදුසු බවට තීරණය කරමින් බලපත්‍ර අවලංගු කිරීමට ගන්නා ලද අවසන් තීන්දුවෙන් පැමිණිලිකරුට විශාල අලාභයක් සිදුවී ඇති බව එමෙන්ම, විශේෂයෙන්ම පරිසර අධිකාරිය ඇතුළු සමහර රාජ්‍ය ආයතන වල අක්‍රිය ක්‍රියාකාරිත්වය මන්දගාමී බව විධිමත් පටිපාටියකට ක්‍රියා නොකිරීම ආදී කරුණු මඟින් ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති නීතිය ක්‍රියාත්මක කිරීම හා රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය යන මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමන කරමු.

එසේම පැමිණිලිකරුට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(උ) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් ද වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය මඟින් උල්ලංඝනය වී ඇති බවට ද නිගමනය කරමු.

එසේ හෙයින් කොමිෂන් සභාව පහත සඳහන් පරිදි නිර්දේශ කර සිටි.

01. පැමිණිලිකරුට සිදුවී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධව මධ්‍යම පළාත් මධ්‍යම පරිසර අධිකාරිය හා එහි වගකීම් දරණ නිලධාරින් විසින් හා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ සම්බන්ධව විමර්ශනයක් කොට ඔවුන්ට විරුද්ධව සුදුසු විනය පියවර ගත යුතුය.

02. පැමිණිලිකරුට සිදුවී ඇති අලාභය තක්සේරු කර පැමිණිලිකරු වෙත ප්‍රමාණවත් වන්දි මුදලක් ලෙස ගෙවීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිසි පියවර ගත යුතුය.

2024.09.26 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බව ද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් :
01. පරිසර අමාත්‍යතුමා, පරිසර අමාත්‍යාංශය
02. ලේකම්, පරිසර අමාත්‍යාංශය.
03. සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
04. සභාපති, ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය
05. සභාපති, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

**<u>නිර්දේශ අංක 05</u>**

පැමිණිලිකාර පාර්ශවය : රුක්ෂාන් ප්‍රනාන්දු,
ගැමුණු මාවත,
අත්තිඩිය,
දෙහිවල.

වගඋත්තරකාර පාර්ශවය : නාවික හමුදාපති,
ශ්‍රී ලංකා නාවික හමුදාව,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
කොළඹ

**<u>පැමිණිලි අංක HRC/KI/015/2021</u>**

පැමිණිලිකරු විසින් 2021.03.05 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(h) ව්‍යවස්ථාව ප්‍රකාරව ඔහුගේ යාම් ඊමේ නිදහසේ අයිතිය උල්ලංඝනය කර ඇති බව දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු දක්වා සිටින්නේ තමා තවත් මාධ්‍යවේදීන් දෙදෙනකු සමඟ 2021 මාර්තු 5 වැනි දින අලුයම ඉරණයිමතනගර් මුලන්කාවිල් ප්‍රදේශයට පැමිණියේ ඉරණතිව් නැරඹීමේ අරමුණින් බවත්. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අදාළ මුරපොලේදී පැමිණිලිකරු සහ අනෙක් පුද්ගලයින් දෙදෙනා බෝට්ටුවක නැගී දිවයිනට යාම වළක්වා ඇත. තමා ඉරණතිව් ප්‍රදේශයට ඇතුළුවීම වැළැක්වීම තුළින් තමාගේ යාම් ඊමේ නිදහසේ අයිතිය උල්ලංඝනය වී ඇති බවට පැමිණිලිකරු පැමිණිලි කර ඇත.

පැමිණිලිකරු විසින් ඉල්ලා සිටි සහන අතරට තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව කොමිසම විසින් අනුමත කර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වගන්තිය යටතේ ගත යුතු නිසි නිර්දේශ ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලීමක් කර ඇත. එමෙන්ම පැමිණිලිකරු ඔහුගේ ඉරණතිව් යාම සඳහා වූ ගමන් වියදම ඇතුලුව පූර්ණ වන්දි මුදලක් ඉල්ලා සිටී.

**යාපනය මානව හිමිකම් කොමිසම් ප්‍රාදේශීය කාර්යාලය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය**

1. **ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයෙන් දෙන ලද වාර්තාව**

පැමිණිලිකරු විසින් කරන ලද පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිසම් සභාව, එහි යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය සම්බන්ධීකාරක හරහා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස දන්වා ඇත. ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරයා විමසා සිටියේ: (අ) නාවික හමුදාව විසින් ඉරණතිව් වෙත කිසිදු පුරවැසියෙකු හට ඇතුළුවීම වැළැක්වූවේද; සහ (ආ) එසේ නම්, එවැනි වැළැක්වීමක් සිදු කරනු ලැබුවේ කුමන නීතිමය පදනමකින්ද යන්නයි.

2021 මාර්තු 16 දිනැතිව ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් යොමු කරන ලද ලිපිය මගින් ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය සහ උතුරු මැද නාවික ප්‍රදේශය අතර 'සන්නිවේදන පරතරයක්' ඇති වී ඇති බව කොමිසමට දන්වා ඇති අතර (ප.ලි. ඉරණතිව් අයත් නාවික ප්‍රදේශය) එම දිවයිනට කිසිදු මාධ්‍යවේදියෙකුට ඇතුළුවීම වලක්වා නොමැති බවද දන්වා ඇත. එමෙන්ම, ඉදිරියේදී එම දිවයිනට යාමට මාධ්‍යවේදීන් බලාපොරොත්තු වන්නේ නම්, ශ්‍රී ලංකා නාවික හමුදාවට

දැනුම් දෙන ලෙසද ඉන්පසු දිවයිනට පැමිණීමට අදාළව සහය ලබාදිය හැකි බව ද එහි තවදුරටත් එහි සඳහන් වී ඇත.

**2. කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්ගේ වාර්තාව**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ එහි ප්‍රාදේශීය සම්බන්ධීකාරක හරහා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් වෙතින් වාර්තාවක් කැඳවා ඇත. එම වාර්තාවේ දිස්ත්‍රික් ලේකම්වරයා සඳහන් කර ඇත්තේ පූනගරි ප්‍රාදේශීය ලේකම්වරයාගේ තොරතුරුවලට අනුව ඉරණතිව් ප්‍රදේශයේ පදිංචි නොවන අයකු ඉරණතිව්වලට ඇතුළු වීමට අවශ්‍ය නම් කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් අවසර ගත යුතු ක්‍රියා පටිපාටියක් තිබූ බවයි. ඉන් අනතුරුව කොමිෂන් සභාව දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් විමසා සිටියේ: (අ) ඉරණතිව්හි පදිංචිකරුවන්ට ඉරණතිව්වෙන් පිටවීම සඳහා යම් සීමාවන් පනවා තිබේද; (ආ) ඉරණතිව්හි පදිංචිකරුවන් නොවන පුද්ගලයන්ට ඉරණතිව්වට ඇතුළුවීම සඳහා යම් සීමාවන් තිබේද; සහ (ඇ) එසේ නම්, එවැනි සීමා කිරීම් සඳහා හේතු වූ පදනම කවරේද? යන්නයි.

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරයා ප්‍රතිචාර ලෙස පහත කරුණු දක්වා ඇත.

1. ඉරණතිව්හි පදිංචිකරුවන්ට ඉරණතිව් ප්‍රදේශයෙන් පිටවීම සඳහා සීමාවන් නොමැත.

2. 2021 පෙබරවාරි 14 වන දින ඉරණතිව්හි 'අපනයන ගම්මානයක්' ආරම්භ කිරීම සඳහා මුලපිරීමක් ආරම්භ වූ අතර, එම වැඩසටහනට සහභාගී වීමට කැමති ඉරණතිව්හි පදිංචිකරුවන් නොවන පුද්ගලයන් හට ඒ සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් නාවික හමුදාව වෙතින් ලබා ගැනීමට අදහස් කරන්නේ නම් එවැනි අවස්ථාවලදී පමණක් පදිංචිකරුවන් නොවන පුද්ගලයන් ශ්‍රී ලංකා නාවික හමුදාවට, ගමන් කරන වේලාව, එනම් ප්‍රවාහන සේවා ලබා ගැනීම සඳහා අවශ්‍ය වේලාව දැනුම් දීමක් සිදු කිරීමක් ඔවුන් බලාපොරොත්තු වන බවත් එවැනි තත්ත්වයන් හැරුණු විට ඉරණතිව් වෙත ගමන් කිරීම සම්බන්ධයෙන් වෙනත් සීමාවන් නොමැති බවත්ය.

3. ඉරණතිව් පොලිස් මුරපොලක් නොමැති බැවින් ශ්‍රී ලංකා නාවික හමුදාව නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී වන බවත් එබැවින් ශ්‍රී ලංකා නාවික හමුදාව සාමාන්‍යයෙන් ඉරණතිව් ප්‍රදේශයට ඇතුළු වීමට අපේක්ෂා කරන, එම ප්‍රදේශයේ නොවන එනම් පිටස්තර පුද්ගලයින්ගේ අනන්‍යතාවය පරීක්ෂා කරන බවත් දක්වා ඇත.

**පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-**

2021 මාර්තු 16 වැනි දින ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා වෙනුවෙන් සිදුකරන ලද කරුණු දැක්වීමට ප්‍රතිචාර දක්වමින් පැමිණිලිකරු කියා සිටියේ 'සන්නිවේදන පරතරයේ' ස්වභාවය පැහැදිලි කර නොමැති බවත්, මෙම 'සන්නිවේදන පරතරය' තමා ඉරණතිව් වෙත ගමන් කිරීම උතුරු මැද නාවික ප්‍රදේශයට අනුයුක්ත ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් විසින් 2021 මාර්තු 5 වන දින වැළැක්වීමට හේතු වූ බවත්ය. පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත්තේ, සිදුවීම සිදු වූ දිනයේ දී, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිල මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් වෙන වෙනම මාධ්‍ය ආයතන දෙකකදී සඳහන් කර ඇති පරිදි, ශ්‍රී ලංකා නාවික හමුදාව අදාල දූපතට ඇතුළු වීමට අවසර දී ඇත්තේ එහි පදිංචිකරුවන්ට පමණක් බවත්, එමගින් පිටස්තරයන්ට ප්‍රවේශය සීමා කර තිබෙන බව ගම්‍ය වන බවත් ය. තවද, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සපයන ලද 'ලැයිස්තුවක්' අනුගමනය කරමින් එහි පදිංචිකාරයින්ට පමණක් ඉරණතිව් ප්‍රදේශයට ඇතුළු වීමට අවසර දෙන බවට මාධ්‍යවේදියෙකුගේ වාර්තාවේ සාක්ෂියක් ලෙස ඔහු උපුටා දක්වා ඇත.

**ගුණාත්මක කරුණු සැලකිල්ලට ගැනීම :-**

යාම් ඒමේ නිදහස මූලික මානව අයිතිවාසිකමක් වන අතර එය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(h) ව්‍යවස්ථාව යටතේ පිළිගෙන ඇත.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 12 වැනි වගන්තිය (ICCPR) විශේෂයෙන් යාමේ ඒමේ නිදහස පිළිගනී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ පොදු අදහස් අංක 27 අනුව, මෙම නිදහසේ විෂය පථය පැහැදිලි කර තිබේ. එම පොදු අදහස සඳහන් වනුයේ 'නිදහසේ ගමන් කිරීමට ඇති අයිතිය රාජ්‍යයක මුළු භූමි ප්‍රදේශයටම සම්බන්ධය සහ එවැනි අයිතියක් භූමියෙහි නිශ්චිත කොටසකට පුද්ගලයන් ඇතුළුවීම හෝ රැඳී සිටීම වැළැක්වීම, වළක්වනු ලබයි.'එමෙන්ම මෙම අයිතිය භුක්තිවිඳීම සඳහා එක් පුද්ගලයෙකු යම් කිසි හේතුවක් සඳහා ගමන් කිරීමට හෝ යම් ස්ථානයක රැඳී සිටීමට ඇති විශේෂ කාරණයක් හෝ හේතුවක් මත පදනම් නොකළ යුතුය' යන්නයි.

ICCPR යටතේ, නිදහසේ ගමන් කිරීමේ අයිතිය සීමා කළ හැක්කේ සුවිශේෂී අවස්ථාවන්හිදී පමණි. ප.ලි. සීමාව නීතියෙන් සැපයිය යුතු අතර ICCPR හි 12(3) වගන්තියේ සඳහන් නීත්‍යානුකූල අවශ්‍යතාවයක් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය යුතුය. එබැවින්, මානව හිමිකම් කමිටුව විසින් පොදු අදහස අංක 27 හි පැහැදිලි කර ඇති පරිදි, යාමේ ඒමේ නිදහස පිළිබඳ ඕනෑම සීමාවක් පැහැදිලි නීතිමය හේතු මත පදනම් විය යුතු අතර ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජනතාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය සහ සමානුපාතික විය යුතුය. සෞඛ්‍යය හෝ සදාචාරය, හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස, සහ ICCPR හි අඩංගු අනෙකුත් අයිතිවාසිකම්වලට අනුකූල විය යුතුය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(6) සහ (7) ව්‍යවස්ථා යටතේ, 14(1)(h) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති අයිතිය සීමා කළ හැක. සංචරණය කිරීමේ නිදහසට ඇති ඕනෑම සීමාවක් "නීතිය" මගින් විය යුතුය. තවද, තවනීතන්ට එදිරිව දයානන්ද දිසානායක [2003] 1Sri LR74 හි ශ්‍රේෂ්ඨාධිකරණය 15(7) ව්‍යවස්ථාව ප්‍රකාරව 'නීතියට' ඇතුළත් වන්නේ මහජන ආරක්ෂක ආඥාපනත, 1947 අංක 25 (සංශෝධිත පරිදි) යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පමණක් බව පැහැදිලි කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(6) සහ (7) ව්‍යවස්ථාව යටතේ නිදහසේ ගමන් කිරීමේ අයිතිය සීමා කළ හැකි නීත්‍යානුකූල හේතු අතරට ජාතික ආර්ථිකයේ අවශ්‍යතා, ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම, අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස යන ඒවා ඇතුළත් වේ.

වඩිවේලුට එදිරිව ස්ථානාධිපති සීතාම්බරපුරම් ප්‍රාදේශීය පොලිස් මුරපොල, වවුනියාව සහ වෙනත් අය (SC (F.R.) අංක 44/2002), විනිසුරු ප්‍රනාන්දු නිරීක්ෂණය කළේ මෙම සිදුවීමේදී ගමන් කිරීමේ නිදහස සම්බන්ධයෙන් පනවා ඇති සීමා විදේශ රටකට ගමන් කිරීම සඳහා වීසා ලබා ගැනීමේ ක්‍රමවේදවලට සමාන වූ අතර, අවසර ලැබෙන බවට කිසිදු සහතික කිරීමක් කර නොතිබුණි. මූලික වශයෙන්, ඒවා 14(1)(h) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ සංචරණ හා පදිංචියේ නිදහස සැලකිය යුතු අන්දමින් සීමා වී ඇත. ඔහු පවසන පරිදි පැමිණිලි කර ඇති සීමාවන් ජාතික ආරක්‍ෂාව සඳහා පනවා ඇති බවත්, ඒ සඳහා සාධාරණ හේතුවක් අවශ්‍ය වූ බවත් වගඋත්තරකරුගේ තර්කයේ බලයක් හරියාකාරව පැවති බවත් සඳහන් කළ යුතු බවයි. කෙසේ වෙතත්, 15(7) ව්‍යවස්ථාවට අනුව එවැනි සීමා පැනවිය යුත්තේ නීතියක් මඟින් හෝ මහජන ආරක්ෂාවට සම්බන්ධ නීතිය යටතේ සකස් කරන නියෝග මඟින් පමණක්ය. ඒ අනුව, සංචාරක ගමන් බලපත්‍ර ක්‍රමය 15(7) ව්‍යවස්ථාවෙන් අනුමත නොකළ සීමාවක් ලෙස සැලකේ.

කෙසේ වෙතත්, 15(7) වගන්තියට අනුව එවැනි සීමා පනවිය යුත්තේ නීතියක් මඟින් හෝ මහජන ආරක්ෂාවට සම්බන්ධ නීතිය යටතේ සකස් කරන නියෝග මඟින් පමණක්ය. ඒ අනුව, ගමන් බලපත්‍ර ක්‍රමය 15(7) වගන්තියෙන් අනුමත නොකළ සීමාවක් ලෙස සැලකේ.

වත්මන් පැමිණිල්ලට ද එම හේතුව යොදාගෙන සලකා බැලීමෙන්, 2021 මාර්තු 5 වැනි දින පැමිණිලිකරුගේ යාමේ ඊමේ නිදහස සීමා කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(6) සහ (7) වගන්ති සමඟ කියවා ඇති 14(1)(h) ව්‍යවස්ථාවට අනුකූල නොවන බව නිරීක්ෂණය වේ. , එය 'නීතිය' මගින් සීමා කිරීමක් නොවන නිසා. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද කිසිදු නීතියක් සහ හෝ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ නිසි බලධාරියෙකු ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට බලය නොතිබූ බව නිරීක්ෂණය වේ.

2021 මාර්තු 16 දිනැතිව ඇති ලිපියේ, පැමිණිලිකරු ඉරණතිව් වෙත ඇතුළුවීම වැළැක්වූ අවස්ථා පැහැදිලි කිරීමේදී වගඋත්තරකරු විසින් කිසිදු නීතිමය ප්‍රතිපාදනයන් පිළිබඳව සඳහනක් කර නොමැත. එපමණක් නොව, වගඋත්තරකරුගේ ප්‍රකාශයෙහි, එම දිවයිනට ඇතුළුවීමට කැමති මාධ්‍යවේදීන් ශ්‍රී ලංකා නාවික හමුදාවට දැනුම් දිය යුතු බවට පදනමක් ලෙස කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් සඳහන් කර නොමැත.

'සන්නිවේදන පරතරයක්' හේතුවෙන් පැමිණිලිකරුගේ ගමන් නිදහස සීමා කර ඇති බව වගඋත්තරකරු විසින් පිළිගෙන ඇති බවත්, පැමිණිලිකරු ඉරණතිව් වෙත ඇතුළුවීම සම්බන්ධයෙන් කිසිදු නීතිමය සීමාවක් ඇත්ත වශයෙන්ම අදාළ නොවන බවත් කොමිසම නිරීක්ෂණය කරයි.

ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉරණතිව් වෙත ඇතුළුවීමට සහ ඉන් පිටතට පැමිණීමේ නිදහස සීමා කිරීමට හෝ නියාමනය කිරීමට කිසිදු ආකාරයේ බලය පවරන කිසිදු නීතියක් නොමැති තත්වයක, 'සන්නිවේදන පරතරයක්' සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් නොදන්වා පැමිණිලිකරු ඉරණතිව් වෙත ඇතුළුවීම සම්බන්ධයෙන් ඉහත සඳහන් සීමාව පනවා ඇත. ඒ අනුව එය පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.

ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(h) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පැමිණිලිකරුගේ යාමේ ඊමේ නිදහසේ 2021 මාර්තු 5 වන දින උල්ලංඝනය කර ඇති බව කොමිසම දක්වා සිටියි.

පැමිණිලිකරු තම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කළ බවට වෙනම පැමිණිලි කලද, පැමිණිලිකරු තමාට නිදහසේ ගමන් කිරීමට ඇති අයිතිය සීමා කිරීම පිළිබඳ විවේචන ප්‍රකාශ කිරීමට නිදහස ඇති බැවින් මෙහි ගුණාත්මක කරුණු පිළිබඳව සැලකිල්ලට නොගැනීමට කොමිසම තීරණය කළේය. එපමණක් නොව, මෙම පැමිණිල්ලට අදාළව වන්දි සහ/හෝ වියදම් ලබා දීම සුදුසු නොවන බව කොමිසමේ අදහස වේ.

**නිර්දේශ :-**

ඉරණතිව් වෙත ඇතුළුවීමට අපේක්ෂා කරන පුරවැසියන්ගේ ගමන් නිදහසට අනාගතයේදී මෙවැනිම උල්ලංඝනයන් සිදුවීමේ හැකියාව සැලකිල්ලට ගෙන, මෙම කරුණ සමථයකට හෝ මැදිහත්වීමක් සඳහා යොමු කිරීම සුදුසු නොවන බවත්, වගඋත්තරකරු වෙත ඇතැම් නිර්දේශ ඉදිරිපත් කළ යුතු බවත් කොමිසම අදහස් කරන ලද අතර ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(3)(c) සහ (4) වගන්තිවලට අනුව, ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයාට පහත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ15(6) සහ (7) ව්‍යවස්ථා ප්‍රකාරව 'නීතියෙන්' එවැනි සීමාවන් තිබේ නම් මිස, ඉරණතිව් වෙත ඇතුළු වීම සම්බන්ධයෙන් පැමිණිලිකරුට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම

පුරවැසියෙකුට (පූර්ව අවසරය ලබා ගැනීමේ හෝ පූර්ව දැනුම් දීමේ අවශ්‍යතා ඇතුළුව) සීමාවන් පැනවීමෙන් වැලකිය යුතු බවත්,

ආ) පූර්ව අවසරයක් හෝ දැනුම් දීමක් ඇතුළුව කිසිදු සීමාවකින් තොරව ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ට ඉරණතිව් වෙත ඇතුළු වීමට අවසර දෙන ලෙස උපදෙස් දෙමින් උතුරු මැද නාවික බල ප්‍රදේශයේ ස්ථානගත කර ඇති අදාළ නිලධාරීන්ට චක්‍රලේඛයක් ආකාරයෙන් පැහැදිලි ලිඛිත උපදෙස් නිකුත් කිරීම.

ඇ) එම නිකුත් කරනු ලබන උපදෙස් මාලාවේ පිටපතක් මානව හිමිකම් කොමිසමට ලබාදීමටත්,

ඇ) මෙම නිර්දේශ ලැබීමෙන් මාසයක් ඇතුළත, (a), (b) සහ (c) නිර්දේශ ක්‍රියාවට නැංවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව මානව හිමිකම් කොමිසමට වාර්තා කිරීමටත් නිර්දේශ කර සිටියි.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් :

01. ඇමති
ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රධාන මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

02. ප්‍රාදේශීය සම්බන්ධීකාරක
මානව හිමිකම් කොමිසමේ ප්‍රාදේශීය මධ්‍යස්ථානය
යාපනය.